
හද්‍රපී මහින්ද ජයතිලක
මායා
හෝටලය

# මායා හෝටලය

**හදුජී මහින්ද ජයතිලක**

**සරසවි ප්‍රකාශකයෝ**

30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ

10/28/2017

සෙනසුරාදා

අද පාන්දර, හිරු නැගින්නට පෙර මා දුටු බියකරු සිහිනය, සැබෑවට සමීප වූ දර්ශනය කෙසේ අමතක කරන්නද?

එය මේ කතාවට අදාල තොරතුරකුත් කථාවට අදාල නාමයත් හෙළි කළේය.

මේ කථාව මා තුළ පිළිසිඳ ගත්තේ මෙයට මාස ගණනා වකට පෙරදීය. එහිදීද මගේ ගිටාරය සම්බන්ධවූ කථා බීජයක්ද මගේ මනසට රෝපණය විය.

ඒ සියල්ල ගොනු කරමින් අද මෙය ලියැවෙන්නේ

"මායා හෝටලය" නමිනි.

හදුපී මහින්ද ජයතිලක

# 1

පහන නිවී ගිය පසු සුරලි අඳුරට දෑස් හුරු කරගන්නට මෙන් බලා සිටියාය. යම්කිසි වෙහෙසකින් මුළු සිරුරම සැහැල්ලු වෙමින් අවට අලු අඳුරක් පෙනෙන්නට විය. ඒ තරු එළිය වන්නට ඇතැයි ඇය තුළ සිතුවිල්ලක් මතු විය. ඇය වැතිරී සිටි තැන අසලට එමින් තුරුළු වෙන ජනේෂ්ගේ පහස ඇයට දැනුණි.

යම් කිසි ආරක්ෂිත සුවයකින් ඇගේ දෑස් පියැවී ගියේය. "දැන් ඉතින් කිසිවක් වැරදෙන්න බෑ" කියන හැඟීමකි.

ජනේෂ් හා තමා කෙතරම් දේකට මුහුණ දුන්නාද? සුරලි සියල්ල කළේ ජනේෂ්ට අවැසි ආකාරයටයි. කඳුකරයේ හෝටලය සොයා ගත්තේ ඔහුයි.

කලින්දා, සවස මිතුරු මිතුරියන් කිහිප දෙනෙකු කැඳවා ගෙන මුහුදු බඩ හෝටලයකට ගොස් විවාහ උත්සවයක් පවත්වන්නට කටයුතු කළේත් ජනේෂ්ය.

මිතුරන්, කෑම බීම ගෙන ගී ගයා සිනාසී සතුටු වී 'යුග දිවියට' සුභ පතා වෙන්ව ගිය පසු 'සයුරු' හෝටලයේම කාමරයක නිදාගත් සුරලි සහ ජනේෂ් පසුවදා අලුයමින් අවදිව මේ කඳුකර 'මායා හෝටලය' සොයා ආවේ මධුසමය ගත කරන්නට සිතා ගෙනයි.

පිටත ලෝකය, දෙමාපිය නෑදෑයින් කිසි කෙනෙකුන් ගැන සිතන්නට ඔවුන්ට අනවශ්‍ය විය. ඔවුන්ගේ ආශිර්වාදයක් ඔවුන් පැතුවේ නැත.

හෝටලය හුදෙකලා පිරිසරයක පිහිටි බවත්, නගරයෙන් ඈත කඳු ගැටයක මුදුනේ පිහිටි බවත් ජනේෂ් සොයා ගත්තේ

අන්තර් ජාලයෙනි. කිසිවෙකුටවත් තමුන්ව සොයා ගන්නට බැරි වෙන තැනකට සුරලිත් රැගෙන යාමය ජනේෂ්ගේ අරමුණ වූයේ.

හිරු මුදුන් වන්නට පෙර මහනුවරට ළඟා වූ දෙදෙනා, සුරලිගේ දැඩි උවමනාව නිසාම සිරි දළදාව වැඳ පුදා ගන්නට මාලිගාවට ගියහ. ඒ සමීපයේම රැජිණ හෝටලයෙන් දහවල් කෑම ගෙන, මඳක් විවේක ගෙන, වැව රවුමේ මඳ දුරක් ගොස් ඔවුන් යළි ගමන පිටත් වූයේ බොහෝ රෑ වෙන්නට පෙර මායා හෝටලයට ගොඩ වැදෙන්නට සිතාගෙනයි.

එහෙත් සිතුවාට කලින් අඳුර වැටෙන්නට වූයේ කොහෙන්දෝ පාත් වූ සුදු මීදුමක් සියලු පරිසරය වසා ගත් බැවිනි.

එහෙත් ජනේෂ් රිය හැසිරවූයේ ඉතා පලපුරුදු ඇත්තෙකු ලෙසිණි. ඔහුගේ තාත්තා ලකී ජයමාන්න බදුල්ලේ තේ පැක්ටරියක කලින් වැඩ කළ බැවින් ජනේෂ්ද ළමා වියේ පටන් මේ පරිසරයට ඇවිත් තිබුණි. ඒ ගමන් බිමන් නැවතුණේ තාත්තාගේ වියෝවත් සමඟිනි. එහෙත් මේ අවට පාර තොට ජනේෂ්ගේ මතකයෙන් බැහැර වූයේ නැත.

ඔවුන් හෝටලය සොයා ගන්නා විට අඳුරත් සමඟ රෑ බෝ වී තිබුණි. හෝටලයේ දොරකඩම ආවතේව කමට මෙන් බලා සිටි ජස්ටින් සීතලටදෝ පොරවා සිටි දෑත් මුදා හරිමින් රථයේ ආලෝක දහරාව ඉදිරියේම මෙන් සිට ගනිමින්, රථයට දකුණට යන්නැයි අතින් සන් කළේය.

ජනේෂ් රිය නැවැත්වූයේ හෝටලයේ පිටුපස අංගනයේය. ඔවුන් හෝටල් ශාලාවට ඇතුළු වූයේ ද පසු පස දොරකිනි.

මේ සංක්‍රමණ මගෙහි ඉහළ දැල්වුණු විදුලි පහන් පවා පාණ්ඩු පැහැයක් විය.

සියලු දෙනාම නිදාගත්තාක් මෙන් අවට නිහැඬියාවක් විය.

ඒ නිහැඬියාව බිඳිමින් සේවකයා කථා කළේ සංක්‍රමණයෙන් පිළිගැනුම් ශාලාවට ආ පසුය. ජනේෂ් සේවකයාගේ නම දැනගත්තේද මෙතැනදීය.

"කෝ වෙන කවුරුත් නැද්ද?" ජනේෂ් අවට බලමින් ඇසුවේය.

ඉහළ සිවිලිමෙන් එල්ලුණ පළිඟු පහන් වලල්ලේ ආලෝක බිංදු ගැස්සි ගැස්සී එළිය රඳවා ගන්නට තැත් කරනු පෙනුණි.

පිළිගැනුම් කවුන්ටරය වෙතද කිසිවෙකුත් නොවීය.

"නෝනා කලින්ම ගියා" ජස්ටින් නිදහසට කාරණයක් කීවේ යටහත් පහත් ලෙසිනි. "මහත්තයත් ගියා" ජස්ටින් එක් කළේය. මහත්තයා කවුද? නෝනා කවුද? කියා දැනගන්නට ජනේෂ්ට හෝ සුරලිට අනවශ්‍ය විය.

"තව ජෝඩුවක් එන්න තියෙනවා" ජස්ටින් කීවේ මැතිරිලි ස්වරයෙනි. "මේ මීදුමේ එන එකක් නෑ වගේ. මහත්තේලට මං උණු උණුවෙ සුප් එකක් හදල තියෙනවා"

"ඒ හොඳටම ඇති" සුරලි දෙදෙනාම වෙනුවෙන් තීරණයක් ගනිමින් "නේද ජනේෂ්?" යැයි අනතුරුව ඇසුවාය.

තමා කැමති නොවී කොහොමද? මෙතැන් පටන් දෙදෙනා කටයුතු කළ යුත්තේ එක් ඒකකයක් ලෙසිණි. විවාහ බන්ධනයේ වග කීමකි එය. තවද, ඇතැම් තැනකදී සුරලි පෙරට පැමිණ කටයුතු කිරීම, ජනේෂ් ඇගේ අගය කළ ගුණාංගයක් විය.

අභිමත පරිදි යුග දිවියට ඇතුලු වෙමු යැයි මුලින්ම කීවේ සුරලිය. කොළඹ ධනවත් ව්‍යාපාරකයෙකු වූ සුසිල් මද්දුමාරච්චි සුරලිගේ තාත්තාය. සුරලි එකම දියණියයි. පිරිමි දරුවන් දෙදෙනාට පසුව උපන් ඇ දෙමාපියන්ගේ සැලකිලි ආදර ලබමින් කෙමෙන් හිතුවක්කාර බවක් පෑවාය. ඇ දඟකාරියක් යැයි අයියලා දෙදෙනාම කී කියමනට ඇ එරෙහිව කිසිවක් කීවේද නැත. නෙතඟින් බලා ඇසක් වසා, නලදතක් පෙන්වා සිනාසුණා පමණි.

"මෙයාව හුරතලේට හදලා"යැයි අම්මා බොරු අමනාපයක් මවා කීවත් ඇගේ දෑසේ වූයේ එකම දුවණිය කෙරෙහි ආඩම්බරයකි. "බඩ පිස්සී" අම්මා ආදරයට කීවාය.

සාමාන්‍ය පෙළ ඉතා හොඳින් සමත් වූ සුරලි උසස් පෙළ අමතර පන්ති වලට යන අතරේය ජනේෂ් ගේ නෙත ගැටුණේ

ආදරයත්, කැස්සත් සැඟවිය නොහැකිවා සේ දෙදෙනා දෙදෙනා වෙත ඇති වූ ආකර්ෂණය කිසිවෙකුටත් වැලැක්විය නො හැක්කක් විය. අපහසුවෙන් වුව උසස් පෙළ විභාගයට හිඳගත් සුරලි සියලු විෂයයන්ගෙන් අසමත් වූයේ දෙමාපියන්ගේ බලාපොරොත්තු ද සුන් කරමිනි. ආයෙත් විභාග ගන්නට කියා නෙත පොතට නැඹුරු කර ගත්තද, සුරලිගේ සිත රැඳුණේ ජනේෂ් වෙතම පමණි.

ජනේෂ් ද සුපර් මාකට් වෙළඳ සංකීර්ණයක සුළු රැකියාවක් කරන්නට පටන් ගත්තේය. ඉතා ඉක්මණින් ව්‍යාපාර අයිතිකරුවන්ගේ සිත දිනා ගත් ජනේෂ් කළමනාකාර තනතුරකට පත්වුනේය. සුරලි ගෙදරම රැඳෙමින්, ඉඩ ලද හැම විටම මොකක් හෝ බොරුවක් ගෙදරට කියා ජනේෂ් හා කාලය ගත කරන්නට ගියාය.

සුරලිගේ අම්මා සිතුවේ දුවණිය මිතුරන් සමඟ මිතුරියන්ගේ ගෙදර යනවා කියායි. එහි තරමක ඇත්තක් විය. එහෙත් ඉන් එක ගෙදරකදී සුරලිට ජනේෂ් හා තනිවන්නට කාමරයක් පවා ලැබිණි.

තමාට කිසි විටෙක ජනේෂ් හා විවාහ වන්නට ගෙදරින් නම් ඉඩ නොලැබෙන බව සුරලි දැන සිටියේ, දැනටමත් ඇගේ පියා, ඇය වෙනුවෙන් සුදුසු සහකරුවෙක් සොයා සිටි බැවිනි. ඒ සහකරුවා පියාගේ ව්‍යාපාරික මිතුරෙකුගේ එකම පුතායි. ඔහු ලබන වසරේ සිට වෛද්‍යවරයෙකු ලෙසින් සේවය අරඹයි.

තාත්තා මේ තරුණ වෛද්‍යවරයා ගැන බොහෝ විට කතා කළේ යම්කිසි ආඩම්බරයකින් සේම බලාපොරොත්තුවකිනි. "නෙවිල් කිව්වා අපේ ඩොක්ටර් රජිත එක්ක දවසක ඩිනර්වලට එනවා කියලා" තාත්තා අම්මාට පමණක් නොව සුරලිටත් ඇසෙන්නට එක්ක හඬ නගා කීවේය. "කොහෙද ඒ ළමයට විභාග ඉවර කළාට පස්සෙත් නිවණක් නිවාඩුවක් නෑ"

අම්මාද නිහඬව අසා සිටින්නේ ලා සිනහවකින් සිතේ සතුට හා බලාපොරොත්තුව සඟවා ගෙනය. සුරලි කුඩා දවස්වල නම් අනෙක් නෑ මිතුරන්ගේ දරුවන් හා සෙල්ලම් කරද්දී රජිත සමඟද ඉතා සුහදව සෙල්ලම් කළාය. එහෙත් ආදරය බලෙන් පොවන්නද?

සුරලි ජනේෂ් හා ආදර දූලේ පැටලෙන්නට කලින් සිටම, පත පොතට නැඹුරු වූ රජිත කෙමෙන් සුරලිගේද සිහින පැතුම් වලින් ඈතට ඈතට ගියේය. එහෙත් තමාගේ හදේ උණුවෙමින් පැසවන ආදරය ඈ කෙසේනම් දෙමාපියන්ට පවසන්නද?

රජිතත්, ඔහුගේ පියා නෙවිල් ලන්දදෙණියත් රාත්‍රී භෝජනයකට මද්දුමාරච්චි නිවෙසට එන්නට පෙර, ජනේෂ් හා පලා යන්නට සුරලි තීරණය කළේ එබැවිනි.

තමා සැබවින්ම, හදවතෙන්ම ආදරය කළ ජනේෂ් හා නිභයව ඕනෑ තැනකට යන්නට සුරලි සැදී පැහැදී සිටියාය.

කවදා හෝ ඉදිරි දිනෙක, දෙමාපියන් ඉදිරියේ දනින් වැටී වැඳ සමාව ඉල්ලා සියල්ල යළි යථා තත්වයකට පත් කරගන්නටය සුරලි සිතා සිටියේ.

ජනේෂ්ට තුරුළුව වැතිර සිටි සුරලි සුව දිගු නින්දකට සිතා දෑස් පියා ගත්තේ ඔහුගේ පහස විඳිමිනි.

එහෙත් හදිසියේම අඳුර අතරින් ගිටාරයක තත් සෙලැවෙන හඬක් ඇසුණි.

'ගිටාරයක්!?'

සුරලි සේම ජනේෂ් ද අසා සිටියේය.

ජනේෂ්ට ගිටාර වදනය හුරු පුරුදුය. එහෙත්... ජනෙෂ් මේ ගමනේ ගිටාරයක් රැගෙන ආවේ නැත.

එහෙනම්?

යළිත් ගිටාරයේ තත් සෙලවෙන හඬ ඇසෙත්ම ජනේෂ් තමා අසලම වූ කුඩා මේස ලාම්පුව දැල්වූවේය.

# 2

කුඩා විදුලි පහන දැල්වුනේ කීප වතාවක් ආලෝකය අඩු වැඩි වෙමින් ගැස්සෙමිනි.

"ලයිට් යන්න වගේ" සුරලි කීවාය.

"කොහෙන්ද ගිටාරයක්?"

"එළියෙද?"

"නෑ මේ කාමරේ ඇතුළෙම"

මොහොතකට නිවී ගිය විදුලි පහන යළිත් ගැස්සි ගැස්සී දැල්වුණි.

දෙදෙනා සැතපෙමින් සිටියේ විසල් වියන් ඇඳකයි. පැරණි තාලේ ගොඩනැගිල්ලක් වූ මායා හොටලයේ බඩු මුට්ටු සියල්ලම පෞරාණික කෞතුක වස්තු මෙන්ය සුරලිට මුලින්ම පෙනුණේ.

කුඩා පහනේ එළිය මද බැවින් ජනේෂ් නැගිට දොර වෙතට ගොස් ඒ අසල වූ ස්විච් යතුර එබුවේය. සිවිලිමේ මැදට වෙන්නට වූ අර්ධ ගෝලාකාර ලා කහ පැහැ වැස්මක මැද වූ විදුලි පහනක් ගැස්සි ගැස්සී දැල්වුණි. සුරලිට ඒ දෙස බැලූ විට සිහිපත් වූයේ කොහේ හෝ විශ්වයේ ඈතක අඩක් අඳුරේ ගිලුණු ග්‍රහ ලොවකි. කහ පැහැ ආවරණයේ පළින් පල තැඹිලි පැහැ, දුඹුරු පැහැ ඉරි දුවා තිබිණි. හරියට කිරි ගරුඬෙන් කළාක් මෙනි. යට කලිසම හැඳගත් ජනේෂ් දොර අසල සිට දකුණු පසට බලා යළි වම් පසට බලන විට එතැන වූ බුරුත අල්මාරියකට හේත්තු කර, එහි පැත්තක සැඟවෙන්නට මෙන් තබා තිබූ ගිටාරය දකිත්ම, සුරලිද එය දුටුවාය.

ගිටාරය ස්පාඤ්ඤයෙන් ගෙන ආ ආකාරයේ එකක් බව ජනේෂ් පලපුරුද්දෙන් හඳුනා ගත්තේය. එහි බඳ තද රත් පැහැයක් වූ අතර එහි කම්බි හය වානේ බවද ජනේෂ් දුටුවේය. ඒ සමගම ගිටාරයෙන් යළි හඬක් නැගුණි. මඳ මොහොතක් විමතියෙන් බැලූ ජනේෂ් එක් වනම හඬ නගා සිනාසුණේ ගිටාරය දෙසට දබර ඟිල්ලක් දිගු කරමිනි.

ඇඳෙහි පොරෝනාව මඳක් පහත් කරමින් කොට්ටයකට පිට තබමින් හිඳගත් සුරලිද, ජනේෂ් අත දිගු කළ තැනට නෙත් යොමු කළාය.

ගිටාරයේ කම්බි දෙකක් අතර පාද අඬු කීපයක් රඳවා ගෙන සිටියේ ලොකු කැරපොත්තෙකි. සුරලි කෑ ගැසුවාය. ඇගේ හඬට තාල තබන්නට මෙන් තද රතු පැහැ කැරපොත්තා තවත් වරක් ගිටාරයේ කම්බි මත නැටුමක් පාමින් ස්වර නැංවූයේය.

ජනේෂ් ඌ වෙතට සෙමින් ලංවී බැලුවේය. අනතුරුව ඇඳ පාමුල ම මෙන් වූ සිය සපත්තුවක් ගෙන ඔහු එයින් ඌට දැඩි පහරක් එල්ල කළේය. ගිටාරය හඬ නගමින් වැටෙද්දී කැරපොත්තා දඟලමින් බිම වැටී උඩු බැලිව අඬු අට එහෙ මෙහෙ කරමින් හරි අතට හැරෙන්නට දැඩි ප්‍රයත්නයක යෙදුණේය.

මාන බැලූ ජනේෂ් එක එල්ලයෙන්ම සපත්තුව මිටියක් සේ ගෙන කැරපොත්තාව තැලෙන්නට පහර කීපයක්ම හෙලුවේය.

සුරලි ඒ හැම පහරකටම අනුව ආහ් - ආහ් වැනි හඬක් නැගුවාය.

"ඒ! ඊයා. අල්ලන්න එපා! විස!"

ඈ අනතුරුව කීවේ සැලෙන හඬිනි.

වෙන කළ හැකි දෙයක් නොවුයෙන් ජනේෂ්, තම කලිසම් සාක්කුවෙන් ගත් ලේන්සුවෙන් අල්ලා ගෙන කැරපොතු සිරුර නාන කාමරයට ගෙන ගොස් කොමෝඩයට දමා ජලය මුදා හැරියේය.

"කැරපොත්තන්ට දවස් ගානක් වතුර යට ඉන්න පුළුවන් කියලා මං අහල තියෙනවා" ජනේෂ් දෑත සෝදාගෙන යළි ඇඳ අසලට එද්දී සුරලි තමා කලකට ඉහත ඇසූ දෙයක් කීවාය.

"සුරලි - ඌ වතුර යට හිටියට කමක් නෑ. ඌ මැරිලා"

"එන්න ඉතින් ඇඳට. ඔය සිවිලිමේ ලයිට් එක නිමලා" එසේ කියමින් සුරලි ජනේෂ්ට ගොඩ වෙන්නට ඉඩ සලසන්නට මෙන් ඔහුගේ පැත්තේ පොරෝනාව මඳක් පහත් කළාය.

ජනේෂ් සිවිලිමේ පහන නිවුවද ඇඳ අසල පාණ්ඩු එළි පහන් තවමත් දැල්වුණි.

ජනේෂ් එතැනට එමින් පොරෝනාව තව මඳක් පහත් කළා පමණි.

සුරලි මර ලතෝනියක් දුන්නාය.

ජනේෂ් හිස තබන්නට ගිය කොට්ටයට මඳක් පහතින් තවත් ලොකු තද රතු පැහැ කැරපොත්තෙක් නොසෙල් වී සිටියේය.

සුරලි ඇඳෙන් ඉවතට පැන්නාය.

කැරපොත්තා එක්වනම ඉගිලී සිවිලිම දිසාවට පියාඹා ගියේය.

"අනේ! ජනේෂ්! මට බෑ මට බෑ" සුරලි දෑත් ගසමින් කෑ ගැසුවාය. "කෝ ඌ?"

"පේන්න නෑ!"

"අනේ මට නං බෑ මේ කැරපොතු ගුහාවෙ ඉන්න. අනේ අපි වෙන කාමරයක් ඉල්ල ගමු. ජනේෂ්"

"ඉන්න මං බෙල් එක ගහන්න"

ඇඳ ඉහ ඉද්දරම ලණුවක් පහලට ඇද්ද විට පහත මාලයේ සීනුවක් නාදවෙන බව ජස්ටින් කීවේ කාමරයෙන් පිටව යන්නට කලිනි.

සුරලි කෙමෙන් සන්සුන් වෙද්දී, ජනේෂ් සීනු ලණුව ඇද්දේය.

"ලයිට් එක දාලා තියන්න ජනේෂ්" සුරලි කීවාය.

"ඉතිං ඇඳට එන්න. අර මිනිහා එනකල්"

"සීතලයි."

"පොරවගෙන නිදියන්න."

"ලයිට් එක නිවන්න එපා!"

"එන්නකෝ"

ජනේෂ් සිය පසින් ඇඳට නැග, සුරලිට ආරාධනාවක් කරන්නට මෙන් අතක් දිගු කළේය.

සුරලි පැමිණ පොරෝනාව යට ගුලි වී ජනේෂ්ට තුරුළු වූනාය.

"ඒ මිනිහා - ඒවිද?"

"ඒවි - නැගිටලා එන්න එපැයි."

වෙහෙසින්ම සුරලිගේ දෑස් පියැවී ගියේය. දොර දෙස බලා සිටි ජනේෂ්ගේද දෑස් පියැවුණි. අනතුරුව ඔහුට දැනුණේ සුරලි තමාගේ දෙකකුල් දිගේ අතැගිලි දුවවන්නාක් මෙනි. අනතුරුව ඔහුට ඒ කිතිය කලවයටද යටි බඩටද දැනුණි.

දුහුල් රෑ ගවුම හැඳ සිටි සුරලිටද ඇගේ දෙකලවයෙහි හා යටි බඩෙහි කිති කවන පහසක් දැනුණි.

ඉඳුරන් පුබුදු වෙද්දී සුරලි දෙස බැලූ ජනේෂ්ට පෙනුනේ ඈ නින්දේ බවයි. එහෙනම් තමාව ස්පර්ශ කරන්නේ කවුද?

සුරලි නින්දෙන් මෙන් අනෙක් ඇලයට හැරෙද්දීත් ජනේෂ්ට කිතියක පහස දැනුණි. ඔහු එක්වනම පොරෝනාව තමාගේ පැත්තෙන් ඉවත් කළේය. ඔහුගේ දෑසට හසුවූ දසුන ජුගුප්සාජනක විය.

කැරපොත්තන් රාශියක්! ඔහුගේ ඇගේ පමණක් නොව, ඇඳ මතත්, සුරලිගේ සිරුර මතත් නලියනු ඔහුට පෙනුණි.

ජනේෂ් කෑ ගසන විටම, අවදිව ගත් සුරලි තමාට පහස ලැබුණේ පෙම්බර ජනේෂ්ගේ අතැඟිලි වලින් නොවන බව දුටුවාය. එහෙනම්!

පොරෝනාව ඉවතට විසි කරමින් ඈ ඇඳෙන් ඉවතට පනිමින් පිස්සියක් සේ රෑ ඇඳුම ගසමින් හැම අතම දුවන්නට

වුනාය. ජනේෂ් තම ඇඟ මත ලැගුම් ගත් කැරපොත්තන් දැතෙන්ම ගසා දමමින්, යට කලිසමත් පාත් කරමින් සිරුරෙහි උණුසුම් තැන ලැගුම් ගත් කැරපොත්තන්ද එළවමින් සුරලි වෙතට දිව්වේය.

ඒ යන අතර ඇඳ මත පොදියට සිටින කැරපොත්තන් රාශිය ඔහුට දැක ගත හැකි විය.

"මෙතනින් යමු. මෙතනින් යමු - මෙතනින් යමු" කියමින් කෑ ගැසූ සුරලි තම දුහුල් රෑ ගවුම ඉවත් කරමින් මුදා හල කෙස් රැළි අතරේද රැඳුණ කැරපොත්තන් දෙතුන් දෙනෙකු දෑත් වලින් ගසා දැම්මාය.

ඈ නිරුවතින්ම නාන කාමරයට වැදී වතුර මල යට සිට කරාමය කැරකෙව්වද එයින් දිය දහරාවක් ගලා ආවේ නැත.

ඈ යළි පිටතට පැමිණ ගමනට හැඳගෙන ආ ගවුම හැඳ ගන්නට තැත් කළා පමණි.

දෙතුන් වරක් ගැස්සුණු විදුලි ආලෝකය ආයුබෝවන්, සුභ රාත්‍රියක් වේවා! යි මෝස්කෝඩ් රවුලෙන් කියන්නාක් මෙන් චට පටස් ගා ගැස්සී නිවී ගියේය.

"අනේ! ජනේ. මට මොකුත් පේන්නෙ නෑ"

අඳුරේ සිටගත් සුරලි දෑත් ඉදිරියට දිගු කරමින් අත පත ගාන්නට වූවාය. "කෝ ඔයා?" එහෙත් ජනේෂ් ගෙන් එකවර පිළිතුරක් නොවීය.

# 3

අඳුරු දොරකඩ මතු වූ විදුලි පන්දමක එළියෙන් ඒ අසලම සිටගෙන සිටි ජනේෂ්ගේ ඡායාව සුරලිට පෙනුණි. ජනේෂ්ට ඉදිරියෙන් දොර රාමුව මැද විදුලි පන්දම දල්වාගෙන සිටියේ ජස්ටින්ය.

"නින්ද යන්නෙ නැද්ද?" පිළිතුරක් ලැබෙන්නට කලින් ජස්ටින් "සැතපෙන්න බැරිද?" කියා කරුණාබර හඬකින් විමසුවේය.

"කොහොමද නිදා ගන්නෙ මේ කැරපොතු විමානෙ?" සුරලි නුරුස්නා හඬින් පැමිණිලි ස්වරයෙන් ඇසුවාය.

"කොහෙද?"

"හැමතැනම - ඇඳ පුරාම!" ජනේෂ් කියද්දී "කෝ බලන්න" කියූ ජස්ටින් ජනේෂ්ව පසුකරගෙන ඇඳ වෙතට විත් විදුලි පන්දමේ දහරාව ඇඳ මැදට එල්ල කළේය.

ඇඳ මත නලියන කැරපොතු පොදිය දකිත්ම සුරලි හිරිකිත පෙන්වන, හිරි ගඩු පිපෙන හඬක් නැගුවාය.

"අනේ වෙන කොහේ හරි - යං යං යං ජනේෂ්"සුරලි පින්සෙණ්ඩු වෙමින් සිය පෙම්බරාගේ අත් බාහුවක එල්ලුණාය.

"පල්ලෙහා කාමර තියෙනවද?" ජනේෂ් විමසුවේය. ඒ අසද්දී, ඔහුට පෙනුණේ සේවකයා හැඳ සිටි සණ නිල් කබායයි. එහි රන් පැහැ බොත්තම් දෙක තුනක්ද යන්තම් එළියේ පැහැදිලි විය.

අඩ අඳුරට ගිය සුරලි කඩිනමින් සිය ගවුම ඇඟ ලා ගත්තාය. ඈ බිම වැටී තිබුණ රෑ ඇඳුම නවා, ඇඳුම් බෑගයට ලන්නට බෑගය

ඇති තැනට යනු දුටු ජස්ටින්, විදුලි පන්දම ඒ අතට යොමු කොට "ඔච්චා උස්සන්න යන්න එපා. මං අරන් එන්නම්" යැයි කීවේය.

ජනේෂ්ද යට කලිසමට උඩින්, ගමනට ඇඳ ආ කලිසමත්, කමිසයත් හැඳ පාවහන් ලා ගත්තේය.

"පල්ලෙහා කාමරයක් තියෙනවද?" මෙවර සුරලි ඇසුවේ තරමක තරවටු තර්ජන ස්වරයකිනි.

"මට ඔන්න - කැරපොත්තො නම් එපා!"

"නෝනලට මං කියන්නම් හොඳ තැනක් තියෙනවා - කොහොමටත් මේ කරුවලේ ඉන්න බැහැනෙ මං මැඩම්ගෙ කොටේජ් එකට එක්කං යන්නං?"

"මැඩම්ගෙ? කොටේජ් එකේ?" ජනේෂ් ප්‍රශ්න කළේය.

"ඔව් බෑවුමේ තියෙන ගෙදර මැඩම් එමිලියා විතරයි එහෙ ඉන්නෙ - තව වැඩට දෙන්නෙක් ඉන්නවා - එළිවෙනකල් විතරයිනෙ"

"කවදා එළි වෙයිද?" සුරලි අප්‍රසාදයෙන් හා අසහනයෙන් කීවාය.

"යං යං මා පස්සෙන් එන්න. මං එක්කන් යන්නං. මේ කන්ද බහින්න විතරයි තියෙන්නෙ..."

"අපේ ඇඳුම් මේ බඩු මලු?" සුරලි විමසද්දී

"මං එව්වා ගෙනැත් දෙන්නංකෝ"යැයි ජස්ටින් නැලවිලි ස්වරයකින් කීවේය.

"තව කවුද මේ හෝටලේ ඉන්නේ?"

ජනේෂ් කුතුහලයෙන් විමසුම් කළේය.

"එන්න හිටපු අනිත් ජෝඩුව ආවෙ නෑ යමු. මං ඉස්සර වෙන්නං"

ජස්ටින් විදුලි පන්දම දල්වාගෙන ඉස්සර වෙද්දී සුරලි, ජනේෂ්ගේ අතක් තරයේ අල්ලා ගත්තාය.

"හීතලයි ජනේ" ඈ කීවේ රහසින් මෙනි.

"කාරෙකේ යමු"

එය ඇසුණාක් මෙන් මඳකට නැවතුණ ජස්ටින්,

"එතැන්ට කාරෙක ගන්න අමාරුයි - ටිකයි පයින් යන දුරයි" කියා කීවේය. යළිත් ගමන් ඇරඹූ ඔහු "කොහොමත් මීදුමේ පාර දිගේ යන්න වට රවුමක් යන්න වෙනවා. ඔහොම පහළට ගිහින් පඩිපෙළිය බැහැලා දකුණට හැරිලා යමු"

පහළට ආ ඔවුනට හෝටලයේ දොරකඩම මෙන් බිම තබා දැල්වූ ලන්තෑරුමක් දැකිය හැකිවිය.

"මේකත් අරන් යමුද?" ජනේෂ් විමසුවේය.

"එපා මහත්තයා. ඕක ඔහොම තියල යමු. මට පාර හොයා ගෙන එන්නත් එපැයි" අඳුරට විදුලි පන්දම් එළිය එල්ල කළ ජස්ටින් කීය.

"දැන් කොහේද අපි මේ යන්නෙ?" සුරලි අසිහියෙන් මෙන් ඇසුවාය.

"මැඩම් එමිලියාගෙ කොටෙජ් එකට" ඉදිරියට යන ගමන් ජස්ටින් මීදුමට පිළිතුරු දුන්නේය.

සුරලිට නම් මේ ගමන කල්පයක් තරම් දුර විය.

තෙතමනයෙන් යුතු සීත මීදුම් රාත්‍රියෙහි ගෙතුළකට වී සුව පහසු සයනක පොරෝනා යට නිදා ගන්නට සිතා සිටියත් දැන් ඔවුන් මේ වේලාව ගැන හැඟීමක් නැති හෝරාවක වයෝවෘධ මඟ පෙන්වන්නෙකුගේ පසු පසින්, ඔවුන් ජීවිතේට නොදැන සිටි මැඩම් එමිලියා නම් කෙනෙකුගේ 'කොටෙජ්' නිවහනක් වෙත පා තබමින් සිටියහ. වරින් වර නිසලතාවය බිඳිමින් බක මුහුණෙකු "හූම්" හඬ නඟනු ඇසුණි. ඒ හැම වතාවකම සුරලිට මහා බියක් හා පාලුවක් දැනුනි. එකම සැනසුමක් වුයේ නම් පෙම්බර සැමියාගේ සිරුරෙහි උණුසුමයි. ඇය හැකි තරම් ඔහුට තුරුළුව ගමන් ගත්තාය. තමා මේ ගමන ආවේ ඔහුගේ කීමට අවනතවය.

තමාගේ මුළු ජීවිතයම කැපවී ඇත්තේ ඔහුටයි. තමාගේ මුළු මහත් ආදරයම තමා පිදුවේ ඔහුටයි. ඕනෑම තැනකට තමා යා යුත්තේ ඔහු සමඟයි. ඔහුගෙන් තොර වෙන ලෝකයක් කොයින්ද?

විදුලි පන්දමේ දුබල එළියට මීදුම් අඳුර එතරම් කපා හරින්නට නො හැකි විය.

එහෙත් ඈත නිවහනක දොරකඩට ඉහළින් විදුලි බුබුලක් දැල්වෙමින් තිබුණි. ඔවුන්ගේ ඉලක්කය වූයේ එයයි.

අඳුර හා මීදුම නිසා ඔවුන්ට මේ නිවසෙහි හැඩ තල හරිහැටි දැක ගන්නට නොහැකි විය. වැසූ ඉදිරි දොර තද රත් පැහැයක් බව පෙනුණේ ඒ අසලම ඉහළින් එල්ලුණ විදුලි පහනෙනි.

ජස්ටින් පල පුරුදු කාරයෙකු මෙන් දොර හැරගෙන ගෙතුලට ගියේය.

ඇතුළත අඳුරු විය.

"කෝ කවුද?" සුරලි රහසෙන් මෙන් ඇසුවාය.

ජස්ටින්ද පිළිතුරක් දුන්නේ රහසෙනි.

"මැඩම් නිදි. දැන් රෑ වෙලානෙ. හෙට උදේ කථා කරමු. එන්න මා පස්සෙන් එන්න. කාමරේ පෙන්වන්න"

"එහෙම හරිද?" ජනේෂ්ගේ කුතුහලය තියුණු විය.

"අහන්නෙත් නැතුව?"

"නෑ මැඩම් දන්නවා. හුඟ වෙලාවට හෝටලයට එන සමහර අය මෙතනත් ඉන්නවා. අද වගේ විශේෂ දවස්වලට..."

"විශේෂ?" සුරලිගේ ඒ රහසක් මෙන් ඇසුණ පැනය ජස්ටින්ට ඇසුණේ නැත.

ඔහු විසිත්ත කාමරයක් හා කෑම කාමරයක් පසු කරගෙන ගොස් තවත් කාමර දොරක් ඉදිරියේ නතර වුනේය.

# 4

කාමරයේ දොර හැරුණේ නිහඬවය. කාමරය තුළ එකම විදුලි පහනක් සිවිලිමෙන් එල්ලෙමින් සියල්ල යන්තම් ආලෝකමත් කළේය. කාමරයේ බිත්ති සියල්ල සුදු පැහැ වූ අතර එයින් එක බිත්තියක වූ විසාල වීදුරු කවුළුවක වැඩි කොටස සුදු තිර රෙද්දකින් වැසී තිබිණි. ඇඳෙහි හිස තිබූ පැත්තෙන් වූ දොරටුව නාන කාමරයකට යන බව ජස්ටින් පෙන්වූයේ කතාබහකින් තොරව ඒ දොර හැර පෙන්වීමෙනි.

සුදු රෙදි එලා සකස් කළ සයනයේ පාමුල වූ කලු පැහැ දිගු බංකුවක් මත තද නිල් පැහැ ඩ්‍රෙසිං ගවුම් දෙකක් සීරුවට නවා පිළිවෙලට තබා තිබුණෙ සුරලි සහ ජනේෂ් අද මෙහි එන බව දැනගත්තාක් මෙනි.

ඇඳ පාමුල පැත්තේ බිත්තියෙහි කොටසක් වසා ලාච්චු මේසයකුත්, ඇඳුම් දැමිය හැකි අල්මාරියකුත් විය. ලාච්චු මේසය මත බිත්තියට හේත්තු වී ගෙන තිබුණේ රන් රාමුවක් සහිත කැඩපතකි.

විදුලි පහනේ මන්දාලෝකය නිසාදෝ කැඩපතෙහි පිළිඹිබු පැහැදිලි නොවීය. තවද මේ මැදියම් රෑ යාමය කැඩපතින් බලා හැඩ වෙන්නට වේලාවක් නොවීය.

"මට ඕනැ මැරිලා වගේ බුදියන්න"

සුරලි ඇඳ දෙස බලමින් කීවාය.

"නෝනා, මහත්තයා, මේ ඩ්‍රෙසිං ගවුම් දෙක ඇඳ ගන්න. මං ඉතිරි බෑග හෙට උදේ ගේන්නම් කො" ජස්ටින් සමුගන්නට පෙර කීවේය.

"සේරටම කලින් අර කැරපොතු වසංගතේ ඉවරයක් කරල ඉන්න එපැයි"

"කොහොමද ඒක කරන්නෙ? උන්ට විදින විස එක්ක කොහොමද කෙනෙක් ඒ හෝටලේ ඇතුලෙ ඉන්නෙ?" ජනේෂ් ප්‍රශ්න කළේය.

ජස්ටින් පිළිතුරක් දෙන්නට පෙර "සේරම උන් පුච්චලා දාන්න ඕනැ" යි සුරලි කීවාය.

"හොඳයි නෝනා. මං ඒ හරිය බලාගන්නං" කියමින් ජස්ටින් දොර වෙතට ආවේ සමුගන්නටයි.

"උදේට මෙ ගෙදර ඉන්න කෙල්ල තේ හදලා දේවි."

"කෙල්ල?" සුරලි ඇසුවාය.

"ඔව් රූපා" ජස්ටින් කීවේය.

ඒ පාර කෙල්ලෙකුත් - සුරලි සිතුවාය. නිකම් කෙල්ලෙක් නෙමෙයි - රූපා නම් කෙල්ලක්- රූප සුන්දරියක්?"

"මේ ගෙදර තවත් කවුද ඉන්නෙ?" සුරලිගේ කුතුහලය තියුණු විය.

ඇගේ කුතුහලයට හිස සලමින් ජනේෂ් කමිසයත් කලිසමත් උනා ඩ්‍රෙසිං ගවුම හැඳ ගනිද්දී ජස්ටින් කතා කළේය.

"මං කිව්වෙ මැඩම් එමීලියා ඉන්නවා. තව වැඩට රූපා ඇරුණාම ටිකිරි බංඩා ඉන්නවා - උදේට දකින්න බැරියැ. මං යන්නං" කී ජස්ටින් දොරෙන් පිටව, දොර වසමින් යන්නට ගියේය.

සුරලි ඇඳ අතට හැරෙන විටත් ජනේෂ් ඇඳෙහි ඇලවී හමාරය.

"ඔය රෙදි පෙරෙදි අස්සෙ බැලුවද? අරගොල්ලො ඉන්නවද කියලා?" සුරලි ඇසුවේ සැකයකිනි.

"බැලුවා - බැලුවා - අර ගොල්ලො නැහැ" කී ජනේෂ් තමා අසලම ඇඳට අත්ලකින් තට්ටු කරමින් "ඉතිං එන්න සුදූ නිදියන්න" යැයි කීවේය.

"ඉන්න මං ඇඳුම් මාරු කරගෙන එන්න" කී සුරලි, ඩ්‍රෙසිං ගවුමත් අතක රඳවා ගෙන නාන කාමරයට වැදුණාය.

කෙතරම් වෙහෙස වුනත් දූන්නම් ඇයට නිදා ගත නොහැකි විය.

වතුර කරාම වැඩ කරනවාදැයි තහවුරුව දැනගන්නට ඇ සින්කු බේසමට උඩින් වූ කරාමය හැර බැලුවාය. සිහිල් දිය දහරාවක් ගලා ආවේය. අතැඟිලි ඒ යට තැබූ සුරලිට දියෙහි දැඩි සීතලයක් දැනුණි. කොහොමටත් මේ 'මළ සමයං රෑ' දිය මලක් යට නාගන්නට ඇයට අනවශ්‍ය විය. ඇයට උවමනා වූයේ ජනේෂ් තුරුලේ නිදන්නට පමණයි.

ඩ්‍රෙසින් ගවුම හැඳගත් සුරලි ඉවත් කළ ඇඳුම්, යට ඇඳුම් ආදිය කාමරයට ගෙනැවුත් ලාච්චුවක දැමුවාය. කිසි ඇඳුමක් පිටත තබන්නට ඈ බිය වූයේ කොහෙන් හෝ කැරපොත්තෙක් වැනි සතෙක් ඇවිත් තම ඇඳුම් අතර ලැගුම් ගනීවි යන සැකයකිනි.

ඇය අල්මාරිය හැර බැලුවාය. එහි දැන් එල්ලෙමින් තිබුණේ ජනේෂ් හැඳ සිටි කමිසයත් කලිසමත් පමණි. ඔහු මේ වෙන විටත් වෙහෙසින්ම පොරෝනාව යට සුව නින්දක ගැලී සිටියේය. ඔහු ඇඳුම් අහවර කර හැඳගත් ඩ්‍රෙසිං ගවුමද ඇඳ පාමුල දිගාසුන මත පිළිවෙලට නවා තිබිණි. තමා හැඳ සිටි ඩ්‍රෙසිං ගවුමද ගලවා ඒ අසලින්ම තබා ජනේෂ්ට තුරුළුවන්නට සිතුණත් දැඩි සීතලය නිසා ඈ ඒ අදහස වෙනස් කරගෙන දිග ගවුම තවත් සිරුරට තද කර ගත්තාය. දැත් ලැම ඉදිරියෙන් බැඳ ගත් ඈ කවුළුවෙන් පිටත ඇත්තේ කුමක්දැයි යන කුතුහලයෙන්, විමසිල්ලෙන්, තිරපට මඳක් මෑත් කර පිටත බැලුවාය. පිටත අවට වූයේ අඳුරක්ම පමණි.

එහෙත්...?

එහෙත් ඈත කඳු ගැටය දෙසින් දිලිසෙන ගින්නක රතු එළිය පෙනුණි.

ඒ හෝටලය ඇති තැන නොවේද?

හෝටලයේ ගින්නක්?!

වෙන්න බැහැ... වෙන්න බැහැ...

ඇ මුල් වතාවේ "ජනේෂ්" යැයි කීවේ රහසින් මෙනි.

මේ නිවහනේ නිදන මැඩම් එමිලියා හෝ රූපා හෝ වෙන කිසිවෙකු අවදි කරන්නට තරම් හඬකින් කථා කරන්නට ඇ පසුබෑවාය.

"ජනේෂ්!" ඇගේ කට හඬ තව මඳක් උස්විය.

ජනේෂ් තවම දූඩි නින්දේය. ඔහු නිදන්නේ උඩුබැලි අතට මණ්ඩුක සෙයියාවෙනි.

"ජනේෂ්!"

ඔහු වෙතට ගිය සුරලි ඔහුගේ ඇඟට අත තබා සෙලෙව්වාය.

කෙතරම් දූඩි නින්දක ද යත් ඔහු නින්දෙන්ම "හ්ම්" ගා වම් ඇලයට හැරුණේය.

සුරලි යළිත් කවුළුවෙන් පිටත බැලුවාය.

හෝටලය ඇති දෙසින් නිසැකවම ගින්නක් නැගෙයි. එහි රත් ගිණි දූල් යකුන්ගේ දිව මෙන් අඳුර ලෙවකමින් ඉහළට ඇදෙයි.

ජස්ටින් දොරකඩ තබා ආ ලන්තෑරුම පෙරලී ගින්නක් හට ගත්තාද? මෙහේ ගිනි නිවන හමුදාවක් කොයින්ද?

"ජනේෂ්!" ඔහු වෙතට ගිය ඇ යළිත් ඔහුව සොලවමින් ඔහුගේ නම කියා කථා කළාය. ඔහු මෙතරම් දූඩි නින්දක ගැලුණේ කොහොමද? කොළඹ සිටම රථය එළවා ගෙන ආවේ ඔහු බව සැබෑය. වරෙක ඔහු වෙහෙසයි කියා නැවතුණේය. තවත් වරෙක නිදිමතයි කියා නැවතී, අතරමග කඩයකින් කෝපි එකක් ඉල්ලා ගෙන බිව් බව ඇයට මතක් විය. ඔහු බල බලා සිටියේ මායා හෝටලයට ඇවිත් විවේක ගන්නටයි. දූන්නම් ඔහු විවේකයටත් ඔබ්බේ දූඩි නින්දකයි.

අනතුරුව ඇයට සිහිපත් වූයේ ඔවුන් හෝටලයේ දමා ආ ඇඳුම් බෑග දෙකයි. ඒවාත් ගිනි ගන්නවාද?

එයටත් වඩා දූන් මතකයට නැගුණේ ඔවුන් පැමිණි මෝටර් රථයයි. එය නවතා ඇත්තේ හෝටලයේ පසුපසයි.

"ජනේෂ්! ජනේෂ්!" කීවත් ඔහුගෙන් ප්‍රතිචාරයක් නොමැත.

ඈ කාමර දොර වෙත ගියාය. දොරෙන් පිටත ඇත්තේ අඩ අඳුරකි. එළියක් වැටුණා නම් ඒ ඉදිරි දොර ඉහළින් වූ ආලෝකයෙන් බෙදී ඇවිත් ඉදිරි කවුළුවකින් පෙරී සාලයට ආ මඳ එළියයි.

ඒ එළිය තීරුව ඔස්සේ සුරලි ඉදිරි දොර වෙතට ආවාය.

පෙනෙන අසලක කිසිවෙකුත් නැත.

කවුදෝ කාමරයක් තුළ නින්දෙන් ගෙරෙව්වේය.

මැඩම් එමිලියාද? ඒ නැත්නම් රූපාද? ඒත් නැත්නම් අනෙක් මෙහෙකරුවාද?

ඒ ඔස්සේ නොසිතා සුරලි ඉදිරි දොර අගුලට අත තැබුවාය. දොර තදින් වසා නොතිබීම හේතුවක් විය.

දෙපයෙහි පාවහන් රහිතව වුවද ඈ දොරෙන් පිටව දොර පඩිය මත්තේ වූ පාපිස්නට නැංගාය.

දොර ඉහළින් වූ විදුලි එළියෙන් අවට ගස්වැල් යන්තමින් එළිය විය.

ඉදිරියෙන් එක් පසෙක සුදු ලී වැටක කොටසක පිපුණු රෝස මල් සහිත පඳුරු කීපයක් පෙනුණි. එයින් ඔබ්බෙහි සණ අඳුරම පමණි.

ගින්න ඇත්තේ කොයි අතදැයි ඈ විමසිල්ලෙන් බැලුවාය.

එහෙත් අඳුරේ ගින්නක් නොවීය.

තමන් දුටුවේ මායාවක්ද?

එහෙම නැත්නම් කවුළුවේ වීදුරුවලින් පරාවර්තනය වූ ගිණි එළියක්ද?

එහෙත්...

එය කන්දක දැවෙන ගින්නකි.

ගිණි ජාලාවකි.

තමාගේ දෑස තමාව රැවටුවාද? වෙහෙස වැඩි කමට පෙනෙන මනෝ විකාරයක්ද මේ ගින්න?

ඇයට ඇඟ පුරා හිරියක් දුව යනු දැනුණි.

දූඩි සීත සුළඟක් ගස්වැල් සර සර හඬ නංවා ගෙය ඉදිරියෙන්ම මෙන් ඇදී ගියේය. සුළඟට ගින්න නිවුණාද? නැහැ - නැහැ - සුළඟට නම් ගින්න තවත් ඇවිලෙන්න ඕනෑ නේද?

සුදු මීදුමක් ඉහළ සිට කෙමෙන් පහත් වෙමින් අවට වසාගෙන ගලන්නට විය.

තමා ජනේෂ්ට අවනත වී මේ ආවේ මොන මෝඩ ගමනක්ද?

මධු සමය! මායා හෝටලයේ මධු සමය! හෙට එළිවූ සැනින් ජනේෂ් සමඟ රියෙහි නැඟී වෙන කොහේ හෝ යා යතුය.

එසේ තීරණය කරමින් සුරලි ඉදිරි දොර වසා කාමරයට අවුත් ජනේෂ් අසලින්ම ඇඳෙහි වැතිරුණාය. විදුලි පහන නිවන්නට තරම්වත් ඈ තුළ පණක් ඉතිරිව තිබුණේ නැත. දිගු නින්ද ඈ වැළඳ ගති.

# 5

කාමරයෙන් පිටත කවුදෝ කතා කරන හඬ අසමින් සුරලි සෙමින් සෙමින් නිදිබර දෑස් හැරියාය. හොඳටම දවල් උනාක් මෙන් කවුළු තිර අස්සෙන් හිරු එළිය පෙරී ආවේය.

ඊයේ රාත්‍රියේ දුටු සියල්ල සිහිනයක්ම පමණක්ද? ජනේෂ් තමාගේ පිටුපසට තුරුළු වී නිදාගන්නා උණුසුම පමණි සුරලිට දැනුණේ. ජනේෂ් තවම නිදිද?

"ජනේෂ්?" කියමින් ඈ ඔහු අතට හැරුණාය.

ජනේෂ් එතැන නොවීය. ඇගේ පිටට තෙරපී තිබුණේ ලොකු කොට්ටයකි.

එහෙම නම් ජනේෂ් උදෙන්ම අවදි වී ලෑස්ති වී තමාට කරදර නොකරන්නට සිතා, තමාව අවදි නොකරම කාමරයෙන් පිටව යන්නට ඇති. අවට සුන්දර පරිසරය රස විඳින්නට යන්නට ඇති.

ඒ හා සමඟම පසුගිය රාත්‍රියේ සිදු වූ අද්භූත දේවල් සුරලිගේ මතකයට නැඟී ආවේය.

මායා හෝටලයේ කාමරය -

වියන් ඇඳේ කැරපොත්තෝ -

ගිටාරය - ජස්ටින් -

මහ රෑ ආ ගමන

මැඩම් එමිලියාගේ කොටේජ් එක

ආ ඔව්! තමා මේ ඉන්නේ මැඩම් එමලියාගේ නිවහනේ කාමරයක නොවේද?

එහෙම නම් ඊයේ රාත්‍රියේ කවුළුවෙන් බලද්දී කඳු ගැටයේ මායා හෝටලය දිසාවේ දුටු ගින්න?

ඒ ගින්න කොයි තරම් දුරට පැතිරී යන්නට ඇද්ද?

පියැවී ගිය දෑස් සුරලි යළිත් සෙමින් විවර කළාය. ඇඳ පාමුල දිගු බංකුව මත ජනේෂ් කලින් හැඳ සිටි ඩ්‍රෙසිංගවුම සීරුවට නවා තබා තිබිනි. ඒ අසලම, සුරලි ඉවත් කළ ගවුම ඕනෑවට එපාවට අලසව වැතිරෙන දිගු පිඹුරෙක් මෙන් පැත්තට වැටී ජනේෂ් හැඳි ඩ්‍රෙසිං ගවුමට සමීපව,

එයින් ඔබ්බේ ලාච්චු මේසය මත තේ කෝප්පයක් තබා තිබිණි. එයින් ඉහළ වූ කැඩපතෙහි පිළිබිඹු තහඩුව පලින් පල රිදී තැවරුවාක් මෙන් අපැහැදිලි විය. එය රසදිය සේදී ගිය පැරණි කැඩපතක් යැයි සුරලි අනුමාන කළාය.

සෙමින් ඇඳෙන් නැගිටි ඈ ඩ්‍රෙසිං ගවුම ඇඟ දවටා ගනිමින් කැඩපත වෙතට ගියාය. එහි ඇගේ මුහුණ හරිහැටි පැහැදිලි නොවීය. "සේරම කෞතුක වස්තු වගේ" ඇයට කියැවිණි. කැඩපත වටා වූ රන් රාමුවෙහි කැටයම් මෝස්තරයෙහි පලින් පල තඹ පැහැයක් මතුවී තිබුණේ කැඩපත් වීදුරු තහඩුවෙහි විසිරුණු රසදිය සිත්තමට නෑකම් කියන්නට මෙනි.

එයට පහතින් වූ තේ කෝප්පය හිස් එකකි. ජනේෂ් උදෙන්ම තේ කෝප්පය බී යන්නට ඇති.

නාන කාමරයේ කරාමයකින් වතුර වැක්කෙරෙන හඬ ඇසෙන්නට විය.

"ජනේෂ්!"

ජනේෂ් නාන කාමරයේ යැයි මඳකට සිතමින් සුරලි එහි දොර වෙතට ගියාය.

ජනේෂ් එහි නොවීය.

සින්කු බේසමට ඉහළින් වූ රිදී පැහැ කරාමයෙන් සිහින් දිය දහරාවක් ගලා හැලුණි.

යන්තමට ඒ සීත දියෙන් දෑතැඟිලි සෝදා ගත් සුරලි කරාමය තදින් වසා යළි නිදන කාමරයට ආවාය. ඉදිරි දොර සීනුව නාද වෙනු ඇසුණි. එය ගැඹුරු ස්වරයක් සහිත සංධ්‍යා හඬක් වැනි හඬකි. කාගේදෝ කට හඬක්! ගැහැණු කටහඬක්!

"රූපා!"

"ඔව් නෝනා!"

"දොර ඇරපං බං"

"ඔව් නෝනා"

සුරලි අසා සිටියාය. කවුදෝ ගෙට එන හැඩයි.

ඇ කඩිනමින් තමා ගමනට හැඳ ආ ලා පැහැ මල් මල් ගවුම ඇඟලා ගත්තාය. තමාගේ අනෙක් ඇඳුම් සියල්ලම තවම මායා හෝටලයේ නොවේද? ඊයේ රාත්‍රියේ තමාටත්, ජනේෂ්ටත් මෙතැනට මඟ පෙන්වූ ජස්ටින් ඒ ඇඳුම් බෑග මෙතැනට ගෙන එනවා කීවා නොවේද? එහෙනම් ඒවා වෙනත් කාමරයකද?

ඊයේ රාත්‍රියේ කවුළුවෙන් බැලූ විට කඳුගැටයේ දුටු ගින්න මතක් වී ඇ යළිත් කවුළු තිර මෑත් කර බැලුවාය.

කඳු ගැටය මුදුනේ යම් කිසි ගොඩනැගිල්ලක සේයාවක් පෙනුණද වෙන කිසිවක් පැහැදිලි නොවීය.

සාලයෙන් යළි කතා කරන හඬ ඇසුණි.

කාමරයෙන් පිටව ඒ අතට ආ සුරලි කෑම මේසයත් සාලයත් අඩක් වෙන් කරන, කැලි තුනක ඉස්කිරිමක් දුටුවාය. එය චීන ආරේ මල් අතු ඉති හා කුරුල්ලන් සහිත, රන් රාමුවෙන් යුතු අගනා ඉස්කිරිමකි. කැලි තුන සරණේරු වලින් යා වුනද ඒ අතර වූ ඉඩසකින් සුරලිට සාලය දෙස බැලිය හැකි විය. එසේ බලද්දී ඇයට වම් පසට වෙන්නට වූ දිගු සෝපාවේ හිඳ සිටි වයස්ගත ගැහැනියකගේ මුහුණේ අඩක් පෙනුණි.

මේ මැඩම් එමිලියා විය යුතුයි. ඇගේ මුහුණ පැහැපත්ය. නැහැය මදක් වක් වීලාය. දෙතොල් අධිෂ්ඨානයකින් මෙන් තරමේ පියැවී ඇත. ඈ අසලම රිදී හිසක් සහිත බස්තමකි.

ඈ දිලිසෙන චොකලට් දවටනයක් සිහිපත් කරන දම් පැහැ රන්වන් පැහැ මුසු ගවුමක් සැහැල්ලුවට හැඳ සිටියාය. ඇගේ දෙකනේ රිදී තෝඩු දෙකක් දිලිසුණි.

ඈ එක එල්ලේ බලා සිටියේ සෙමින් හැරෙන ඉදිරි දොර දෙසයි.

දොර හැරියේ කොළ පැහැ රෙද්දක්, හැට්ටයක් හැඳ සිටි වඩාත් තූස් ගැහැණියකි. ඈ මන්ද බුද්ධික වන්නට ඇතැයි ඇගේ ඉරියව්වෙන්ම සුරලි අනුමාන කළාය. ඒ රූපා වන්නට ඇත! දෙමාපියන් ඇයට එවන් නමක් තබන්නට ඇත්තේ මොන තරම් බලාපොරොත්තු ඇතිවද? රූපා බයාදුව දොර හැර පසෙකට වෙද්දී දොරෙන් ඇතුළු වූයේ කබායක් හා කලිසමක් හැඳගත් උත්තුංග දේහධාරී මැදිවියේ පිරිමියෙකි. ඔහුගේ ඇඳුම් කට්ටලය කතරක ඔටුවෙකුගේ සම සිහිපත් කරන වර්ණයකි.

ඔහු සිනාසෙමින් අත දිගු කරමින්

"ගුඩ් මෝනිංග් මැඩම්"කියමින් එමිලියා වෙතට ආවේය.

"වාඩිවෙන්න... මිස්ටා... මොකක්ද නම කිව්වෙ?"එමිලියා එසේ අසද්දී මිනිසා හිඳ ගත්තේ සුරලි සිටි දෙසට පිටු පෑ සුව අසුනකයි. දැන් සුරලිට පෙනුනේ ඔහුගේ හිස පිටුපස පමණයි. එහි තඹ පහැයට හැරෙන කලු කෙස් මැද යන්තම් තට්ටයක් පෑදී තිබුණි.

"මම ෂෙලී - ෂෙලී විල්සන්"

"හරි... හරි... කලින් කතා කළ වෙලාවෙ කිව්වනෙ. මට දැන් වයසයි පුතා. හුඟක් දේවල් අමතක වෙනවා"

"මං මිස්ට මද්දුමාරච්චිගේ යාළුවෙක්"

මද්දුමාරච්චි? ඒ සුරලිගේ තාත්තා!

තාත්තාගේ යාළුවෙක් ලු... තාත්තාට කොපමණ නම් යහලුවෝ ඇතිද? ව්‍යාපාර ගනුදෙණු වලදී හමුවෙන අය... නීතිඥයො... පොලිසියේ උදවිය රහස් පරීක්ෂක වරු.

ෂෙලී විල්සන්... කවුද?

"මැඩම් එමිලියා මුණ ගැහෙන්න කියලා මට කිව්වෙ ටවුන් එකේ අය. මායා හෝටලයට මැඩම් සම්බන්ධයි කියල ඒ අය කිව්වා"

"මායා හෝටලය!" කී එමිලියා බොල් හඬකින් සිනාසුණාය. "අපි ඒක කරල කොච්චර කල්ද?"

"අපි කිව්වෙ?"

"මමයි මගේ මහත්තයයි. මගේ මහත්තයා මුහන්දිරම් ඉලංග කෝන්..."

මේ කතා බහ කෙතරම් ආකර්ෂණීය වීද යත්, තමා බිත්තියකට ඇලවී කන්දෙන බවත් සුරලිට අමතක විය. ඇගේ කුතුහලය තවත් උග්‍ර වූයේ මායා හෝටලය ගැනත්, මැඩම් එමිලියා තමාගේ සම්බන්ධය ගැනත්, කියද්දීය.

"මං උපන්නේ මේ වත්තේමයි" මැඩම් එමිලියා කීවාය. "ඔය මායා හෝටලය කියන්නෙ අපේ මහ වලව්වට. මට එමිලියා කියල නම දැම්මෙ අපේ ඩැඩී. එමිලියා එයා හාට් කියල ගැහැණු පයිලට් කෙනෙක් හිටියා මතකද දන්නේ නැහැ?"

"අහල නම් තියෙනවා" ෂෙලී කීය.

"එමිලියා එයාහාට් තමයි මුලින්ම තනියෙම්ම සයුරු හරහා තරණය කරමින් ආකාසෙන් පියාඹලා ගිය මුල්ම ගැහැනු නියමුවා. ඉතින් එයා මූද උඩින් යද්දි අතුරුදහන් උනා ඒ උනාට එයාගෙ නම අමරණීය උනා. අපේ ඩැඩී මට ඒ නම දැම්මෙ ඒකයි. මගෙ මමී ඉංගලන්තෙන් ආපු පවුලක එක්කෙනෙක්. තේ වතු බලා ගන්න ආව සුද්දන්ගෙ පවුලක එක්කෙනෙක්. ඩැඩීලටත් මාතලේ පැත්තේ වතු එහෙම තිබුණා. මමීව බැන්දට පස්සෙ මෙහේ වලව්වෙ පදිංචියට ආවා. මගේ අයියා කෙනෙක් ඉඳලා මැරුණා.

මගේ මහත්තයා මුහන්දිරම් ඉලංගකෝන් මාව බැන්දට පස්සෙ අපි මෙහේ හිටියෙ දිගටම..."

"තව කවුද පවුලෙ ඉන්නෙ?"

"මං කිව්වෙ මගෙ අයියා. ඉඳල මැරුණා. අපේ දුව ඉංගලන්තෙ පදිංචියට ගියා මැරී කරලා. මට නම් බෑ මේ ලංකාව දාලා යන්න. මේ මගේ කොටේජ් එක දාලා යන්න."

"මෙතන හරිම ලස්සණයි මැඩම්"

"ඔව් ඉතින් දැන් මටත් ගාය නෑ මෙව්වා කරන්න. හස්බන්ඩ් මැරුණට පස්සෙ. ගින්නට පස්සෙ..." කී එමිලියා නවත්වාගත නොහැකිව කහින්නට වූනාය.

කොහෙන්දෝ දුව ආ රූපා "මැඩම්! මැඩම්!" කීවාය.

"මට අර ලොසිංජ් එකක් ගෙනෙන් කෙල්ලෙ" කැස්ස අතරින් එමිලියා තතනා කීවාය.

රූපා ලොසිංජර දැමූ කුඩා බඳුනක් ගෙනැවිත් එමිලියාට පාන අතරේ...

"ඉතින් අර ගින්න?" යැයි ෂෙලී විමසුවේය.

"ඔව් ගින්න" කී එමිලියා දවටනයෙන් මුදා ගත් රෝස පැහැති ලොසිංජරයක් මුව ලා ගත්තාය.

"ගිනි ගත්තේ හෝටලේ පිටුපස්සෙ කැල්ලෙ... සේරම කාර් ආවාම නවත්තන්නෙ ඒ පැත්තෙ..."

එමිලියා කතා කරන්නේ අද ඊයේ සිදු වූ ගින්නක් ගැන නොවන බව සුරලිට පසක් විය. එහෙනම් තමා පසුගිය රාත්‍රියේ දුටු ගින්න? එය අතීත මතකයකින් නැඟී ආ මායා ගින්නක්ද?

එහෙම නම් තමාට එවන් දෙයක් පෙනුනේ ඇයි? තමා අතීතය බලන්නට ගුප්ත කවුළුවකට නැඹුරු උනාද? හරියටම අර විස්මලන්තයේ ඇලිස් කැඩපතකින් බැලුවා සේ...

"ගින්නෙන් පස්සෙ අපි හෝටලේ නවත්තලා දැම්මා..."

"ඒ උනාට ඉන්ටනෙට් එකේ තවම හෝටලය ගැන සඳහන් වෙනවනෙ?" ෂෙලී විමසුවේ සියල්ල සොයාගත් අයෙකු මෙනි.

"තාම වැඩි කාලයක් නෙමෙයිනෙ?" එමිලියා නොරුස්නා ස්වරයෙන් කීවාය. "මට ඔය කොම්පියුටරේ, ඉන්ටනෙට් තේරෙන්නෙ නෑ හොටෙල් එක ගැන දාපු තොරතුරු තාමත් ඇති"

"ඒ උනාට ඒකෙ කාමරයකට රික්වෙස්ට් එකක් දාලා තියෙනවා මං මේ හොයන තැනැත්තා"

"මට තේරුණේ නැහැ"

"මේ කියන තැනැත්තා තමයි මගේ යාලුවා මිස්ට මද්දුමාරච්චිගෙ දුව සුරලිත් එක්ක පැනල ගිහින් තියෙන්නෙ"

තමාගේ නම ඇසෙද්දී සුරලි තිගැස්සුණාය. මේ මනුස්සයා තාත්තාගේ ඉල්ලීම පරිදි ඇවිත් තියෙන්නේ තමාව සොයාගෙන ගෙන යන්න! එහෙම නම් කොහෙත් හරි ඒක ගැන ආරංචි වෙලා ජනේෂ් එළිවෙනකොටම පැනලා ගියාද? තමාටත් හොරා! ඇඳටත් හොරා!

ජංගම දුරකතනය තිබුණේ ජනේෂ් ළඟයි. තමා දැඩි නින්දේ ගැලී සිටියදී ජනේෂ්ගේ මිතුරෙකු ඔහුට කතාකොට අනතුරු හැඟවීමක් කළාද? එහෙම නම්, ජනේෂ් සැඟවී සිට පසුව තමා සොයා ගෙන යළි නිසැකයෙන්ම ඒවි.

එතෙක් තමා සැඟවී සිටිය යුතුය. තමා මේ කොටේජ් එකට ආ බව එමිලියා දන්නවා ඇති නොවැ? මෙතැන්ට අමුත්තන් ආගන්තුකයින් එනවා ඇත්තේ ඇගේ අනුදැනුම ඇතිව නොවේද? තමාත් ජනේෂුත් ඊයේ රාත්‍රියේ එන බව එමිලියා නොදැන සිටියත් අද එළිවෙන විට ඈ ඒ ගැන දැනගන්නට ඇති.

එහෙත් අනතුරුව එමිලියා කී දෙයින් සුරලිගේ සිත තුළ සැකයක් පහළ විය.

"මට ඒ දෙන්නම ගැන ආරංචියක් ලැබුනොත් මං මිස්ට ෂෙලීට කියන්නම්කෝ" එමිලියා කීවේ ලොසිංජරය සූප්පු කරන ගමන්මයි.

සමහර විට තමා සිටින බව දැන දැනත් එමිලියා ෂෙලීට බොරුවක් කීවාද?

"මං විමසලා බලන්නං" එමිලියා තවත් එක් කළාය.

"මැඩම් එමිලියා සයිකික් කෙනෙක් කියලා මට ආරංචියක් ආවා. නැති උන අය සොයා දෙන්න ඇහැකි අධි විඥාණ ශක්තියක් තියෙන කෙනෙක් කියල ටවුන් එකේ අය කිව්වෙ"

එමිලියා සිනාසුණාය.

"සමහර දේවල් මට පේනවා. දැනෙනවා... පියවි ඇසට නොපෙනෙන දේවල්... සමහරු හිතන්නෙ මට දිවැස් තියෙනවා කියලා!"

"අර එතකොට බෝඩ් ලෑල්ලෙ ගහල තියෙනවා මං දැක්කා 'සයිකික්' කියල ලියලා"

"ඔව්... ඔව් අපේ මුහන්දිරම් මහත්තයා හිටෝපු ලෑල්ල! මෙහාට එන සුද්දො ටුවරිස්ට්ල එහෙම හරිම ඉන්ටරෙස්ටඩ් ඔය සයිකික් වැඩේ ගැන"

"පුළුවන් නං ඉතිං අපිටත් හොයල දෙන්නකො... නැති උන අය!" ෂෙලීගේ කටහඬේ බැගෑබර බවක් විය.

"මං උත්සාහ කරන්නම්" එමිලියා කියද්දී සුරලි කඩිමුඩියේ යළිත් තමා පෙර සිටි නිදන කාමරයට ආවාය.

තමාට ගෙන යන්නට දෙයක් නැත. එමිලියා ඈ කියන පරිදිම දිවැස් ඇති 'සයිකික්' කෙනෙක් නම් තමාවත්, ජනේෂ්වත් 'සොයාගෙන' තමාගේ තාත්තාට හෙළිදරව් කරාවිද?

එමිලියාට, තාත්තාගෙන් ලොකු තෑගි මුදලකුත් ලැබේවි.

එහෙම නම් ෂෙලී ආ කාරණය දැන් ඉතා පැහැදිලිය. තමාවත් ජනේෂ්වත් සිටින තැනකින් සොයා තාත්තාට බාර දෙන්නට... තාත්තා ඊයෙ සවසම මේ කටයුත්ත ෂෙලීට පවරන්න ඇති...

ෂෙලී ඊයේ රාත්‍රියේම තමාත්, ජනේෂුත් අඹා එන්නට ඇති. මායා හෝටලයේ තොරතුරු ෂෙලී සොයාගන්නට ඇත්තේ ජනේෂ් තොරතුරු සෙවූ අන්තර්ජාලයෙන්මයි. ජනේෂ් මායා හෝටලය

ගැන සෙවූ තොරතුරු ෂෙලීත් සොයා ගන්නට ඇති. එක්කෝ, ජනේෂ්ගේම යාලුවෙකුගෙන්...

ජනේෂ්ටත් ෂෙලී එන බව ඔත්තුව දෙන්නට ඇත්තේ ඒ යහලුවාම විය නොහැකිද? දූන් තමාට පණිවිඩයක් දෙන්නේ කවුද?

අද රෑ වෙන්නට පෙර ජනේෂ් පෙරලා එතැයි සුරලි බලාපොරොත්තු වුනාය. තමා හදවතින්ම ආදරය කළ පෙම්බරා තමාව අතරමං කර දමා යන්නේ නෑ නොවේද? අනෙක මේ සුන්දර මධු සමයේ!

ඒ හා සමඟම සුරලිගේ සිතේ බියක් මතුවිය. තාත්තාගේ තැරැව් කාරයින් පැමිණ ජනේෂ්ව පැහැරගෙන ගියාද? ඔහුට ඊටත් වඩා අනතුරක් වීද?

# 6

විදුරු කවුලුව අඩක් විවර කළ සුරලි එයින් පිටතට පැන්නාය. ඇගේ දෙපයේ වූයේ ගමනට පැළඳ ආ සැහැල්ලු ස්ලිප් ඕන් පාවහන් යුගලකි. ඇඳුමද ගමනට ඇඳ ආ ඇඳුමයි. ඈ විසිරුණු කෙස් කැරලි එකතු කොට කුඩා ගැටයකට බැඳ ගත්තාය. මේ බල බලා ඉන්නට වේලාවක් නොවීය.

ෂෙලී කොළඹට පණිවිඩ දෙන්නට පෙර තමා මෙතැනින් යා යුතුය. එහෙත් කොහේ යන්නද? හෝටලය පිටුපස නැවතූ තැන ජනේෂ්ගේ රථය ඇත්නම් නොඅනුමානව ඔහු එතැනට එනු ඇත. රථය ඇත්නම්... රථය නැත්නම්? රථය නැත්නම් ඔහු එළවා ගිය තැනකින් තමා සොයා පෙරලා එනු ඇති. ජනේෂ්ගේ දුරකතනයට කතා කරන්නට විදියක් ඇත්නම්...

මැඩම් එමිලියාගේ කොටේජ් මිදුලේ සරුවට වැඩුණු තණ කොළ මත්තේ සුරලි ඉදිරි වැට ළඟට ආවාය. එතැන හැඩ කළ රෝස මල් වලට එහා පැත්තේ ෂෙලී පැමිණි රථය නවතා තිබිණි. අළුත් පත්නයේ ලා නිල් පැහැ ටොයෝටා රථයක්.

වත්ත කෙළවර ලී වැට අවසන් වෙන තැන යෝධ පයින් ගසකින් එහා වූයේ බාගෙට ඇද වුනු කම්බි වැටකි. කම්බි ඇත් මෑත් කර සුරලි පිටතට පැන ගත්තාය. කොටේජ් එක දෙස බැලූ ඇයට "PSYCHIC"කියා ලොකු රතු අකුරෙන් ලියූ බෝඩ් ලෑල්ලක් දොර ඉදිරියෙන් පැත්තක සිටුවා ඇති සැටි පෙනුණි. පෙරදා රාත්‍රියේ අඳුරු මීදුමේ මේ කිසිවක් පැහැදිලිව පෙනුණේ නැත. "PSYCHIC" කියූ වදනට යටින් MADAM EMILIA කියා වඩාත්

කුඩා අකුරෙන් නිල් පැහැයෙන් ලියා තිබිණි. ඒ අසලම අත්ලක සලකුණක් රතුවෙන් සටහන් විය.

එහෙනම් ෂෙලී පැමිණ ඇත්තේ මැඩම් එමිලියාගෙන් ජේන අහන්නටත් එක්ක. තමා ඉන්න තැනක් එමිලියාට දිවැසින් පෙනෙනවා ඇද්ද?

සුරලි තනිවම සිනාසුණාය.

මිනිසුන්ට දුර පෙනුණාට ඇස් පනා පිට තියෙන දේ ජේනෙන්නෙ නෑ නොවැ! තමා මේ ගෙදර රාත්‍රිය ගත කළාද කියාවත් මැඩම් එමිලියා නම් වූ සයිකික් දන්නවාද?

පයින් ගස ළඟ බලා සිටි සුරලි ෂෙලී ඉදිරි දොරෙන් පිටතට එනු පෙනෙත්ම ගස පිටුපස සැඟවුණාය. ෂෙලී තිකමටවත් ඒ දිසාව බැලුවේ නැත.

ෂෙලීගේ පසු පසින් වඩාත් සෙමින් ඇවිද ආවේ බස්තමට වාරු දුන් මැඩම් එමිලියාය. ඇ මොන මොනවාදෝ ඉංග්‍රීසියෙන් දෙඩුවත් ඒ කිසිවක් පැහැදිලි නොවීය.

"අයි කැන් ෆයින්ඩ් අවුට් වෙයාර් දේ ආර්"රථයට ළංවෙන විට ෂෙලීටත් ඇසෙන්නට එමිලියා කීවාය.

ෂෙලී ඇයට නගින්නට පිටුපස දොර හැර දී ඇ ගොඩවුවාට පසු ඉතා පරිස්සමට ඒ දොර වසා තෙමේද ඉදිරි රියැදුරු අසුනට ගොඩ වුණේය.

ෂෙලී නම් රහස් පරීක්ෂකවරයා කෙතරම් දක්ෂයෙකු වූවත්, තමාගේ නැහැය යටම මෙන් එළිමහතේම සැඟවී සිටි තමාව දුටුවේ නෑ නේදැයි සුරලිගේ සිතේ සිහින් සතුටක් මතු විය.

දෙදෙනා රැගත් රථය සුරලි බලා සිටි පයින් ගස දිසාවට එත්ම ඇ ගස් කඳට මුවා වුනාය. ඇ සිටි වගක්වත් ඔවුන් දුටුවේ නැති!

රථය තවදුරටත් එසේ ගමන්කොට වමට වක් වෙමින් කඳු පාර නගිමින් මායා හෝටලය ඇති දිසාවට ගමන් ගත්තේය. ඊයේ රාත්‍රි අඳුරු මීදුමේ නොදුටු පරිසරයේ පිහිටීම සුරලිට පැහැදිලිව පසක් වූයේ දැන්ය.

රථය ගමන් ගත් පාරත් මේ ගෙවත්තත් අතර වූයේ ගල් වලක් වැනි කොටසකි. එහි යෝධ ගල් ගෙඩි මෙන්ම ගස් වැල් ද වැඩී තිබිණි. එයට ඉහළින් වූ පාරට එහා ඉහළට නැගුණේ වඩාත් උස කඳු පේලියකි. එහිද පළින් පල ගල් කුළු හා කේතුධර හා වෙනත් ගස් වර්ග පඳුරු වර්ග විය. ඒ පාර ගමන් ගත්තේ මායා හෝටලය දිසාවටයි.

ඊයේ රාත්‍රියේ නම් මේ මාර්ගය කිසිවක් මීදුම අතරින් සුරලිට පැහැදිලි නොවීය.

ජස්ටින්ගේ මඟ පෙන්වීම අනුව ඔවුන් පසුව රාත්‍රියේ විදුලි පහන් ආලෝකයෙන් මඟ සොයා එමිලියාගේ කොටෙජ් එකට ආවේ ඒ වක් මඟ නොයා එක එල්ලේ හෝටලයේ සිට පල්ලමක් බසිමිනි. දැන් වුවද ඒ වඩාත් කෙටි මඟෙන් සුරලිට හෝටලයට යා ගත හැකි විය.

එහෙත් බැරි වෙලාවත්, මැඩම් එමිලියාත් මෙලීත් ඒ හෝටලයට ගියා නම්...

එය එසේ නොවීය. සුරලි බලා සිටියදීම රථය හෝටලය පසු කරගෙන මාර්ගය දිගේ දිගටම ගමන් කරමින් ගස් අතු අතරේ වංගුවක නොපෙනී ගියේය.

සැහැල්ලු සුසුමක් හෙලා සුරලි අවට බැලුවාය.

මෙය ඇත්තෙන්ම පාලු ලෝකයක් විය.

ජනේෂ් කොහේද?

සැඟවී සිටින තැනකින් ජනේෂ් තමා සොයා ඒවිද?

තමා ලොව තනිවූ විලාසයකි සුරලිට හැඟුණේ.

ආදරය කරන තැනැත්තා තමා අසල නැත්නම් ලෝකය කොයි තරම් පාලු තැනක්ද?

"ජනේෂ්" ඈ තරමක් හඬින් කීවාය.

තමා නඟන හඬ ඇසෙන්නට තරම් මානයේ කවුරුත් නැ නොවේද?

ඈ තවත් වැරෙන් හඬ නගා "ජනේෂ්!" යැයි කීවාය.

ඇගේ දෑස් වලට කඳුළු පිරී ආවේ හදවත තෙරපමිනි.

"ජනේෂ්!" ඈ මහ හඬින් කෑගැසූ හඬ එහා කන්දේ දෝංකාර දී ආපසු ආවේය.

තමාගේම හඬින් සුරලි බියපත් වුනාය.

"ජනේෂ්" ඈ යළිත් සිහින් හඬින් ඉකි බිඳිමින් කීවේ ඒ බියෙනි.

ඈ සිටගත් තැනම සිට වලාකුලු ගොනුවෙන අහස දෙස බැලුවාය. දූන් මධ්‍යහ්නය පසු වීලාය.

කාලය ගමන් ගන්නා ඉක්මණ!

කොටෙජ් ගේට්ටුවෙන් පිටතට ආවේ කොළ පැහැ රෙද්ද හැට්ටය හැඳගත් රූපාය. ඇගේ අතේ කුඩා පාර්සලයක් විය. පත්තර කඩදාසියක එතූ පාර්සලයක්. ඈ අඩිය කඩිනම් කරමින් ගියේ මායා හෝටලය අතටයි. මේ පෙරදා රැයේ සුරලි හා ජනේෂ් ගමන් ගත් වඩාත් කෙටි මාර්ගයයි.

රූපාට යන්නට මඳක් ඉඩ හැර සුරලි ඈ පසුපසින් ඇවිද යන්නට වුනාය. මේ අවට මිනිස් පුළුවටකට සිටියේ රූපා පමණි.

හදිසියේම රූපා ආපසු හැරී නොබලාම "මට පේනවා"යි කීවාය.

"කාවද? මාවද?" සුරලි ඇසුවාය.

"ඔව් නැතුව! මට ඇහෙනවා! මට පේනවා!" රූපා ඇගේ ගමන නැවැත්වූයේ නැත.

"කොහෙද රූපා යන්නෙ?"

"මායා හෝටලේට. වෙන කොහේද?"

රූපාගේ ස්වරය නාසිකය. ගමන හැඩකාරය. දූතේම වීදුරු වලලු කීපයක් සෙලැවෙන්නේ මේ හැඩකාර ගමනටයි.

"මොකටද යන්නෙ?"

"මං හැමදාම යන්නෙ මායා හෝටලේට ටිකක් අස්සස් කරල එනවා"

"මොනවද ඔය උස්සන් යන්නෙ?"

"මගේ බත් එක"

"හා! සුවඳයි!" සුවඳක් නොදැනුනත් සුරලි වඩාත් ළංවෙමින් කීවාය "මටත් දෙනවද"

"දෙන්නං - බාගයක්"

"මං තාම කෑවෙත් නැහැ"

"තේ බිව්වෙත් නැහැනේ?"

"නැහැ!"

දෙදෙනා ගල් කුළු අතරින් බෑවුම උඩට නගින්නට වූහ.

"මේ රූපා මගේ ජනේෂ්ව දැක්කද?"

"කවුද?"

"ජනේෂ්?"

"මං දැක්කෙ නෑ"

"අද උදේ..."

"නෑ"

"අපි ඊයෙ රෑ කාරෙක නැවැත්තුවෙ මේ හෝටලයේ පිටුපස්සෙ."

"ඉතිං ගිහිං බලන්න තියෙනවද කියලා!" කී රූපා "චීස්" ගා සිනාසුණාය.

වඩාත් ළං වෙද්දී සුරලිට මේ ගොඩනැගිල්ලේ අබලන් බව පෙනෙන්නට විය.

ඉදිරි දොර අසලම පෙරදා රාත්‍රියේ තිබූ ලන්තෑරුම තිබුණි. එහෙත් එය නිවී ගොසිණි!

"මෙතන බලන්න දෙයක් නෑ. සේරම ජරාවට ගිහින්" රූපා දොරකඩට වුත් කීවාය.

"අපි ඊයෙ රාත්තිරියෙ ආවේ පිටුපසස්ස දොරෙන් ඒ තරම් නරකට පෙනුනෙ නැහැ"

"නරකට පෙනුනෙ නැහැ?" රූපා විමතියෙන් ඇසුවේ ආපසු හැරෙමිනි. "කරුවලේ කොහොමත් මොනවත් නරකට පේන්නෙ නැහැ."

"ලයිට් තිබුණා. අපි එනකොට ලයිට් තිබුණා. ඒත් ඩිම් ගහලා තිබුණෙ"

"ඩිම් ගහලා?" රූපාට නොතේරුණ හැඩයි.

"ඔව් ඔව් ලයිට් එච්චර එළිය තිබුණේ නැහැ. සැරින් සැරේ ලයිට් නැති උනා අන්තිමට අපි එතනින් ආවෙ කරුවලේ..."

"ගින්නට පස්සෙ ලයිට් හරියට වැඩ කරන්නෙ නෑ..."

"ඊයෙ රෑ... ගින්න"

රූපාට සුරලි කී ඒ කිසිවක් හරි හැටි වැටහුණේ නැත. ඊයේ රෑ ගින්නක් ගැන රූපා දැන සිටියේ නැති හැඩයි.

"ඔයා ඊයෙද ආවෙ?" රූපා හොටලේ පිට බිත්තිය අසල නතරවෙමින් ඇසුවාය.

බිත්තිය සමර පැහැයක් වුවද පලින් පල පුස් අල්ලා තිබිණි.

"අපි ආවෙ ඊයෙ රෑ"

"මං නිදි වෙන්නැති"

"වෙන්නැති"

බිත්තිය එක අතකින් අල්ලමින් අනෙක් අතෙහි බත් පැකට් එක තුරුලු කරගෙන රූපා වියලි සිමෙන්ති කාණුවක් අද්දරින් හෝටලයේ පිටුපසට ගියාය.

එතැන රථයක් නම් නොවීය.

බලාපොරොත්තු සිඳී සුරලි සිටි තැනම නතර වුනාය.

එහෙම නම් ජනේෂ් රථය රැගෙන එළිවෙන යාමයේම යන්නට ඇති. සමහරවිට පසුව අවට සියල්ල අනතුරු රහිත යැයි දැනගත්විට ඔහු පෙරලා ඒවි. තමාවත් රැගෙන යන්නට තම සිහින කුමාරයා මායා හෝටලයටම ඒවි. එහෙමත් නැත්නම් තාත්තාගේ අත් උදව් කාරයෙක් පැමිණ ජනේෂ්ව රැගෙන ගියාද? එහෙනම් කාරෙක? ඒ අය කාරෙකත් රැගෙන ගියාද?

නෑ... නෑ...ජනේෂ් රථයත් රැගෙනම කොහේ හෝ යන්නට ඇති. සුරලි සිත සනසා ගන්නට තැත් කළාය.

# 7

සුරලිගේ දෙපා ඉබේම මෙන් ඇද්දී ගියේ පෙරදා රැයේ හෝටලය තුළට ඇවිද ගිය ගමන් මඟ සොයා ගෙනයි.

එහි සේවකයා අනුව තමාත් ජනේෂුත් ඇවිද ගිය සංක්‍රමණ මඟ දූන් යන්තම් එළිය වී තිබුණේ පිටින් කාන්දු වූ හිරු එළියෙනි. රාත්‍රියේ දී විදුලි ආලෝකයෙන් මෙය කොතරම් ජීවමාන වීද?

සංක්‍රමණ මඟ කෙළවර වූ ශාලාවේ පිළිගැනුම් කවුන්ටරය වෙත කිසිවෙකුත් නොවීය. ඒ පිටුපස බිත්තියට පිට දී ගත්, ලිපි, සටහන් පත් රඳවිය හැකි කබ් හිල් දෙක තුනක මකුළු දැල් අස්සේ තවමත් ඉතිරිවී අමතක වී ගිය කඩදාසි කොළ කීපයක් පෙනෙන්නට තිබිණි. දුර්වර්ණ වූ බිත්ති පලින් පල කළු පුස් පැල්ලම් විය. තමා කලින් දා රාත්‍රියේ සුන්දර සේ දුටුවේ මේ පරිසරයමද?

තමාගේ දෑස් මායාවකට හසුව රැවටුණ හැටි!

මෙයට මායා හෝටලය යැයි නම් තැබුවේ ඒ නිසාද?

පිළිගැනුම් ශාලාවේ පසෙකින් උඩු මහලට යන පුළුල් හිණිපෙළ අඩ අඳුරක ගිලී තිබිනි. එතැනින් ඉහළට යන්නට සුරලිගේ කිසිදු කැමැත්තක් නොවීය. සයනය පුරා දැගලූ කැරපොතු පොදිය සිහිවී ඇගේ ගත පුරාම හිරියක් දුව ගියේය.

ශාලාවේ කලකින් ඇමදුම් නොලද බිම කොටසක පැරණි බුමුතුරුණක් වූ අතර එයින් ඔබ්බේ ලොකු අත් පුටු දෙකකුත් තද දුඹුරු පැහැ අඩි හයක් තරම දිග අඩි තුනක් තරම පළල වඩාත් උස නැති 'කෝපි' මේසයක් විය.

සුරලිගේ දෙපා ඒ දෙසට නොසිතාම ඇදී ගියේය. මේසයට ළංවූ එක් පුටුවක ඈ හිඳ ගත්තාය.

සිවිලිමෙන් එල්ලුණ පහන් වලල්ල ඇගේ නෙත ගැටුණේ මෙවිටයි. පෙරදා රාත්‍රියේ විදුලි බුබුලෙන් ආලෝකමත් වූ එය අද බිඳුණු වීදුරු පන්දම් කීපයක් ලෙස මකුළු දැලෙන් හැඩවී ආලෝක රහිතව එල්ලුණි.

"මං හැමදාම දවල්ට කන්නෙ මෙතැන වාඩිවෙලා" කියමින් තූස් මේසය වෙතට ආ රූපා එතැන බිම වාඩිවෙමින් සිය බත්පත මේසය මත තැබුවාය.

සුරලි හිස් බැල්මකින් බලා සිටියාය.

තමා මේ මුහුණ දී ඇත්තේ කිනම් විපත්තියකටද? තමාට සදා ආදරෙයි කියූ ජනේෂ් කොහේද? ඊයේ උදෑසන තමා හා සිනාවෙමින්, කතා කරමින් ආදරයෙන් හා බලාපොරොත්තුවෙන් මායා හෝටලය සොයා ආ තම පෙම්බර සැමියා ජනේෂ් කොහේද?

රූපා කෙසෙල් කොළයේ එතූ බත්පත දිග හැරියාය. සුදු බතට වටින් පිටින් ගොඩ වූ කහ පැහැයක් මුසු වී තිබිනි. කහපාට අල කෑලි වගයක්, පොල් සම්බෝලයක් තැඹිලි පාටට, පොල් දැමූ කොළ මැල්ලුමක්, තද දුඹුරු පැහැති තෙල් දැමූ ව්‍යංජනයක්... වම්බටු වි යුතුයි.

බත් ඇනූ රූපාගේ අතේ වූ වීදුරු වළලු සිලි සිලි හඬක් නැගුවේය.

ඈ ලොකු බත් කටක් මුවට ලා ගත්තාය.

"මාත් එක්ක කන්න!" ඈ කීවාය.

"මට පේනවා බඩගින්නෙත් වගේ නේද වාඩිවෙලා ඉන්නෙ?"

සුරලි කතා කළේ නැත.

මොනවා කියන්නද?

"මං බත් ඩිංගක් ඉතුරු කරල මෙතනම තියන්නං ඕන නං කන්න ඔන්න" රූපා කීවාය.

"මං කවදාවත් සේරම කන්නෙ නෑ"

ඒ කී පරිදිම රූපා බත් පතෙන් අඩක් පමණ ගිල දමා ඉතුරු ටික විවර කළ ආකාරයටම තබා පිටතට ඇවිද ගියේ "අත සෝදන්නට" කියමිනි.

පිටත කරාමයක් තිබෙන්නට ඇත.

සුරලී ගල් ගැසී බලා සිටියාය. සිතුවිලි සියල්ල මඳකට නැවතුණාක් මෙනි. මුළු සිරුර පුරාම දුවගිය වේදනාවක් හදිසියේම හදවත මැද නතරවුනාක් වැන්න.

"ජනේෂ්..." ඇගේ දෙතොල් මිමුණුවේය. "මොනවද මේ අපිට උනේ?" ඈ මඳකට දූස් පියා ගත්තාය.

ඒ අඳුරේ සහනයක් විය.

කෙතරම් වේලාවක් එසේ සිටියාදැයි හැඟීමක් ඇයට නොවීය. සුරලි දූස් හැරියේ යමෙක් ලීයකට තට්ටු කරන හඬක් අසමිනි. කවුරුන් හෝ දොරකට තට්ටු කරන්නාක් මෙනි.

සුරලිගේ විවර දෙනෙත් ඉදිරියේ මේසය මත සිටියේ කපුටන් දෙදෙනෙකි. උන් දෙදෙනාම කෙසෙල් කොළයේ බත් ටිකට හොටෙන් අනිමින් ගිල දමමින් සිටියහ.

සුරලි භීතියකින් සේම යම්කිසි විමතියකින් දැස් හයා බලා සිටියේ ගල් ගැසී ගෙනය. තමා යන්තම් හෝ හඬක් නගා සෙලවුනා නම් උන් කැළඹී තමා වෙතටම පියඹා එන්නට ඉඩ තිබුණි. උන්ගේ නිය සහ හොට කෙතරම් කියුණුදැයි ඇයට සමීපවම දූක ගත හැකිවිය.

උන් කොහෙන් පියඹා ආවාද?

කොතරම් කුස ගින්නෙන්ද යත් උන් එක බත්වුලු ඇටයක් ඉතිරි නොකර ගිල දැමූහ. කෙසෙල් කොළයත් එහාට මෙහාට ඇද දමා වෙනත් ගිලින්නට දෙයක් නැති බව තහවුරුව දූන ගෙන උන් දෙදෙනා සුරලිට ඉහළින් පසුපස දොර අතට පියාඹා ගියහ.

පිටත ඉදිරියේ කවුදෝ ඉදලකින් අතුගාන හඬ ඇසුනි. රූපා විය යුතුයි. එයට පිළිතුරු ලෙසින්දෝ කාක්කෝද "කෑස් කෑස්" හඬක් නගමින් ඈතට යනු ඇසුණි.

තමා මෙතැනින් නැගිට යාමෙන් පලක් තියෙනවාද? ජනේෂ් නැති ලෝකයේ තමා ජීවත්වීම වැඩක් ඇති දෙයක්ද? තමාගේ බලාපොරොත්තු, සිහින, පැතුම්, ආදරය සියල්ල පොදි බැඳගෙන ජනේෂ් කොහේදෝ ගිහින් හැඩයි. තමා දෑස් හැර අවදියෙන් සිටීමේ පලක් තියෙනවාද?

"ආ ඔක්කොම කාලා තියෙන්නෙ!" ශාලාවට එමින් රූපා කීවාය.

සියල්ල ගිල දැමුවේ තමා නොව කපුටන් දෙදෙනෙකැයි කියන්නට තරම්වත් උන්දුවක් සුරලි වෙත නොවීය. රූපා ඕනෑ දෙයක් හිතා ගත්තා දෙන්! කොහොමටත් සුරලිට දූන් කුස ගින්නක් හෝ පිපාසයක් දැනුනේම නැත.

"මැඩම් එනකොට රෑ වෙයි කිව්වා. පණිවිඩේ දීලා ගියේ අපේ ටිකෝ. ටිකෝ කියන්නෙ ටිකිරි බංඩට... මැඩම් කියන්නෙ ටිකෝ කියලා. "ටිකෝ... ටිකෝ!" කියල කෑ ගහන්නෙ හතර වටේටම ඇහෙන්ඩ. වටේටම ඇහෙන්ඩ ඉන්නෙ මං විතරයි. ටිකෝ තමයි කාරෙකෙන් ගිහින් ගෙදරට අවස්සිය කළමනා ගේන්නෙ" රූපා කියවාගෙන ගියේ කෙසෙල් කොළයත් දවටන කඩදාසියත් ගුලියක් කරමින් බිත්ති කෙළවරක වූ ලොකු පීප්පයකට දමමිනි. එය කුණු දමන බක්කිය වන්නට ඇතැයි සුරලි අනුමාන කළාය.

රූපා ඇවිත් අනෙක් අත් පුටුවෙහි හිඳ ලොකු හුස්මක් හෙලුවාය.

"අද හවසට වහින්න පුළුවන් කියල ටිකෝ කිව්වෙ. ඕං දැනටම කලු වලා රොත්තක් ගොනුවෙනවා නැගෙනහිරට. දූන්ම ගියානං හොඳයි කොටෙජ් එකට. මෙතන හැම තැනම වතුර කාන්දු වෙනවා"

රූපා කතා කළේ තමාටම මෙනි. ඈ ඇගේම ලෝකයක තනි උනාක් වැන්න.

ඈ එක් වනම අත් පා සොලවමින් ශාලාව මැද නැටුමක් පෑවාය. ඇගේ දෑතේ වලලු සෙලැවෙද්දී ඈය තාලයට මෙන්,

"දොර ඇරපං අමල් බිසෝ

දොර ඇරපං අමල් බිසෝ" යි කීවාය.

වෙන වෙලාවක නම් මෙවැනි රංගනයකට සුරලි සිනාසී අත්පුඩි ගසයි. එහෙත් අද එවැනි සතුටක් නොවීය.

තව මඳක් නටමින් රූපා තවත් පදයක් දෙකක් තාලයට කීවාය.

"අම්මත් ආවා - අප්පත් ආවා

මුතුත් ගෙනාවා -

මුතු අමුණන වැලුත් ගෙනාවා

දොර ඇරපන් අමල් බිසෝ

දොර ඇරපන් අමල් බිසෝ"

මෙසේ කියමින් ඉදිරි දොර හැරගෙන රූපා ඉදිරි අංගනයට පිවිසියාය. සුරලිද ඈ අනුව එහි ගියාය.

අහස කෙමෙන් අළු පැහැයකට හැරෙමින් තිබිණි. මද්දහන පසු කළ හිරු රන් කිරණ පැතිරුවේ ගොනුවෙන වැහි වලා කුළු අතරිනි.

"අනේ ජනේෂ් කොහේ ඇද්ද?"යි සුරලි සිතුවාය.

රූපා ඉදිරි මිදුලෙන් එහා බැවුමට බසිමින් "දොර ඇරපන් අමල් බිසෝ" යැයි කීවාය.

සුරලි සිටි තැනම බලා සිටියාය.

රූපා අනුව යන්නට ඇයට සිත් දුන්නේ නැත. රූපා උමතුවට සමීප වූ මන්ද බුද්ධික ගැහැණියකි. ඇගෙන් බලාපොරොත්තු විය හැක්කේ කුමක්ද? ඈ සුරලිට කතා කරනවාට වඩා කතා කරගත්තේ තමාටමය. ඈ ගී ගයා නැටුවේ තමාගේම ආත්ම තෘප්තියක් සඳහාය. ඇයද මේ පරිසරයේ අතරමංවූ ගැහැනියකි.

"සුරලි!"

කවුදෝ තමාගේ නම හඬ ගානු ඇසී සුරලි ආපසු හැරී බැලුවාය.

"ජනේෂ්?!"

# 8

"ජනේෂ්?!"

මායා හෝටලයේ ඉදිරි දොර පලුවකට මුවාවී ජනේෂ් සිටගෙන සිටියේ යන්තම් සිනාවෙමිනි.

"සුරලි!"

"ඔයා කොහෙද මෙහෙ?" සුරලි ඔහු වෙතට දුවමින් විමතියෙන් විමසුවාය. "අනේ මගේ වස්තුව! ඔයා කොහෙන්ද ආවෙ?"

"මං කොහෙවත් ගියේ නෑ. මං හැංගිලා හිටියා අර ගෑනි යනකල්"

"කොහෙද හැංගිල හිටියෙ?"

ජනේෂ් උඩු අතට ඇඟිල්ලක් දිගු කළේය.

"කෝ වෙන කවුද මේකෙ ඉන්නෙ?"

"කවුරුත් නැහැ"

ජනේෂ් වාරුවී සිටියේ හැකිලූ ලොකු කලු කුඩයක මිටටයි.

"මට මේං මේ කුඩේ හම්බ උනා උඩ කාමරේ තිබිලා." ඔහු කුඩය සුරලිට පෙන්වමින් කීවේය.

"කුඩයක්? මොකටද?"

"අව්වට වැස්සට හෙවනට!" ජනේෂ් සිනාසුනේය.

"තව ටික වෙලාවකින් වහින්න පුළුවන්"

"ඉතිං?"

"අපි ඇවිද ගෙන යමු"

"කොහාටද?"

"යමුකො කියන්න"

"කෝ ජනේෂ් කාරෙක?"

"කාරෙක තියෙන තැන තමයි මාත් මේ හොයන්නෙ"

"ඇයි කවුරුවත්... අරන් ගියාද?"

"නෑ නෑ කවුරුවත් අරන් ගිහින් නැහැ. ඒත් තියෙන තැන හරියටම මෙහෙම කියන්න බැහැ සුරලි"

"එහෙම නං එතැන්ට මාව එක්කන් යන්න"

"එහෙම එක්කන් යන්න තමයි මං පාර හරියටම දන්නෙ නැත්තෙ"

"මට තේරෙන්නෙ නෑ ඔයා කියන දේ"

"මං ආවෙ කාරෙක තියෙන තැන ඉඳලා ඒ එන ගමන් තමයි මං තැබෑරුමේ නැවතුනේ"

"තැබෑරුමේ?"

"අපි කියන්නෙ තැබෑරුම කියලනෙ. ඒකට සුද්දො නම දාලා තියෙන්නෙ" 'ටැවර්න් ඔන් ද ග්‍රීන්' කියලා"

"මට නං ඔයා කියන මොනවත් තේරෙන්නෙ නෑ. ජනේෂ්. ඔයා කාරෙක ගැන කියලා තැබෑරුමක් ගැන කියනවා. ඔයාට කවුරු හරි මොනව හරි පෙව්වද තැබෑරුමේදි?"

"නෑ නෑ යං කො කියන්න."කියා සිනාසෙමින් ජනේෂ් හැකිලූ කුඩය බස්තමක් සේ ගෙන එහි උල් තුඩ බිම අනිමින් ඉදිරි බෑවුම බහින්නට වුනේය.

සුරලි ඔහු පසු පසින් දෙපය ඉක්මන් කළාය. ගල් ගෙඩි අතරින් පල්ලමේ යද්දී ඇයට දූනුනේ පාවී යන්නාක් මෙනි.

බැවුම බැස්සාට පසු ජනේෂ් නැවතී ඉදිරිය බැලුවේය. ඈතින් පෙනුනේ මැඩම් එමිලියාගේ කොටේජ් එකයි. රොක් වෙත කලු වලා ගැබ නිසා ගේ අවටද අඳුරක් ගොනු විය.

"මැඩම් එමිලියා ගෙදර නැහැ" සුරලි තමා දත් ආකාරයට කීවාය. "මං කියන්න හිටියෙ ඔයාව හොයාගෙන අපේ තාත්තගෙ ඔත්තු හොයන්නෙක් ආවා"

"මාව හොයාගෙන? ඔත්තු හොයන්නෙක්?"

"අපේ තාත්තගෙ ඩිකෙට්ටිව් කෙනෙක්"

ජනේෂ් සිනාසුණේය.

"වාසනාවන්! අපිව හොයාගන්න..." ඔහු තවත් යමක් කියන්නට පෙර වැහි පොද එක දෙක වැටෙන්නට විය.

ජනේෂ් ලොකු කලු කුඩය දිග හැරියේය.

"එන්න සුදූ... කුඩේ යටට"

අත්ලක් අහසට පාමින්, සුරලි ජනේෂ් ළඟටම තුරුළු වෙමින් කුඩයේ සෙවනට වූනාය.

"අපි යමු එමිලියාගෙ කොටෙජ් එකට." සුරලි කීවාය. මට මහන්සියි. මැරිල වගේ නිදියන්න ඕනැ"

"නෑ නෑ දැන්ම නිදියන්න? මේ දවල් වරුවෙ?"

"එහෙනං?"

"මං කිව්වෙ අපි යං ටැවර්න් ඔන්ද ග්‍රීන් එකට"

"මොනවටද?"

"එතන ජොලි කට්ටියක් ඉන්නවා. එතන පරිස්සං"

"කාගෙන්ද?"

"ඔයාගෙ තාත්තගෙ ඩිටෙක්ටිව් ගෙන්" කියමින් ජනේෂ් අතකින්, සුරලිව තවත් තමාට ළං කර ගත්තේය. සුරලිද උණුහුමට මෙන් තව තවත් ඔහුට තුරුළු වූනාය. ඔහුගේ සුවඳ ඇයට හොඳ හැටිම දැනුණි.

"මේක නං හරිම හනිමූන් එකක් නේද ජනේෂ්?"

ජනේෂ් පිළිතුරු නොදී ඉදිරියටම ගමන් කළේය.

"ඇහුණද ජනේෂ්? මායා හෝටලයේ මධුසමය!"

"මායා හෝටලයේ මධු සමය!" කී ජනේෂ් වැයමෙන් මෙන් සිනාසුණේය. "මං ඔයාව මේ ගෙනැත් අමාරුවෙ දැම්මා නේද?"

"අමාරුවෙ දැම්මා? නෑ ජනේෂ් මං ආවෙ මගෙ කැමැත්තෙන් නේ?"

"මං ඔයාව අතරමං කෙරුවා" ඔහුගේ කට හඬෙහි පශ්චාත්තාපය රැඳිණි.

"නෑ නෑ ජනේෂ් එහෙම හිතන්න එපා මං ආවෙ ඔයාට ආදරෙන් නෙ වස්තුව!"

"ඒ උනාට සමහර විට ඔයාට මාව දාලා යන්න වේවි"

"නෑ නෑ දිවි තිබෙන තුරාවට... මං ඔයා ළඟයි ජනේෂ්"

"දිවි තිබෙන තුරාවට... ඔයාගෙද? මගෙද?"

"ම්... දෙන්නගෙම..."

දෙදෙනා මඳක් දුර නිහඬව ගමන් ගත්හ.

වැහි බිඳු කෙමෙන් වැඩි වෙමින් කුඩය මත සට සට ගාන හඬ ඇසෙන්නට විය.

ඔවුන් ගමන් ගත්තේ තාර ඇතිරූ පටු පාරක් ඔස්සේය. දෙපස ඝණ සැරේට ගස් වැල් වැවී තිබුණි. ඒ නිසාදෝ අඳුර වැඩි වූ ගතියක් දැනුණි.

"අපි මේ යන තැන මොකද්ද?" නිසලතාවය බිඳිමින් සුරලි විමසුවාය.

"මං කිව්වෙ ටැවර්න් ඔන් ද ග්‍රීන්... ඉස්සර එතන තණ පිට්ටනියෙ සුද්දො ගෝල්ෆ් ගැහුවා. ක්‍රිකට් ගැහුවා... සෙල්ලම් කරල ඉවරවෙලා ඒ ගොල්ලො බියර් එකක් එහෙම බොන්න ගියෙ ටැවර්න් එකට... තාමත් කීප දෙනා එතැන්ට එනවා"

"ඔයා එතනට ගියෙ කොහොමද?"

"අහම්බෙන්... මං කිව්වෙ... මං පාර හොයාගෙන එනකොට අහම්බෙන් එතෙන්ට යැවුණා. හවස්වෙන කොට තමයි කට්ටිය එන්නෙ කියල එතන මනුස්සය කිව්වා"

"ඔයා ගියෙ අපේ තාත්තා එවපු රහස් පරීක්ෂකයගෙන් ගැලවෙන්න වෙන්න ඇති. "සුරලි එය කීවා නොව සිතුවා පමණි. ඇය එසේ අනුමාන කළේ ජනේෂ්ගෙන් පිළිතුරක් නොවූ බැවිනි.

"කාරෙක කොහෙද ජනේෂ්?"

"කාරෙක? කාරෙක කාටවත් හොයාගන්න බැරිවෙන්න හැංගිලා තියෙන්නෙ. කිසිම ඩිටෙක්ටිව් කෙනෙකුට ඒක නං හොයාග න්න බෑ" කී ජනේෂ් මඳකට සිනාසී යළි කල්පනාවක ගිලුණේය.

"ඉතින් මේක මොනවැයින් මොනවැයින් කෙළවර වේවිද?" සුරලි ඇසුවාය.

"සේරම කාලය විසඳාවි සුදූ... ඒ සේරමලා අපිට දවසක අනුකම්පා කරලා සමාව දේවි."

"ඔයා දන්නෙ කොහොමද?"

"ජීවිතේ හැටි එහෙම තමයි. කිසිම දෙයක් හැමදාම එකම විදියට තියෙන්නෙ නැහැනෙ. ඔයාගෙ අම්ම තාත්තත් දවසක වයසට යනවා... මැරෙනවා... අපි සේරමත් ඒ වගේ. මේ ගැටුම් ප්‍රශ්න සේරම තාවකාලික දේවල් විතරයි."

"දාර්ශනිකයා!" සුරලි සිනාසී ජනේෂ්ට තවත් තුරුළු වූනාය. " ඔයා ළඟින් ඉන්න කොට මට තැනක් වෙලාවක් මතක නෑ වස්තුව..."

"තව වැඩි දුරක් නෑ"

ඇත මීදුම ගලා ආ අතරේ මෑත වැහි බිංදු තවත් ඝණ සැරේට වැටෙන්නට විය.

"අර පේන්නෙ..." ඉදිරිය බලා ජනේෂ් කීවේය.

වැහි දුමාරය අතරින් සුරලිට ගොඩනැගිල්ලක ඡායාව පෙනුණි. තනි මහලේ ඒ නිවස්නෙහි කවුළු කිහිපයකින් රන් තැඹිලි පැහැ ආලෝක ගලා ආවේය.

# 9

"ටැවර්න්" එක තුළින් සිනා කථා හඬ සියල්ල කළවම් වී පිටතට ඇසුනේ බඹර පොදියක ගුමු ගුමුවක් ලෙසිණි. පළ පුරුදු කාරයෙකු මෙන් ජනේෂ් ලොකු රතු ලෑලි දොර හරිද්දී සිහින් සංගීතයක් එළියට කාන්දු වුනේය. සුරලිට ඇතුල් වෙන්නට ඉඩ දී තමාද ඇතුළු වූ පසු ජනේෂ් කුඩය හකුලා දොර වසා දැමුවේය.

සියල්ල ආලෝකමත් වූයේ මන්දාලෝකයකිනි. දකුණු පසට වූ බාර් එක වෙත නම් වඩාත් එළිය දෙන විදුලි බුබුලක් රතින් දිලුනි. පිටතට ගලා ගියේ මේ පහනෙහි රත් තැඹිලි එළියයි. බාර් එක අසල හය හත් දෙනෙක් හිඳගෙන සිටියහ.

තමාට පිටුපා හිඳ සිටි අයෙකුගේ කබාය සුරලි එක්වනම හැඳුනුවාය.

"ෂෙලී! ෂෙලී විල්සන්!" තම තාත්තා තමාවත් ජනේෂ්වත් සොයන්නට එවූ රහස් පරීක්ෂක වරයා! කරුමයට ඒ මිනිහාත් මෙතන!

"අර !" ජනේෂ්ගේ අත්ගොබයක් මිරිකමින් සුරලි රහසෙන් මෙන් කීවාය.

"ඇයි? කවුද?"

"අර පස්ස හරවගෙන ඉන්නෙ! ෂෙලී!"

"ෂෙලී? කවුද"

"මං කිව්වෙ අපේ තාත්තා අපිව සොයන්න එවාපු ඩිටෙක්ටිව්"

"ඔයා කොහොමද දන්නෙ?"

"අද උදේ වරුවෙ...මිනිහව මං දැක්කා මැඩම් එමිලියාගේ ගෙදර සාලෙ"

"මූණ දැක්කෙ නැතෙ?"

"මූණ දැක්කෙ නෑ. ඔන්න ඔය විදියටම පිටුපස්ස හරවල වාඩිවෙලා හිටියෙ... ඔය කබායම... ඔය විදියටම ඩිංගක් තට්ටෙ!"

"හොඳටම විශ්වාසද?"

"හොඳටම ෂුවර්"

එසේ කී සුරලි යළිත් තිගැස්සුනාය.

"ආහ්! අර එයාට එහායින් වාඩිවෙලා ඉන්නෙ... මැඩම් එමිලියා!"

"හොඳටම විශ්වාසද?"

"හොඳටම ෂුවර්. මං දැන් තමයි හැඳිනුවෙ. මේ කරුවලේ හරියට පේන්නේ නෑ ජනේ!"

"බය වෙන්න එපා... සුරලි..."

"ඔයාමනෙ කිව්වෙ එගොල්ලන්ට නොපෙනෙන තැනකට මාව එක්කන් යනවා කියලා. දැන් අපි ඇවිත් තියෙන්නෙ මකර කටටම!"

"බයවෙන්න එපා. ඒගොල්ලන්ට අපිව පේන්නෙ නෑ ඔක්කොම බලා ගෙන ඉන්නෙ වෙන අහක්. අපි ආවද කියලවත් එයාලට වගක් නෑ. අපි ඔහොම පිටුපස්ස හරියට යං. බලන්න ඒ හරිය කරුවලයි. ඉන්නෙ කවුද කියලවත් හරියට පේන්නෙ නෑ."

ජනේෂ් එසේ කියද්දී සුරලි තැබෑරුමෙහි පිටුපස කොටස දෙස බැලුවාය. එහි දැල්වුනේ රතු ලන්තෑරුම් තුනක් පමණි. එයින් ආ එළිය යන්තම් හැඩ පෙන්වන තාලයේ මඳ එළියක් විය. ඇත්තෙන්ම ඒ කොටසෙහි වූයේ එළියකට වඩා අඳුරකි.

සිහින් සංගීතයක් අවට පැතිර ගියේය. කවුදෝ ගායිකාවක ආදරබර හඬකින් ගැයූ ගීතයක වදන් සිනා කථා හඬින් යටපත්ව අපැහැදිලි වුවද සුරලිට වරින් වර පේළියක් අහුලා ගත හැකි විය.

"ඔබ යන තැනක ට මම එන්නම්

අත අත නැරම මම ඉන්නම්

හමුවෙන වෙන්වෙන හැම මොහොතකදීම

නොමියෙන ආදරෙ පුද දෙන්නම්..."

ගායිකාව නැග සිටි කුඩා වේදිකාව තිබුණේ ශාලාව මැදට වෙන්නටයි. ඇගෙන් වම් අතට වඩාත් එළිය තිබුණ අතර දකුණු පසට වූයේ අඳුරයි. ඇගේ මුහුණේ අඩකටත් එළියක් පතිත විය. ඈ හැඳ සිටියේ අත් රහිත කලු දිග ගවුමකි. රවුම් විවර කරෙන් පහළට ආ සිහින් රන් පොටක මැද දියමන්තියක් දිලිසුණි. ඈ වරින් වර එක් අතකින් ඒ දියමන්තිය අල්ලමින් අනෙක් අතින් අල්ලාගත් මයික්‍රෆෝනය නලවමින් ගී ගැයුවේ වෙනම ලොවක පාවී යන්නාක් මෙනි. ඇගේ දෑස අඩවන් විය.

ඇගේ පසු පස ගිටාර වාදකයෙක් සහ කොංගො වාදකයෙක් සිටි අතර ඇගේ දකුණත අඩ අඳුරේ පියානෝවක් වෙත ද වාදකයෙක් සිටියේය. හැම දෙනාම කලු හැඳ සිටි බැවින් ඔවුන් වඩාත් පැහැදිලි නොවූහ.

සුරලිගේ සුරත අල්ලාගත් ජනේෂ් මඟ ඉස්සර වී පුටු මේස කීපයක් අතරින් සාලාවේ අඳුරුම කොටසට ගමන් ගත්තේය.

වඩාත් අඳුරට යත්ම සුරලිගේ බියද සංකාවද කෙමෙන් තුනී විය. ෂෙලීට හෝ එමිලියාට තමාව දූන් සෙනඟ අතරේ නොපෙනේනේ යැයි ඇය තුළ අස්වැසුමක් විය.

මුල්ලක ඉඩ තිබූ කුඩා රවුම් මේසයක් වෙත ජනේෂ් සුරලිට හිඳ ගන්නට ඉඩ සලසා තෙමේද හිඳගත්තේය.

"තිබහ ඇති නේද?" ජනේෂ් ඇසුවේ ලයාන්විත පහත් ස්වරයකිනි.

"ඔයා ළඟ ඉන්න කොට තිබහත් නෑ බඩගිනිත් නෑ" සුරලී ඇත්තම කීවාය. ඔහු අසල හිඳිද්දී සතුටත් උණුසුමත් විය. ආදරය කියන්නේ මේ සුරක්ෂිතභාවයම නොවේද? හදවතත් උණුසුම් කරන ආදරය.

ගායිකාව ගීතය අවසන් කරත්ම ඇසුණේ සිහින් අත්පොළසත් කීපයක් පමණි. ඈ හැම රාත්‍රියේම මෙතැන ගී ගයනවා ඇතැයි සුරලි අනුමාන කළාය. මෙතැනට හැම රැයම එන අයට ඇගේ හඬෙහි හෝ ගීතයෙහි අලුත් බවක් නැතිව ඇති.

සුදු කබායක් හා සරමක් හැඳගත් ආවතේව කරුවෙකු අතක රතු තුවා කඩක් රඳවාගෙන ඔවුන් සිටි මේසය වෙතට ආවේය.

ඔහු යමක් අසන්නට පෙර ජනේෂ් "මට ලාගර් එකක්" යැයි කීවේය. ජනේෂ් එහෙමට බොන කෙනෙක් නොවෙයි. අද මේ විශේෂ රාත්‍රියේ ඔහුට ඇඟ පත උණුසුම් කරගන්නට උවමනා ඇති. "ඔයාට මොනවද සුදූ?" අනතුරුව ඔහු සුරලි දෙස බලා ඇසුවේය.

"මට... මට කූල් වතුර එකක් ඇති"

"එහෙම පුළුවන්ද?" ජනේෂ් ඇගේ අතකින් අල්ලා කීවේය.

ඔහුගේ අත දැඩි සීතලෙන් යුතු විය. පිටත මීදුමත්, වැස්සත්, නිසා විය යුතුය. තමාගේ ද ගත පුරා හිරියක් දිව යනු සුරලිට දැනුණි.

"මොනවත් ඇඟ රත් වෙන්න?" ආවතේවකරු යන්තම් සිනාසී ඇසුවේය.

"හොඳයි එහෙනම් හොට්... හොට් චොකලට් එකක්. "සුරලි කටට ආවක් කීවාය. බොන්නට අවශ්‍ය නැත. උණුහුමට මොනවත් කියලානෙ ආවතේවකරුත් කිව්වෙ!

ඔහු එතැනින් තික්ම ගියේය.

"අද රෑ අපි කොහේද ඉන්නෙ?" සුරලි විමසුවාය.

"ඇයි මැඩම් එමිලියාගේ කොටේජ් එකේ කාමරේ"

"එතන කමක් නැද්ද ජනේ?"

"හෝටලයෙ ඉන්න බැහැනෙ?"

"ඒක නං ඇත්තයි. අපිට රෑ එන කොට ඒකෙ අබලන් තත්වෙ පෙනුණෙ නැහැනෙ. එතන ගින්නක් ඇවිලිලා තියෙනවා..." සුරලි කීවාය.

"පුදුමෙ කියන්නෙ ඊයෙ මහ රෑ මං ජනේලෙන් බැලුවම දැක්කා එතන ගිණි ගන්නවා!"

ජනේෂ් ඈ දෙස බලමින් අවිශ්වාසයෙන් මෙන් හිස සැලුවේය.

"ඇයි ඔයා මට කිව්වෙ නැත්තෙ?"

"කියන්නෙ කොහොමද? ඒ වෙලාවෙ ඔයා හොඳටම මැරිල වගේ නිදි!"

ජනේෂ් පිළිතුරක් නොදුන්නේය.

"මං හිතුවෙ උදේ නැගිටල ගිහින් බලන්න. ඒ උනාට ඊළඟට මට හොඳටම දවල් වෙනකල් නින්ද ගියා. ඒ නැගිටල බලන කොට ඔයා අන්තර්ධාන වෙලා!"

මෙවර ජනේෂ් සිනාසුණේය.

"මං ගියෙ කාරෙක බලන්න"

"ඉතිං?"

"කාරෙක තිබුණෙ නැති නිසා තමයි මට ලොකු රවුමක් ගහන්න සිද්ධ උනේ"

"ඔයා හිතන්නෙ අපේ තාත්තගෙ තැරැව්කාරයෙක් ඇවිත් කාරෙක අරන් යන්න ඇති කියලද?"

ජනේෂ් වෙත පිළිතුරක් නොවීය. ඔහු දෙඋර සෙලෙව්වා පමණි.

ආවතේවකරු බන්දේසියක තබාගත් ලාගර් බෝතලයත් සිහින් උස් වීදුරුවත් රැගෙන මේසය වෙතට ආ හෙයින් සුරලිගේ කථාව නතර විය. ආවතේවකරුවාද තාත්තාගේ තැරැව්කරුවෙකු විය නොහැකිද?

ඔහු වීදුරුව සෙමින් මේසය මත තබා අනතුරුව ලාගර් බෝතලයද ඒ අසලින් තබා බන්දේසිය පැත්තට හරවා ඇඟට තදකර වමතින් අල්ලා දකුණු අතින් ඒ පස සාක්කුවෙන් ගත් බෝතල් ඕපනය ලාගර් බෝතල් කටට තබා එක් සැණෙකින් "ච්ස්!" හඬක් නංවමින් බෝතල් පියන ඉවත් කළේය.

"චක්කරන්නද සර්?"

"එපා... මං දාගන්නං"

"මැඩම්ගෙ හොට් චොකලට් ඩ්‍රින්ක් එක මං ඩිංගෙන් ගේන්නං..."තරුණ සේවකයාගේ මුහුණෙහි වූයේ බයාදු බැල්මකි.

ගායිකාව තවත් ගීතයකට මුල පිරුවාය. මෙතෙක් ඇගේ හිස් බව පිරෙව්වේ වාදක කණ්ඩායම ඉදිරිපත් කළ ජෑස් සංගීතයකි. දැන් ඔවුන් ඒ ස්වරයෙන්ම මෙන් ඇගේ ගීතයට අඩි තාලම් තබන්නට වූහ.

සුරලි අඩ අඳුරේ පෙනෙන ජනේෂ්ගේ මුහුණ දෙස බැලුවාය. ඔහුගේ දෑස් සමාධියකින් මෙන් පියැවී තිබිණි. ඔහු සංගීතයට සවන් දෙමින් කොහේදෝ ඈත ලොවකට පාවී ගියාක් වැන්න.

ඔහුගේ දෑහැන බිඳින්නට බැරුවාක් මෙන් ඇ ඒ වුවන දෙස බලා සිටියාය.

තමා ඔහුට කොතරම්ම ආදරේද? එයට මිණුමක් නැත. කෙළවරක් නැත. ඉමක් නැත. තමාව බැඳ තබන්නේ ඒ පිවිතුරු අකලංක වූ ආදරයයි!

# 10

ආවතේවකරුවා උණු චොකලට් දියරය සහිත මග් එක සුරලි ඉදිරියේ තබා ආපසු යන්නට හැරුණා පමණි. ඔහු යන දිසාවට හිස හැරවූ සුරලිට පෙනුණේ බාර් එක අසල හිඳ සිටි ෂෙලී නැගිට තමා සිටි අතට ඇවිද එන හැඩයි.

සුරලි, ජනේෂ්ගේ අතකට තට්ටු කොට ඔහුගේ සාමාධිය බින්දාය.

"අර... මිනිහා..."

ඈ කීවේ එපමණයි.

"බලන්න එපා!"යි පහත් හඬින් කී ජනේෂ් බිම බලා ගත්තේය.

ෂෙලී ඔවුන්ව නොදුටු ආකාරයට එතැන පියමං කරගෙන ශාලාවේ පසු පස අඳුර අතට ඇවිද ගියේය. වැසිකිළි පහසුකම් තිබුණේ ඒ පැත්තේය.

සුරලිගේ හද ගැස්ම වැඩි විය. එහෙත් ජනේෂ් ඉතා සන්සුන් ආකාරයෙන් සිය පුටුවෙන් නැගිට්ටේය.

"අපි දෙන්න එකට හිටියොත් තමයි මිනිහ අපිව දකින්නෙ. මං මෙතනින් යනවා. මං කියන කල් කොහෙවත් යන්න එපා. මෙතන ඉන්න" ජනේෂ් ඒ ටික කීවේ ඈ ළඟ සිටගෙන ඇයගේ මුහුණට නැඹුරුවය.

අවට සිටියවුන් කිසිවෙක් ඔවුන්ගේ හැසිරීම ගණන් ගත්තේ නැත. හැම දෙනාම අඩ අඳුරේ තම තමන්ගේ ලෝකවල අතරමං වූ සේය.

ජනේෂ් එක් වරම සුරලිගේ දෙඋරට පසුපසින් දූත් තමා මිරිකා අතහැරියේ සමු ගැනීමේ සංඥාවක් ලෙසිණි. අනතුරුව ඔහු ෂෙලී ගිය අතටම ඇවිද ගියේය.

කාලය ගතවූයේ ඉතා සෙමිනි.

ගායිකාවගේ ගායනා අවසන් වී යළිත් ජෑස් තුන් කට්ටුව වාදනයක් අරඹා තිබිණි.

ජනේෂ් දූන් එතැයි, දූන් එතැයි සුරලි බලා සිටියාය.

එක්වනම ඇයගේ දකුණු පස වූ මේසයක් වෙත සිටි මිනිසෙක් එක්තරා ලතෝනි හඬක් නගා හුන් තැනින් නැගිට්ටේය. උවමනාවට වඩා බීමත් වූ අයෙකු ඔක්කාර කරන හඬක්! අඳුරේ කිසිවක් පැහැදිලි නොවීය.

කවුරුන් හෝ ඒ තැනැත්තාව දෙපසින් අල්ලා වාරු දූන් දෙදෙනෙක් ඔහුව පිටුපස දොර අතට කැටුව ගියහ.

"ජ...නේ...ෂ්" නොසිතාම ඔහුගේ නම සුරලිගේ දෙතොල් අතර මිමුණුනි.

පිටු පස දොර දිසාව නෙත් හයා සිටි සුරලිට එතැන සිට ඇතුළට එන ජනේෂ්ව පෙනුණි. ඔහු දෑතින්ම යමක් අල්ලා සිටින බවත්, අනතුරුව ඔහු තවත් ළං වෙද්දී එය තද නිල් පැහැ කබායක් බවත් සුරලි හැඳිනුවාය.

ඈ අසලට ආ ජනේෂ් ඇයට පිටුපසින් සිට තමා ගෙන ආ කබාය ඇගේ දෙඋර වසා දූමුවේය.

"ඕක ඇඳගන්න." අනතුරුව ඔහු තම කලිසම් සාක්කුවෙන් ගත් ලොකු තද නිල් පැහැ ලේන්සුවක් ඈ වෙත පාමින් "ආ!" යැයි කීය.

"මේක මොකටද?"

"ඕක ඉහ වටේ දාගන්න. කබාය ඇඳගන්නකො. කොහොමත් එළියෙ හීතලයිනෙ. ඔහොම ඉන්න කොට කවුරුවත් ඔයාව අඳුරන්නෙ නැහැ. අපි දෙන්නා එකට නොඉඳින තරමට හොඳයි. මොකද, අපිව හොයන කෙනෙක් හොයන්නෙ හිතන්නෙ

අපි දෙන්නම එකට ඉන්නව කියලා. මං දූන් ටිකකට එළියට ගිහින් එනවා. ඒ එනකොට මං ඔයාට විදියක් පිළියෙල කරගෙන තමයි එන්නෙ"

"විදියක්?! පිළියෙල කරගෙන?"

සුරලිට පිළිතුරක් නොදෙමින්, ජනේෂ් යළිත් පිටුපස දොර දිසාවට ඇවිද ගියේය.

ඔහු නොපෙනී යන විටම මෙන් ගායිකාව තවත් ගීතයකට මුල පිරුවාය. එය ඉංග්‍රීසියෙන් ගැයුන ලයාන්විත ගීතයක් විය.

සුරලි අසා සිටියාය.

YOUR LOVE FILLS ME, MY BEAUTIFUL BEING
YOUR CRYSTAL LIGHT IS IN MY HEART
NOW I KNOW THAT WE DON'T DIE
EVEN THOUGH SOMETIMES WE SAY GOODBYE

AND WHEN YOU WHISPER IN MY DREAMS
THAT YOUR LOVE IS TRUE AND FOREVER ETERNAL
I BRIM WITH JOY
AND I SURRENDER
TO THE BOUNDLESS WONDER
OF YOUR LOVE

වදන් ඇසුණද ඇයට කිසිවක් සිතෙහි ධාරණය කර ගන්නට නොහැකි විය.

තව මඳ වේලාවකින් ජනේෂ් යළිත් සුරලි වෙතට පැමිණ සිටියේය.

"අපි යමු" ඔහු ඇය අසලම සිටගෙන කණට කොඳුරමින් කීවේය.

"කොහේටද?" කියමින් සුරලි අසුනෙන් නැංගාය.

"යමු"

සුරලිගේ සුරත අල්ලා ගත් ජනේෂ් පාවීගෙන මෙන් අඩ අඳුර මැදින් පිටුපස දොර වෙතට ගියේය. සුරලිටද දැනුණේ පාවීගෙන යන විලාසයකි. අර ගීතයේ රිද්මය විය යුතුයි.

පිටුපස දොරෙන් පිටත පාණ්ඩු පැහැති පහන් එළිය දෙන කණුවක් යට කුඩා ට්‍රක් රථයක් නවතා තබිණි. එය පරණ, නිල් පැහැති ට්‍රක් රථයකි. පිටුපස විවරයේ පහත අඩ වසා හරස් දොරටුවක් විය. උඩු කොටස වසා පහළට වැටුණේ තිර රෙද්දක් වැනි තද කොළ පැහැ කැන්වස් කැල්ලකි.

අවට සිහින් පොදයක් වැටුණෙත් විදුලි පහන යට විසිරෙන දිය බිඳු දිලිසුණි. පාරෙහි තාරද මේ වැහි දියෙන් පෙඟී ඔපවත් විය.

එයින් අවට පෙදෙස මීදුම් අඳුර නිසා අපැහැදිලි වූ අතර, සීතලෙන් මිදෙන්නට මෙන් සුරලි කබාය ඇඟට තද කර ගත්තාය.

ජනේෂ් ට්‍රක් රථයේ පිටුපස බාගෙ දොර පහතට හෙළද්දී සුරලිද ළංව ඇතුළත බැලුවේ කුතුහලයෙනි. ඇතුළේ අඳුරේ ගෝනි දෙකක් පිරෙන්නට මොනවාදෝ අසුරා තිබිණි.

"සුදූ..." ජනේෂ් සුරලිගේ කනට ළංව කථා කළේය. "ඔයා මේකට නගින්න"

"කොහේ යන්නද?"

"මේක මැඩම් එමිලියාගෙ බඩු ගෙන යන බට්ටා ලොරිය. මේක එළවන්නෙ ටිකෝ - හෙවත් ටිකිරි බංඩාර. මේක එමිලියාගෙ කොටෙජ් එක ළඟ නැවතුණාම ඔයා එතැනින් බැහැගන්න."

"එතකොට ඔයා?"

"මමත් රයිඩ් එකක් අල්ලන් ඊවෙලා එනවා. ඔයා ගිහින් නිදියන්නකො..."

"ජනේ... කෝ ඔයාගෙ ෆෝන් එක?"

"ෆෝන් එක!"

"ඔව් සෙල්ෆෝන් එක?"

"ඒක ලොකේට් කරන්න බැරි විදියට තියෙන්නෙ"

"එතකොට?"

"එතකොට කාටවත් අපිව හොයාගන්න බැහැ. ඔයාගෙ තාත්තගෙ යාලුවො දනටම මාව ඒ ෆෝන් එකෙන් ලොකේට් කරන්න හදනව ඇති. මං දන්නවා. ඒක හැංගිලා තියෙන්නෙ. කාරෙක තියෙන තැනම.

"කොහේද?"

"පස්සෙ කියන්නම්... ඒ ෆෝන් එකේ ජූස් ඉවරයි."

"ජූස්?"

"බැට්‍රි චාජ් ඉවරයි. අන්න අර මිනිහා එනවා"

"කවුද?"

"විනෝ... මැඩම්ගෙ ඩ්‍රයිවර්... මිනිහා ටැවර්න් එකට ගියෙ තොඩි අඩියක් දාලා එන්න. ඇඟ පත උණුසුම් කරගන්න"

මඳක් එපිට කාමරයේ පිටුපස දොර අසල මතුවූ පුංචි හැඩේ මිනිසාගේ සේයාව පුරලිටද පෙනුණි.

"ඔයා නැගිටින්න පුළු" කී එහෙන් පුරලිට ලොබියේ පිටුපසට කැඳගන්නට අත් උදව් දී, මායා දොර එකා ලොබියේ අඳුරු පැත්තට ගොස් සැඟවුණේය.

විනෝ කාටදෝ මොනවදෝ කියමින් ලොබිය අතට එනු ඇසුණි.

තව මඳකින් ඔහු රියැදුරු අසුනට නැඟී රිය පණ ගැන්වූයේය.

දොරකඩ සිට යමින් කී කටහඬ පුරලි හැඳිනුවාය.

"නෙලී!"

එහෙම නම් නෙලී විනෝව හඳුනනවා හැබයි.

"මැඩම්ව මං එක්කන් එන්නං" නෙලී කියනු ඇසුණි "විනෝ යන්න පටන්ගමින්"

පිළිතුරු දෙනවා වෙනුවට ටිකෝ රිය පෙදලය පාගා සැර නංවා ගමන ආරම්භ කළේය. පහතට වැටී තිබූ කැන්වස් රෙද්ද කෙළවරක් ඔසවා සුරලි බැලුවේ ජනේෂ් අවට ඇද්ද කියායි.

අවට අඳුරේ කිසිවක් පැහැදිලි නොවීය.

සුරලි, රියේ ගැස්සිල්ලට පිටුපස තිබූ ගෝනි දෙක මත්තේ පෙරළී වැටුණාය. ඈ වැටුණු තැනම අඳුරේ දෑස් පියාගෙන වත්නක් වේවායි සිතුවාය.

තමාගේ ජීවිතය තමාට පාලනයක් නැතිය යන හැඟුම ඈයව ඉහවහා ගියේය.

රථය තුළ උණුසුම එකතුවන්නට වූයෙන් සුරලි තමා ඇඟලා සිටි කබාය ගලවා ඇතුළත අඳුරට විසි කළාය.

# 11

මීදුම අතරින් ඇදී ආ කුඩා ලොරිය, මැඩම් එමිලියාගේ කොටේජ් එකේ පසෙක මිදුල් කඩෙහි නැවතුණි. ටිකෝ රිය එළවා ආවේ සෙමිනි. ඇතැම් විට රිය උවමනාවට වඩා පැද්දෙතැයි එහි පසුපස ඇතුළේ අඳුරේ ගුලිවී සිටි සුරලිට හැඟුණි. ඈ වරක් දෙකක් කැන්වස් රෙදි කඩ කෙළවරක් ඔසවා පිටත බැලුවේ මේ කොහේ දැයි සොයන රිසියෙනි. එහෙත් පිටත වූයේ අඳුර හා මීදුමම පමණි.

වරක් දෙකක් ඈත බකමූහුණෙකුගේ "හූම්" හඬක් ඇසී නැසී ගියේය.

ඇතැම් විට හඬකට වඩා නිසලතාවය බියකරුය. සුරලිට බියකට වඩා දැනුණේ අසහනයකි. තමා අවේ පෙම්බර සැමියෙකු සමග මධුසමයකට වූවද දැන් මේ ගමන කිසිම අරුතක් සොයාගත නොහැකි පටැලැවිල්ලක් බවට පත්වී තිබුණි.

තමා දන්නවාට වඩා යමක් ජනේෂ් දන්නා බවත්, ඔහු තමාගෙන් නොයෙක් දේ සඟවන බවත් දැන් ඇයට පැහැදිලි විය. එහෙත් ඔහු එසේ හැසිරෙන්නේ ඇයි? තම දෙමාපියන්ට හසු නොවී හිඳීමට? කොතෙක් කල් එසේ සැඟවී සිටින්නද?

රථය ඇවිත් නැවතුණ පසු සුරලි ටික වේලාවක් සිටි තැනම සිටියාය. ටිකෝ යළිත් වාහනය පණ ගැන්වූයේ නිසියාකාරව එය ගාල් කරන්නට මෙනි. රිය සෙමින් එහා මෙහා වෙද්දී සුරලි පසුපස බාගෙ දොරට උඩින් දෙපය දමා පිටතට පැන්නාය. අවට මීදුම සණ විය. එහෙත් තමා ටිකෝ ගේ දෑසට හසු නොවිය යුතුය යන සිතුවිල්ලෙන් ඇය ඔහු රියෙන් බසින්නට පෙර අඳුරට දුව ගොස් ගෙදරින් මදක් එහාවූ පඳුරු ගොල්ලක් පිටුපස සැඟවුනාය.

ටිකෝ රියෙහි පිටුපස අතට එමින්,

"රූපා" යැයි හඬ ගෑවේය. රූපා කොතනැකදෝ සිට පිළිතුරු ලෙසින් "ඕ!" යැයි නාසික ස්වරයෙන් කියනු ඇසිණි.

"මේං ලට්ට ලොට්ට වගයක් ගෙනාව... මඩුවෙන් ගිහින් තියාපං. මේ එළවළු ටික කුස්සියෙන් තියාපන්"

"හා... හා... හා" තාලයට කියමින් රූපා ගෙයි පිටුපස දොරෙන් පිටත දෘශ්‍යමාන වූවාය.

"මයි යනවා මගෙ පැලට නිදියන්න. මැඩම්ට ඕනැ උනොත් මට කෝල් එකක් දෙන්න කියපං"

"හා... හා... හා"

රූපා එළවළු මල්ල ගෙන පිටුපස දොර අතට ගියේ පැද්දෙමින් මෙනි. දොර අසළ දී ඈ ආපසු හැරී, "කෝ නෝනා, උඹ එක්ක ආවෙ නැද්ද?" කියා ඇසුවාය.

"අර මහත්තයා කාරෙකෙන් ගෙනැත් බස්සනවා කිව්වා"

"එහෙනං එළි වේවි!"

"එළි වේවි එළි වේවි! හා...හා හා!"යැයි සිනා හඬින් කී ටිකෝ යළි රියට නැඟ රිය පණ ගැන්වීය. "මං යනවා නිදියන්න"

"මං ඉස්සරහ දොර කොහොමටත් අගුල දාන්නෙ නෑ... දන්නවනේ..."

"ඔව් ඔව් අමුත්තො එනවනෙ! ඉස්සරහ ලැයිට් එකක් දාලාම තියපං රූපා"

ටිකෝ කුඩා ලොරිය සැර දමා අඳුරු මීදුම අතට යමින් අතුරුදහන් වූයේය. බලා සිටි සුරලිට අන්තිමේදී පෙනුනේ වාහනයේ පිටුපස රතු එළි දෙක ගිණි පුපුරු දෙකක් මෙන්, යකෙකුගේ රත් දෑස් මෙන් දිලිසී දලිසී ඇස් මානයෙන් ඉවත් වූ ආකාරයයි.

රූපා පොල් ගෝනිය කුස්සියෙන් පිටත පැත්තේ මඩුවකට ඇද ගෙන යන හැටි සුරලිට එතැන බිත්තියෙන් නෙරා දැල්වුණු පාණ්ඩු පැහැ එළියෙන් පෙනුණි.

සුරලි හෙමින් සීරුවේ සැඟවී සිටි තැනින් පිටතට ආවාය. රූපා කීවේ ඉදිරි දොර හැර ඇති බවයි. එහෙත් එතැනට යන්නට පෙර, තමා පෙරදා රාත්‍රියේ නිදාගත් කාමරයේ වීදුරු කවුළුවක් අඩක් හැර දමා ඇති බව පෙනුනෙන් සුරලි එතැනට පිය මැන්නාය. බිමින් අඩි දෙකක් තරම උසින් වූ කවුළුවෙන් ඇයට පහසුවෙන් ඇතුළට පැන ගත හැකි විය. ඇය එයට පය තබත්ම පිටුපසින් මෙන් රූපා කථා කරන හඬ ඇසුණි.

"මට පේනවා... මට පේනවා... මොකටද ඔය ජනෙල් වලින් රිංගන්නෙ? ඉස්සරහ දොර ඇරිල තියෙද්දි? දොර ඇරපන් අමල් බිසෝ..." රූපා තාලයට කීවාය. සුරලිට ලැජ්ජාවක් දැනුණි. ඇත්තෙන්ම තමා ජනෙල් වලින් පැනිය යුතු නැත.

"තැන්ක් යු රූපා!" සුරලි එසේ කීවත් රූපාට එය ඇසුණාද නැද්ද යන්න හැඟවෙන පිළිතුරක් නම් නොවීය.

"යන එන කෙරෙන හැම දෙයක්ම මට පේනවා" රූපා කතා කළේ තමාටමය. "ඉතිං මට මොකද? කවුරුවත් මං කියන දේවල් අහන්නෙත් නෑ විස්වාස කරන්නෙත් නෑ!" එසේ කියමින් රූපා පසු පස දොර අතට ගමන් කරද්දී සුරලි ඉදිරි දොර වෙතට ආවාය.

දොර ඉහලින් විදුලි පහන දැල්විණි. සුරලි දොර හැරගෙන සාලයට එන විට එහි මුල්ලක ඉහළ සුරුවමක් අසල දැල්වෙන කුඩා විදුලි බුබුලක් දැකිය හැකි විය. එයින් ආ මන්දාලෝකය සාලයේ අඳුර යන්තම් මැකුවේය.

සුරලි තමා කලින් නිදාගත් කාමරයට ආවාය. විදුලි පහන දල්වන්නට වත් ඇයට සිත් දුන්නේ නැත. ඈ හැඳ සිටි ඇඳුම පිටින්ම ඇඳට වැටුණාය.

නින්ද යාගෙන එන මොහොතේ ඇයට සිතුනේ 'ජනේෂ් දැන් කොහේ ඇද්ද?' කියායි. ඔහු ඉක්මනටම එන විට ඔවුන්ගේ ඇඳුම් බෑග ආදියත් රැගෙන ඒවිද?

පිළිතුරු නැතිව ඇය නිදි ලොවට පිවිසියාය.

ඇයට සිහිනයෙන් මෙන් ඇසුණේ කුස්සිය දිහාවේ තනිවම තාලයට ගී ගයන රූපාගේ කටහඬයි.

"අම්මත් ආවා

අප්පත් ආවා

මුතුත් ගෙනාවා

මුතු අමුණන වැලුත් ගෙනාවා

දොර ඇරපන් අමල් බිසෝ

දොර ඇරපන් අමල් බිසෝ..."

එය නැලවිලි ගීයක් මෙන් විය.

වම් ඇලයට හැරෙමින් සුරලි ගුලි වුණාය.

කවුදෝ තමාගේ පිටුපසින් ඇවිත් තෙරපෙණු සුරලිට දැනුණි. කාමරය අඳුරේ විය.

"ජනේෂ්!"

"ම්... "

ඔහු ඇවිත් තුරුළු වෙන හැඩයි.

"කොහොමද ආවෙ?" සුරලි රහසින් ඇසුවාය.

"මැඩම් ආපු කාරෙකේ" ජනේෂ්ද රහසින්...

"මැඩම් ආවද?"

"ඔව්"

"කා එක්කද?"

"ෂෙලී... වාහනයක් ලෑස්ති කරල දුන්නා..."

"ඔයා?"

"මං ඒකෙම නැඟිලා ආවා"

"හෙට..."

"දැන් නිදියන්න සුද්දූ..." ජනේෂ් කීය. "හෙට වෙනදේ හෙට බලමු"

"අපි කොහේද යන්නෙ?"

"මං හෙට උදේම ගිහින් අපිට ඉන්න තැනක් පිළියෙල කරනවා"

"කොහේද?"

"මේ ළඟම..."

"ඊ ළඟට?"

"අපි එහාට වෙලා ඉමු. සේරම සෙටල් වෙනකල්..."

ජනේෂ් තවමත් කතා කළේ සුරලිට පිටුපසින් ඇලවී ඇයව තුරළු කරගෙනයි.

"සේරම සෙටල් වෙන කල්?"

"ඔව් ඔයාගෙ අම්මා තාත්තා... අපේ ගෙවල්වල උදවිය... සේරම දැන ගත්තාම... හොයාගත්තාම..."

"ඊට පස්සෙ"

"එතකොට කවුරුත් අපිට සමාව දුන්නාම..." දැඩිව නිදිමත දැනුනෙන් සුරලිට තව දුරටත් ඔහු කී කිසිවක් පැහැදිලිව ඇසුණේ නැත.

# 12

සුරලි දැස් හරින විට තවත් දවසක් උදාවී තිබිණි. කාමරයේ කවුලුවේ දුහුල් සුදු තිරපට අතරින් ගලා ආ හිරුකැත් සුදෝ සුදට ඇඳ පාමුල වැතිරුණේය. ඒ කවුළුවෙන් ආ සිහිල් සුළඟට තිරපට, අත් වනමින් රැඟුමක් පාන්නාක් සේ නැලැවෙමින් සුරලිට නැගිටින්නැයි කීවේ නිසල නැටුමකිනි.

"ජනේෂ්!"

සුරලි සිතුවේ ජනේෂ් තවමත් තමාට තුරුළුවී උණුසුමට නිදි ඇති කියායි.

එහෙත්...

කලින්දා සේම ඔහු ඇගේ සිරුරට කොට්ටයක් තෙරපා තබා පිටවී ගොසිණි! තමාව අවදි කරන්නට ඔහු අකමැති වෙන්නට ඇති. අනෙක තමාගේ නින්ද ඉතා දැඩි වන්නට ඇති.

පිටත සාලයේ කවුදෝ කථා කරන හඬ ඇසුණි.

සුරලි කන් තියා අසා හුන්නාය.

මැඩම් එමිලියා.

තවත් කටහඬක්. පහත් පිරිමි කටහඬක්.

"මට තවම නම් මොනවත් හොයා ගන්න දැන ගන්න බැරි උනා" මැඩම් එමිලියා කීවාය.

"මාත් එක්ක රවුමක් යන්න එනවද?" ෂෙලීගේ කටහඬ සුරලි හඳුනා ගත්තාය.

"ඔව් ටිකක් එළිමහනෙ යනකොට තමයි මනස පැහැදිලි වෙන්නෙ..."

"මැඩම් ලැහැස්ති නම්..."

"මම ලෑස්තියි" කී එමිලියා හඬ නගා "රූපා!"යි කථා කළාය.

"ඉයස් මැඩම්" රූපාගේ කටහඬ ඇසුණි.

"කවුරු හරි ආවොත් උඹ සලකන්න දන්නවනෙ?"

"ඔව් මැඩම්. ඉයස් මැඩම්"

"මං මේ මහත්තයත් එක්ක පොඩි ගමනක් ගිහින් එනවා...."

"දවල්ට කෑම?" රූපා ඇසුවාය.

"කරදර වෙන්න එපා" ෂෙලී පිළිතුරු දුන්නේය.

"අද මැඩම් ලන්ච් මගෙ ගානෙ. යන ගමන් මොනවත් මෙසෙජස් ලැබුණොත් මට කියන්නකො"

"ඔව් යමු එහෙනං"

සුරලිට නැගිටින්නට හිතුණේ නැතත් ඈ වැයමෙන් නැගිට කවුළුව වෙතට ගොස් පිටත බැලුවාය.

ෂෙලීගේ රථය වැටෙන් පිටත නවතා තිබිණි.

තව මඳ වේලාවකින් ෂෙලීත් ඒ අනුව එමිලියාත් ඉදිරි දොරෙන් පිටතට ආහ. ෂෙලී පෙරදා ඇඳුමම හැඳ සිටි අතර මැඩම් එමිලියා දිලිසෙන කහපැහැ, තැඹිලි පැහැ රෙද්දකින් මැසූ දිග ගවුමක් හැඳ සිටියාය. බස්තමට වාරු වෙමින් ඈ ගමන් කළේ සෙමිනි. ඉදිරියෙන් ගමන් ගත් ෂෙලීට ඇසෙන්නටදෝ ඈ හඬින් කතා කළාය.

"කවුරු හරි කෙනෙක් ඇවිත් මට මෙසෙජස් දුන්නොත් මං මිස්ට ෂෙලීට කියන්නම්කො..."

"මම හෙට උදේ ආයෙත් කොළඹ යනවා. තව කේසස් තියෙනවනෙ. මං හිතුවෙ මේක දවසක ලේසි පාසු වැඩක් කියලා"

"සේරම අත් ඇඟිලි අස්සෙන් ලිස්සල යනව වගේනේ?"

"හරියට හරි... ඒ වගේ තමයි මට දැනෙන්නෙ, ඇත්තටම හෝඩුවාවක්වත් නැහැනෙ?" ෂෙලී කියන අතරේ ඔවුන් දෙදෙනා රථය වෙතට පිය නගා තිබිණි. ෂෙලී, එමිලියා වෙනුවෙන් ඉදිරි මගී දොර හැර දුන්නේය. ඈ අසුනෙහි හිඳ හරිබරි ගැසුණාට පසුවය ඔහු ඈ අසල දොර සීරුවෙන් වැසුවේ. අනතුරුව ඔහුද රියැදුරු අසුනට නැග එන්ජිම පණ ගන්වන විට රූපා මුළුතැන් ගෙයි පැත්තෙහි දොරෙන් ඉදිරි මිදුලටආවාය.

"ඔන්න රූපා ඔක්කොම උඹට බාරයි"

මැඩම් එමිලියා කියද්දී,

"දොර වහගෙන හිටපං අමල්බිසෝ" යැයි රූපා තමාට පමණක් ඇසෙන්නට කීවද, සුරලිට එය පැහැදිලිව ඇසුණි.

"මේ ගෑණිට නම් පිස්සු!"යැයි සුරලිට සිතුණි.

'තවත් තනිවෙන දවසක්'

ජනේෂ් සියල්ල කරන්නේ ඔවුන් දෙදෙනාට තිවිහැනහිල්ලේ ඉන්නට තැනක් පිළියෙල කරන්නටයි. දූත් දූත් ඇයට සිතුණේ ජනේෂ් මේ පරිසරයම තෝරා ගන්නට ඇත්තේ කලින් සිටම තමාටත් නොකියා කළ සැලසුමකට අනුව කියායි. සමහරවිට කල් ඇතිව ඔහු තමාගේ සැලසුම සුරලිට කීවානම් සුරලි අකමැති වෙන්නට ඉඩ තිබිණි. ඇත්තෙන්ම, විවාහ වීමෙන් පසු කොහේ ඉන්නවාද මොනවා කරනවාද වැනි කිසිවක් ගැන සුරලි දුර දිග සිතුවේ නැත. ජනේෂ් තමාට ආරක්ෂිත තැනක් පිළියෙල කර දෙනවා කියායි ඈ සිතා සිටියේ.

පියාගේ මරණයෙන් පසු ජනේෂ්ගේ අම්මා දෙවැනි විවාහයක් කර ගත්තාය. ඒ සමාගමයෙන් උපන් දියණිය තවම කුඩා දැරියකි. අම්මා වඩාත් ආදරේ ඒ නංගීට බව ජනේෂ් කියා තිබිණි. තවද අම්මාගේ දෙවැනි සැමියා... ජනේෂ් බාප්පා යැයි ඇමතූ තැනැත්තා, ජනේෂ් හට එතරම් ඇල්මක් දැක්වූවෙකු නොවේ. ජනේෂ් තමාගේම ජීවිතය ස්වෝත්සාහයෙන් දියුණු කර ගන්නට තැත් කළේ පවුලේ වැඩිහිටි කිසිවෙකුගේ අනු දැනුම හෝ අත් උදව් ඇතිව නොවේ.

දැන් ඔහුගේ මුළු ජීවිතයම කැපවුණේ තමා මුළු හිතින්ම ආරය කළ සුරලි වෙනුවෙනි. ඔහු අනුමානයක් නැතිවම ඔවුන් දෙදෙනාට ඉන්නට තැනක් සොයා පිළියෙල කරනවා ඇති.

එහෙත් තමා මේ නුහුරු පරිසරයට හැඩ ගැසෙන්නේ කෙසේද?

එක්වනම සුරලිට අම්මාත්, තාත්තාත් අයියලා දෙදෙනාත් මතක් වී පපුව මැද තෙරපෙන ගතියක් දැනී ඒ තෙරපීම සුසුමක් හා කඳුලක් ලෙසින් පිටමං විය.

අම්මා තමාට කොයි තරම් ආදරය කළාද? තමාට ඕනෑ හැම දෙයක්ම අම්මා අරන් දුන්නා නොවේද...? තමාට ඕනෑ හැම දෙයක්ම? නෑ... නෑ... ජනේෂ්ව හැරෙන්නට අනෙක් හැම දෙයක්ම... සුරලි තමා බඩපිස්සී.... දඟකාරී. අම්මා දැන් නම් පපුව පත්තු වී හඬනවා ඇති.

ෂෙලී සුරලි ගැන තොරතුරක් සොයා ගෙන එන තුරු අම්මාත්, තාත්තාත් නොඉවසිල්ලෙන් බලා ඇති!

"මට සමාවෙන්න අම්මා!" ඈ තමාටම කියා ගත්තාය.

"මට පේනවා! මට පේනවා!" මිදුලේ සිටි රූපා කවුළුව දෙස බලා සිනාසෙමින් කීවාය.

සුරලි කවුළුව ළඟින් ඈත්ව අවුත් ඇඳ මත ඇද වැටුණාය.

ඇයට කිසිදු පිපාසාවක් කුසගින්නක් නොදැනුණි.

ඒ සියල්ල යම්කිසි අතීරණයක යටපත් වී ගොසිණි.

# 13

උදේ අවුරැල්ල මකමින් බටහිරින් පාවී ආ වලාකුල් ගොන්නක් අහස වසාගති.

සුරලි ඇඳෙහි ඇලවීගෙනම කවුළුවෙන් පිටත පෙනෙන වලාකුළු දෙස බැලුවාය. ඇයට දැනුනේ තමාද ආකාසේ පාවී යන ආකාරයකි. වලාකුල් ඇදී ගියේ ඉතාමත් සෙමිනි.

ජනේෂ් කොහේ ඇද්ද?

ඔහු තමාට සියල්ල හෙළි කරන්නේ කවදාද? අද හෝ හෙට? ඔහු මොකක් හෝ කරදරයක පැටලී ඇති හැඩයි. ෂෙලී තමාව සොයනා බව ජනේෂ් දනියි. ජනේෂ් කරන දෙයක් කළ යුත්තේ ෂෙලීව මඟ හරිමිනි. ඔහු නොකියාම පිටව යන්නේ ඒ හෙයිනි.

එහෙනම් තමා මේ කාමරයේ රැඳී සිටීමත් අවදානම් නෙවේද? තමාට තවම මැඩම් එමිලියාව මුහුණට මුණ ගැසුනේ නැත. ඈ තමා මේ කාමරයේ සිටින බවවත් දන්නවාද? ඇතැම් විට එමිලියා මේ ගෙදර වෙන කිසිවක් සොයා බලන්නේවත් නැතිව ඇති.

එක්තරා විදියකට මැඩම් එමිලියා යම්කිසි උමතු තත්‍වයකට පත් එකියකියි සුරලි අනුමාන කළාය. ඈ ජීවත් වන්නේ ඇගේම ලෝකයක... ඈ මවාගත් ලෝකයක... ඇය සැබෑ ලෝකයක් ගැන සිතන්නියක් ලෙස හැසිරෙනවා නොවන්නට පුළුවන.

ඇතැම් විට ඈ සියල්ල දැනගෙන මුනිවත රකිනවාද? ඈ ෂෙලීවත් රවටනවාද? ඈ එවන් දෙයක් කරන්නේ ජනේෂ් හා

එකතු වෙලාද? ජනේෂ් තමාව මෙතැනට ගෙන එන්නට ඇත්තේ කලින් සැලසුම් කළ ආකාරයකට විය නොහැකිද?

එහෙනම්, ජනේෂ් ගේ මනසත් යථාර්තයෙන් බැහැර වූ තත්‍වයක තිබෙන්නට නොහැකිද?

ඔහු සියල්ල සැලසුම් කළේ තමාව මෙතැනට ගෙනැවිත් මේ අසාමාන්‍ය පරිසරයක සිර කරන්නද? එසේ සිර කරමින් තමාගේ ම විකෘති ආශාවක් සපුරා ගන්නද? ඇත්තෙන්ම තමා මධුසමයක් කියා ඔහු සමඟ ආවාට තවම ඇයට ඔහු හා එක රැයක් එක දිගට ගත කරන්නට ලැබී නැත! එය ඉතාම අස්වාභාවික නොවේද?

මෙසේ කල්පනා තර්කයක ගැලුණු සුරලිට පිටත රූපාගේ කටහඬ ඇසිණි. රූපාද තවත් පිස්සු එකියකි'යි ඇයට සිතුණි. රූපා කතා කරන්නේ තමාට එක එල්ලේ නොවේ. ඈ ඇගේම ලෝකයක විකාර කතා කියවයි. අමල් බිසෝ ගැන ගීත කියයි.

ඇය තමාව අමල් බිසෝ කෙනෙකුන් කර ගෙනද? දොර වහගෙන ඉන්නැයි ඈ ඉඟියෙන් කියන්නේ ජනේෂ් ගේ අනු දැනුම ඇතිව විය නොහැකිද? ඔවුන් සියලු දෙනාම එකතුව තමාව මේ තත්‍වයට පත් කරන්නට නොහැකිද? ඔවුන් එයින් ලබන විකෘති තෘප්තිය කුමක්ද?

රූපා ජීවත් වන්නේද ඇගේම මනෝ ලෝකයකයි. ඈ බොහෝ විට කථාකරන්නේ තමාටම මෙනි. ඇතැම් විට ඈ සුරලිට ඇසෙන්නට යමක් කීවත් ඈ එය කියන්නේ සුරලිගෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙන් නොවේ.

රූපාගේ කටහඬ පිටත මිදුලේ කුස්සිය පසු දොර දිසාවෙන් ඉදිරි දොර අතට ගමන් ගන්නාක් සේ ඇසුණි.

"තමුන්ට ඕනැ දෙයක් කරගන්න පුළුවන්" ඈ හඬ නඟා කීවාය. "ඔන්න! කවුරුවත්ම නෑ ගෙදර! මේසෙ උඩ කෑම ඇරලා තියෙනවා... කන කෙනෙකුට කන්න. බඩගිනි කෙනෙක් කනවල්ලා. නැත්තං පිළුං වෙලා අර ඉස්සරහ ප්‍රපාත වලට දාන්න තමයි වෙන්නෙ... ඒවැයි නැතෑ නේක සත්තු... නේක පරාණ!"

එසේ කියමින් රූපා මායා හෝටලය දිසාවට පිය මැන්නාය.

ඇගේ කටහඬ මැකී යත්ම සුරලි සෙමින් සෙමින් ඇඳෙන් නැංගාය.

ගෙදර කවුරුවත් නෑ....

ඇවිද බලන්න කදිම වෙලාව!

සුරලි හෙමින් සීරුවේ කෑම කාමරය අතට ඇවිද ගෙන ගියාය.

කෑම මේසයේ එක් කෙළවරක ලොකු වට්ටියකින් වැසූ කෑම බඳුන් කිහිපයක් පෙනුණි. ඒවා ඇර බලන්නට සුරලි තුළ පිරියක් නොවීය. මේසයේ අනෙක් කෙළවර බාගෙට හිස් කළ කිරි තේ කොප්පයකි. එහි ඉවුර වටා මැස්සන් සෙමින් සෙමින් ගමන් ගන්නවා පෙනුණි.

සුරලි මේසය ළඟින් ඉවත්ව ඉබේම මෙන් විසිත්ත කාමරයට ඇදී ගියාය. ලොකු සෝපාව පිටුපස බිත්තියේ එල්ලා තිබූ රාමු කළ ලොකු පින්තූර දෙක ඈ දුටුවේ මෙවිටයි.

එකක් මැදිවියේ පිරිමියෙකුගේය. අනෙක මැදිවියට ආසන්න වූ ගැහැනියකගේය. මෙතෙක් සුරලි එක එල්ලේ මැඩම් එමිලියාගේ මුහුණ දැක නැති වුනත් අඩක් දුටු මුහුණේ ස්වරූපය මෙ පින්තූරයේ විය. මේ එමිලියා වඩාත් තරුණ කාලයේ ඇගේ පින්තූරයක් විය යුතුය. එහෙම නම් අනෙක් පින්තූරයේ සිටින්නේ ඇගේ සැමියා මුහන්දිරම් ඉලංගකෝන් විය යුතුය. උඩුකය පමණක් පෙනුණ පින්තූරයේ ඔහු රන් බොත්තම් සහිත තද නිල් පැහැ තබායක් හැඳ සිටියේය. එමිලියාගේ ගවුම මරකත මිණක් සේ රතු පැහැයක් වූ අතර ඇගේ දෙකනේ කරාබුද, ගෙල මාලයද සියල්ල ඒ වර්ණයට සමීප වර්ණවත් ගල් සහිත විය.

සුරලි ඒ වුවත් දෙස බලා සිටියාය. එමිලියාගේ දෑසේ ආකර්ෂණයක් විය. මුහන්දිරම් ඉලංගකෝන් ගේ උඩු රැවුලද හිස කෙස්ද සුදු පැහැයකට හැරී තිබුණ අතර, දෑසේ උපැස් යුවලක් විය. ඔහුගේ එක් අතක් උදරය මත රැඳී තිබිණි. ඔහුගේ දෑස්ද එක එල්ලේ බලා සිටින්නාක් මෙනි. ඔහුගේ මුහුණද ඇගේ මුහුණද සුරලිට කලින් දැක පුරුදුවාක් මෙන් නොවේදැයි ඇයට සිතුණි.

ඇයට දෙමාපියන්ද, සොහොයුරන් දෙදෙනාද යළි මතකයට නැගුණි. ඔවුන් නිසැකවම තමාව සොයනවා ඇති. තමා කරදරයක් නැතිව සිටිනා බව ඔවුන්ට පැවසුවොත්... ඔවුන් හිත හදා ගනීවිද?

විසිත්ත කාමරයේ ලොකු සෝපාව පසෙක විදුලි පහනක් තැබූ කුඩා මේසයක් මත පරණ තාලේ දුරකථනයක් තිබිණි.

ගෙදර නොම්මරය මතක බැවින් එයට කතා කරන්නට ඇගේ සිත වලි කෑවේය. දුරකථනය වෙතට ගොස් සාවනාව අතට ගත්තද අනතුරුව ඈ සිත වෙනස් කර ගත්තාය. ජනේෂ් කී යමක් ඇයට සිහිවිය. තමා මේ දුරකථනය උපයෝගී කර ගතහොත් අනෙක් කෙළවරට ඈ සිටින තැන සොයා ගත හැකි වේවි.

එවිට...?!

එවිට පහසුවෙන්ම තාත්තා තමාව රැගෙන යන්නට ෂෙලී විල්සන් වැනි රහස් පරීක්ෂයෙකු මෙතැනට එවාවි. එවිට... තමා පලා යන්නේ කොයිබටද?

ජනේෂ් නැති මොහොතක තාත්තාගේ තැරැව්කාරයින් පැමිණියොත් නිසැකයෙන්ම ඇයව ඔසවා ගෙන හෝ යාවි. එවිට ජනේෂ් ආ විට කුමකින් කුමක් වේවිද?

තමා ජනේෂ්ට පිටුපා යන්නේ මොන හිතකින්ද? ඈ හිඳගත් අසුනෙන් නැගිට්ටේ සාවනාව යළි කථන තොටිල්ල මත රඳවමිනි.

මේ නිවහනේ සියලු සැප පහසුකම් තිබුණත් මෙතැන සිරගෙයක් හෝ එක්ටැම් ගෙයක් වැනිය.

මැඩම් එමිලියා හෝ ෂෙලී අහලක නෙපෙනෙන මේ අවස්ථාවේ ගෙයින් පිටව කොහේ හෝ ගවේෂණයක යන්නට සිතා ඈ ඉදිරි දොරෙන් මිදුලට ආවාය.

අහස කෙමෙන් වලාකුලෙන් ගහණ විය. ඒ අතරින් පෙරී ආ යන්තම් හිරු එළිය පරිසරයම වසා ගෙන ඇත්තේ අලු පැහැයකිනි. ලී වැට වෙතට ආ සුරලි ආපසු හැරී නිවහන දෙස බැලුවාය.

"PSYCHIC

MADAM EMILIA"

කියා ලියූ පුවරුව ඇගේ නෙත ගැටිණි. එහි අකුරුවලට යටින් ඇති අතක සටහන රතු පැහැයකි. එහි කලුවට රේඛා කීපයක් පැහැදිලිව පෙනේ.

මැඩම් එමිලියාගේ අධි ඉන්ද්‍රිය ශක්තියෙන් ඇ තමාව තාත්තාට සොයා පවරා දේවිද? තවම නම් එවැන්නක් සිදුවී නැත.

වැට අසල රෝස පඳුරුවල රතු සහ රෝස පැහැ මල් පිපී කොළ අතු අතරේ කැපී පෙනුණි.

සුරලි වැට අසලට ගොස් සිටගෙන ගෙයින් ඉදිරියේ දුර බැලුවාය. ඇගේ දකුණතට වූ පයින් ගස ළඟින් දිවෙන පාර ඒ අතට මඳක් දුර ගොස් වම් අතට වක් වෙයි.

ගෙදර ඉදිරියෙන් වඩාත් දුර බැලූ විට පෙනෙන්නේ වලක් හෝ ප්‍රපාතයක් වැනි කොටසකි. වම් අතට වක්වූ පාරට වම්පසින් ඇත්තේ ඒ ප්‍රපාතයයි. ඒ මග තවත් ඉදිරියට ගිය විට මේ අතු පාර ප්‍රධාන පාරකට යාවෙයි. කලින් දා ෂෙලීගේ රථය ගමන් ගත්තේ එතැනින් වම්පසටයි. එවිටද ඒ මාර්ගය වැටෙන්නේ අර ප්‍රපාතය වම් පසට දකිමිනි. පාරෙන් අනෙක් පස ගල් කුළු අතරින් කඳු ගැට නැගෙයි. මේ වෙනවිටත් ඒ කඳුගැට මුදුන් වලාකුලෙන් වැසීලාය.

පාර ඒ අතට ගොස් මායා හෝටලය ඉදිරියෙන් මෙන් තවත් කොහේදෝ යන්නේ යෝධ ගස් කඳන් මැදින් අතුරුදහන් වෙමිනි. කලින් දා ෂෙලීත් එමිලියාත් ගමන් ගත්තේ ඒ අතටයි.

එහෙත්, එදා රාත්‍රියේ ජනේෂ් හා සුරලි ඔවුන් දෙදෙනාව දුටු ටැවර් ඔන් ද ග්‍රීන් නම් අවන්හල වෙතට වැහි පොදේ කුඩය යටින් ගමන් ගත්තේ නම් ඒ පැත්තෙන් නොවේ.

මීදුම හා වැස්ස නිසා ඒ වෙලාවේ කොයි අත ගියාදැයි හරි හැටි නිච්චි නැත. ඒත් ඔවුන් එමිලියාගේ නිවහන පසුකර ගෙන ගියේ එතැනින් මඳක් පහළට ඇදෙන වෙනත් පාරකිනි. එහෙම නම් ඒ පාරත්, ෂෙලීගේ රිය ගමන් ගත් පාරත් දෙකම අවන්හල දිසාවට යනවා ඇති. එහෙත් ඒ ප්‍රධාන නගරයක නම් නොවේ. පයින් ගස පසු කර අතුරු පාරෙන් වමට හැරී ප්‍රධාන පාර දිසාවට එන අතර සුරලි වම් පැත්තේ වූ බෑවුම දෙස බැලුවාය. පලින් පල ගල් පර අතරේ නොයකුත් ගස් පඳුරු එහි වැඩී තිබිණි. ඒ

පතුලේ සිහින් දිය දහරාවක් මුමුණමින් ගලා යන හඬද, අතු අග කුරුල්ලන්ගේ කිචි බිචියද ඇසුණි.

පාර අද්දරට ගොස් සුරලි බෑවුමට වඩාත් එබී බැලුවාය. මොහොතකට ඇයට සිතුණේ ගල් කුලු අතරින් පහතට බැස යන්නටයි. ඒ ගැඹුරේ ඇත්තේ මොනවාදැයි සොයන්නට ආ විමසිලිමත් ආවේගයක් ඈ යටපත් කර ගත්තාය. ජනේෂ් ළඟ සිටියානම් නිභයව ඔහුගේ අතින් අල්ලාගෙන ඕනෑ තැනක් ගවේෂණය කරන්නට යන්නට තිබිණි. ජනේෂ් නැති පාළුව යළිත් හද ඉහවහා ගියේය. අද සවස ඔහු පෙරලා එනවා සිකුරුය. දෙදෙනාට නිදහසේ ඉන්නට තැනකුත් සොයාගෙන...

යළිත් ඈ ප්‍රධාන පාර අතට ගමන් කොට තුංමං හන්දියක් වැනි තැනට අවුත් වමතටත් දකුණතටත් බැලුවාය. වම් පස වූයේ හෝටලය අතට යන පාරයි. එහෙම නම් දකුණට ඇත්තේ නගරයට යන පාර විය යුතුයි. මුල්ම රාත්‍රියේ තමාත් ජනේෂුත් මායා හෝටලයට එන්නට ඇත්තේ ඒ පැත්තෙන් විය යුතුයි. මීදුම අතරින් එනවිට කිසිවක් පැහැදිලිව පෙනුණේ නෑ නොවැ...

නොසිතාම ඇගේ දෙපය දකුණු දිසාවට හැරවුණි.

ඇගේ පිටුපසින්ම මෙන් ආ රථයක හඬ ඇයට ඇසුණේ රථය තමා පසුකර ගෙන යන විටයි.

ඒ ටිකෝ් එළවාගෙන ගිය කුඩා 'බට්ටා' ලොරිය. ඔහු හෝටලය දිසාවේ සිට නගරයට යනවා වන්නට ඇත. ඔහු නිකමටවත් ඈ දෙස බැලුවේවත් නැත. තමා පාර දිගේ නිකමට ඇවිද යනවා යැයි ඔහු සිතන්නට ඇත.

නගරය සමහර විට තරමක් ඈත වන්නට පුළුවන. තව මඳක් දුර ඒ අතට ඇවිද ගොස් බලන්නට සුරලිගේ සිත කීවේය.

දෙපස උස් ගස් වැල් විය. පාරෙහි ඒ සෙවන නිසාම වූයේ අඳුරු ගතියකි. තවත් මඳක් දුර යද්දී සරම් කොටයක් හැඳගත් මිනිසෙක් ලණුවක බැඳගත් බල්ලෙකුත් ඇදගෙන ඈ අතට ආවේය. බල්ලා තරමක් ලොකු ඇල්සේෂන් වර්ගයේ බල්ලෙකි. සුරලි දැකීමෙන් දෝ උඟ ගොරවන්නට වුණේය. මිනිසා සුරලි දෙස එක එල්ලේ බැලුවේ නැත.

"ගම්වල අහිංසක ඔතැනි මිනිස්සු" යැයි සුරලිට සිතුණි.

එහෙත් බල්ලා සුරලි අතට එත්ම මහ හඬින් බුරන්නට වූයේය.

"ටොමී! ටොමී!" මිනිසා උගේ කර පටිය තමා අතට ඇද්දේය. "මොකද උඹට මේ වෙලා තියෙන්නෙ? වහපං කට! වහපං කට!" බල්ලා අකමැත්තෙන් මෙන් ස්වාමියාට අවනතව නගුට දෙපා අතර රඳවා ගෙන යළිත් පහත් හඬින් ගොරවන්නට වූයේය.

"ටොමී වරෙන් යන්න... උඹට අදනං මස් කටුවක් දෙන්නෙත් නෑ!" ටොමී කළ වරදට අද නම් දඬුවමක් ලැබෙන්නා සේය. මිනිසා තවත් මොන මොනවාදෝ කියමින් ටොමීවත් ඇදගෙන හෝටලය දිසාවට ගමන් ගත්තේය.

සුරලි අනෙක් දිසාවට, නගරය ඇතැයි සිතූ අතට ඇවිද ගියාය. නගරය කෙතරම් දුර විය හැකි දැයි අනුමානයක්වත් ඈ තුළ නොවීය.

අලුත්ම පන්නයේ සුදු පැහැ මෝටර් රථයක් ඈ අතට එනු පෙනෙත්ම ඈ යන්තම් හිස ඔසවා රියදුරා දෙස බලා බිම බලා ගත්තේ, බැරිවෙලාවත්, තමාව දන්න කෙනෙක්දෝයි සිතමිනි. රියැදුරා අව් කණ්ණාඩි පැළඳ සිටි බැවින් සුරලිට හඳුනාගත හැකි බවක් නොපෙනිණි. තවද ඔහු රිය ඈ ළඟින් ඈ පසුකරගෙන ගමන් ගත්තේ පාර අයිනටම ළං වෙමින් උවමනාවට වඩා ඇයටත් ළංවෙමිනි.

"මළ සමයමක්නෙ!" ඈ සිතුවාය.

# 14

කෙමෙන් බෑවුම්ව ගිය පාර යළිත් නැග්මකට අවතීර්ණ විය. සුරලි සෙමින් සෙමින් ඇවිද ගිය නිසා වෙහෙසක් නම් නොදැනුණි.

තමා පසු කර ගිය රථය ගැන ඇ සිතුවාය. ඒ රියදුරා තමාට ඉතාම ළංව යමින් රිය හැසිරවූයේ තමාව බය කරන්නද? ඒ නැත්තම් සැබවින්ම තමාව නුදුටු නිසාද? තවද මේ වඩාත් අව්රස්මිය නැති වෙලාවේ ඔහු අව්කන්ණාඩි පැළඳ සිටියේ ඇයි? සමහර විට ඒ අලුත් පන්නයේ උපැස් යුවලක් වෙන්නට ඇති. අව්වට අනුව වර්ණය වෙනස් වෙන උපැස් යුවලක් ... සමහර විට තමා වැනි කෙනෙක් මේ පාර දිගේ පයින් ඇවිද යාවි යැයි ඒ මිනිසා නිකමටවත් සිතන්නට නැතුව ඇති. ඔහු එතරම් පාර අයිනෙන් ගමන් ගත්තේ සිතා මතා නොවිය හැකිය. අනෙක ඔහු නොසිතූ ලෙස සුරලිව දකින්නට ඇත්තේ ළඟටම ආවිට විය හැකිය.

සුරලි තවත් අයින් වුනේ නැත්නම් රියේ හැපෙන්නට පවා ඉඩ තිබිණි. මිනිසා කිසිම සමාවක් නොගෙන ගියේ, තමා අතින් වූ වරද දැන දැනම විය යුතුය.

තව දුරක් ඇවිද ගිය සුරලිට තමාට පිටුපිසන් එන රථයක 'ගඩ ගඩ' හඬක් ඇසුණෙන් ඇ ආපසු හැරී බැලුවාය.

ත්‍රිරෝද රථයක්...

කන්ද නැග්ම නිසා රථය ඇ අතට ආවේ සෙමිනි. රියදුරා හැරෙන්නට එහි වෙන කිසිවෙකුත් නොසිටි නිසා ඇ රියට අත දිගු කළාය.

ඇ අත මුදල් නොතිබුණත් ඇ රියට තැංගේ රථය නැවැත්වූ නිසාය.

"මං අතේ සල්ලි නම් නැ. මං මේ නිකං ඇවිද යන ගමන්" ඇ රියදුරාට ඇසෙන්නට කීවාය.

"කමක් නැ නෝනා... මං මේ පැත්තට කොහොමත් යන එකනෙ. හැබැයි මං ටවුමටම නං යන්නෙ නැ..."

"ටවුමට කොච්චර දුරද?"

"අපෝ තව කිලෝ මීටර දෙකක් විතර"

"කමක් නැ මං ටිකක් දුර ගිහින් බහින්නං"

කන්ද නැග්ම බැවින් රථයේ ගමන තවත් හෙමින් විය.

"මේක සර්විස් එකට දාන්නත් ඕනැ" ඔහු තව දුරටත් කථා කළේ නැත.

තවත් මදක් තැන් ගිය ඔහු "මං මෙතනින් දකුණට පල්ලෙහාට යනවා"යි කීය.

"මං බහින්නං... බොහොම ස්තුතියි"කී සුරලි රියෙන් බැස්සාය.

රියදුරා දකුණට වූ වංගුවකින් පල්ලම් බැස්සේය.

"මේ ප්‍රපාතෙත් ගෙවල් ඇද්ද?"යි ඇයට සිතුණි.

නගරයට කිලෝ මීටර් දෙකක්! ඒ තරම් දුරක් ගියොත් තමා ආපසු එන්නටත් ඕනැය. අධෛර්‍යමත් සිතෙන් සුරලි ආපසු හැරුණාය.

එමිලියාගේ නිවස්නේ කාමරයට වැදී නිදාගන්නට ඇයට සිත් දුන්නේ නැත. ඇතැම් විට රූපා ගෙදර කොතැනක හෝ ඇති. ඇ සමග කතා බහක යෙදෙන්නට පුළුවන. එහෙත් රූපා නූගත්... නොමේරූ ගැහැනියකි. රූපා සමග මොනවා කතා කරන්නද? අඩුම තරමින් ඇ කියන දෙයක් අසා හිඳින්නට පුළුවන. ඇ සමහර විට මායා හෝටලයේ තවත් නොදන්නා ඉතිහාසයක් හෙළි කරාවි.

මෙවන් තීරණයකින් සුරලි පෙරලා එන්නට හැරුණාය.

ඈත තියාම තමා අතට එන සුදු පැහැ රථය ඇයට පෙනුණි. මේ වතාවේත් ඒ කලු කණ්ණාඩිකාරයා තමාව බය කරන්නට මෙන් ඇඟ අතට කැපුවොත්!...

සුරලි පාර අයිනෙන් කැලය අතට පැන පඳුරු ගොල්ලක් පසුපස සැඟවුණාය. රථය ඈ පසුකර ගෙන ගියේ අධි වේගයෙනි. එහි හඬ පවා බයංකාර විය.

ඒ හඬ නැසී යන තෙක්ම සුරලි සැඟවුණ තැනම සැඟවී සිටියාය.

ඈ නිවහනට ළං වෙන විට වලාකුල් ගහණ අහසේ හිරු සැඟවී අළු අඳුර වැඩි විය. රූපා පෙනෙන අහලක නොවූවාය.

අඩමානයක් නැතිව ඈ මායා හෝටලයට යන්නට ඇති. කාමරයට වැදී යළි නිදනවා වෙනුවට සුරලි ගල්පර අතරින් සෙමින් කඳු ගැටය නගිමින් හෝටලය අතට පිය මැන්නාය.

ඇයව බලාපොරොත්තුවෙන් මෙන් ඇයට ඉහළින් කඳු ගැටයේ ඉවුරේ රූපා සිටගෙන සිටියේ අතකින් ගත් ඉදලකුත් ඇතිවයි. සුරලිට සිහිපත් වුනේ කුඩා කල ළමා පොතක චිත්‍රයක දුටු මායාකාරියකි. ඒ කථාවේ මායාකාරිය කොස්සක් අතින් ගෙන සිටියාය. කථාවට අනුව මායාකාරිය ගමන් ගත්තේ කොස්සෙහි නැගී ගෙනයි.

"හා හා! මට පේනවා! මට පේනවා! කන්ද නැගලා එනවා මට පේනවා! මෙහෙට වරෙන් අමල් බිසෝ... මෙහෙට වරෙන් අමල් බිසෝ!" තාලයකට මෙන් මේ පිස්සු ගැහැනිය හඬ ගා කියන්නේ සතුටකිනි.

"මම අමල් බිසෝ නෙමෙයි. මගේ නම සුරලි!"යැයි කියන්නට සිතුණත් සුරලි නිහඬවත රැක්කාය.

වඩාත් වෙහෙසකින් තොරව ඇයට මුදුනට ළඟා වීමට හැකි විය.

මේ පැත්තේ මිදුලෙහි වැටී තිබුනු වියලි කොළ රොඩු බොඩු සියල්ල, දකුණු පසට වෙන්නට වූ වලක් වෙතට අතු ගාමින් රූපා සිටයේ. ඇය යළිත් අතුගාන අතරම කථා කරන්නට වුනාය.

"මෙච්චා කරන්න ඉතිං වෙන කවුද ඉන්නෙ මං ඇරෙන්න? අම්මත් ගියා අප්පත් ගියා. මුතු අමුණන වැල් ගේන්න. මුතු පොකුරු. පොකුරු අරන් එන්න"

"මේ හෝටලේට මිනිස්සු එනවද රූපා?" සුරලි ඇසුවේ ගොඩනැගිල්ලේ ඉදිරි දොරටුවට වම් පසින් වූ සිමෙන්ති බංකුවක හිඳ ගනිමිනි. මහ හඬින් 'කෑස් කෑස්' ගෑ ඉදලෙන් මිදුල අතුගෑ රූපාට සුරලිගේ ප්‍රශ්නය ඇසුණේවත් නැත.

"මේ ගෑනිට මං හිටියත් එකයි නැතත් එකයි" සුරලි ඒ වදන් කියාගත්තේ තමාටමයි.

සියලු කොළ රොඩු බොඩු වත්ත කෙළවර වලට අතු ගෑ රූපා ඉදල අසල බිම හෙලා ඉණ තුරෙන් ගිණි පෙට්ටියක් ගත්තාය.

"මේ සැරේ පුච්ච ගන්නෙ නැතුව කරපං රූපා!" රූපා කථා කරගත්තේ තමාටමයි "මේ සැරේ පුච්ච ගන්න හෙම එපා" ඈ ගිනි කූරක් ගෙන පෙට්ටිය පැත්තේ ගටා දල්වා කොළ අතරට හෙලුවාය. එයින් ගිණි දැල්ලක් ඇවිලුණේ නැත. ඈ මෙවර වලෙන්ම ඇදගත් වියලි පරණලා පතකට ගින්න අවුලුවා එය කොළ අතරේ යට සැඟවූවාය. මඳ මොහොතකින් දුම් විසිරෙමින් ගින්නක් ඇවිලෙන්නට විය.

මඳ වේලාවක් ගිනි දැල් දෙස දෑස් දල්වා බලා සිටි රූපා සුරලි හිඳ සිටි බංකුව වෙත පැමිණ එහි කෙළවරක හිඳ ගත්තාය. සුරලි ඇයට තව මඳක් ඉඩ දෙන්නට ඈත් වුනාය.

"දැන් ටුවරිස්ලා එන්නෙ නැද්ද?" සුරලි ඇසුවත්, රූපා. එක එල්ලේ පිළිතුරක් නොදී නැගිට...

"තැන්ක් යු ෆොර් කමින් ටු අවර් මායා හොටෙල්" කියා සුරලි අතට හිස නමා ආචාරයක් කළාය.

සුරලිට සිනා නොවී නොහැකි විය.

අනතුරුව රූපා හැසිරුණේ සංචාරකයින් හට මේ ඉතිහාසය කියන මාර්ග උපදේශිකාවක් ලෙසිණි. "මේ හෝටලය ගොඩ නැගුවේ එකදාස් නමසිය හැත්තෑ පහේ" ඈ අතක් දිගු කරමින් කීවාය. "නයින්ටීන් සෙවන්ටි ෆයිව්"

"මේ හෝටලය අයිති මැඩම් එමිලියාට සහ මුහන්දිරම් ජේ. ඉලංගකෝන් මහත්මයාට. ඔවුන්ගේ එකම දියණිය... එකම දියණිය ජීවත්වන්නේ ඉංග්ලන්ඩ් වල... හලෝ හව් ආර් යූ? විෂ් බිෂ්... බ්ලොක් බ්ලොක්... ලන්ඩන් බ්‍රිජ් ඉස් ෆෝලිංග් ඩවුන්, මයි ෆෙයාර් ලේඩි"

සුරලි මේ රංගනය නරඹමින් සිනාසුණාය.

"මේ හෝටලයට නම දැම්මේ මහාමායා හොටෙල් කියලා" එසේ කියමින් රූපා අතක් ඔසවා වමේ සිට දකුණට ගෙන ගියාය. "මහා මායා හොටෙල්.. බෝධිසත්වයින්ගෙ මෑණියන්ගෙ නම. සුද්ධෝදන රජුන්ගේ බිසවගේ නම... මහා මායා.. ලොකු බෝඩ් එක ගහල තිබුණෙ.. උඩින්ම මහාමායා හොටෙල්. මොකක් හරි වස්දොස් වැදිලද මන්දා දවසක් හවස අකුණක් ගහලා මේ බෝඩ් එක හරියට මහා මායා කියන අකුරු අතරින් ගිනි අරන් වෙන්වුනා!" ඈ එය අත් දෙකින්ම අභිනයකින් පෙන්වූවාය.

"ඊට පස්සෙ මහ... කියන කෑල්ල පිච්චුන තැනින් අරන්දාලා මේක නිකංම මායා හෝටලය උනා. ඒ බෝඩ් ලෑල්ල ලියල තිබුණෙ ඉංග්‍රීසියෙන්"

සුරලි අත්පුඩි ගැසුවද එය නෑසුනා සේ රූපා දිගටම කථා කරගෙන ගියාය.

"මේක ඉතින් මායා හෝටලයක්ම තමයි. මම නැත්තං මෙතැන මෙලහකට කැලේ වැවිලා. මම තමයි ඉතිං අන්තිමට ඉතුරු වෙන්නෙ"

ඈ මෙසේ කියවාගෙන යද්දී සුරලි නිකමට දකුණතට හිස හරවා ඉදිරි දොරටුව දෙස බැලුවාය.

එතැන සිටගෙන සිටියේ, මායා හෝටලයේ සේවකයා ලෙස මුලින්ම සුරලිව හා ජනේෂ්ව පිළිගත් ජස්ටින්ය. ඔහු දොරකඩ සිට රූපාට යමක් කියන්නට තැත් කළත් රූපාට හෝ සුරලිට ඔහු කී කිසිවක් පැහැදිලි නොවීය. අන්තිමේදී ඔහු අසහනයෙන් මෙන් එසවූ සුරත යළි පහතට වේගයෙන් හෙලා තවත් යමක් මුමුණමින් හෝටල් ශාලාව ඇතුළට ගියේය. ඔහු තමාව දුටුවාද කියාත් සුරලි තුළ සැකයක් ඇතිවිය. ඔහු සිටියේ රූපා කෙරෙහි කෝපයකිනි.

"රූපා!"මෙවර සුරලි කීවද රූපා එය නෑසුණාක් සේ ඉදලත් ඔසවා ගෙන ගිනි මැලය වෙතට ගොස් ඉදලෙන් ගිනි දැල්වලට පවන් සලන්නට වූනාය. සුරලිට දුන් පෙනුණේ මේ උමතු මිටි ගැහැණියගේ පසු පසයි. ඇ ඉදිරියේ දැල්වුණු ගිණි දැල්වල රතු, කහ, තැඹිලි ආලෝකය නිසා ඇ පෙණුනේ ඡායාවක් හෝ අඳුරු සෙවනැල්ලක් ලෙසිණි. ඇ ගිණිමැලය දෙස බලා එයට ඉදලෙන් පවන් ගසමින් මොන මොනවාදෝ කියෙව්වාය. සුරලිට දැනුණේ ඇ අපායක ගිනි ජාලා මැද සිටින ආකාරයකි. ඇත්තෙන්ම රූපා මවා ගෙන තිබෙන්නේ නිරයක්ම නොවේද?

එක්වනම රූපා ඉදල පසෙකට විසි කර කඳු ගැටය බසින්නට වූවාය. අවට කෙමෙන් අඳුර ගොනුවෙන බැවින් සුරලිද රූපා පස්සෙන්ම ඇවිද ගියේ රාත්‍රියේ මෙතැන තනිවිය නොහැකි බැවිනි.

කඳු පාමුලට මෙන් ආ ඇය හැරී බලද්දී හෝටල් දොරකඩ ගොම්මන් අඳුරේ සිටගෙන සිටින ජස්ටින්ව ඇයට දැක ගත හැකිවිය. සුරලි තමාට ඉදිරියෙන් වේගයෙන් ඇවිද ගිය රූපාට නම හඬගා කථා කළ ද ඇ නෑසුණ ගානටම එමිලියාගේ කොටේජ් එක අතටම ගියාය.

ඉදිරි දොර ඉහළින් විදුලි පහනක් දැල්වෙමින් තිබුණි. රූපා දොර හැරගෙන ගෙතුළට ගොස් විසිත්ත කාමරයේ පහනක් දල්වමින් කෑම කාමරය පසු කරගෙන කුස්සිය අතට ගිය අතරේ ඇ අනුව ගෙතුළට ආ සුරලී තමා අරක්ගත් නිදන කාමරයට වැදුණාය.

දැඩි වෙහෙසක් දැනුනෙන් ඇ පහනක් නොදල්වාම ඇඳ මත ඇද වැටුණේ ජනේෂ් ගැන සිතමිනි.

"ඔහු කොහේද? අද රාත්‍රියේ ඔහු තමා සොයා ඒවිද? ඔහු දෙදෙනාටම ඉන්නට තැනක් පිලියෙල කර ගත්තාද?"

මෙවැනි පිළිතුරු රහිත ප්‍රශ්න වැලක පැටලී සුරලි දෙනෙත් පියා නින්දක වැටුණාය.

ඇ අවදි වූයේ කට හඬක් අසමිනි.

කුස්සියේ ඉදුණු කෑම සුවඳ මේ නිදන කාමරයටත් රිංගා ගෙන තිබිනි. කාමරය තවමත් අඳුරේ වුවද පිටත සාලයේ පහන්

දූල් වී තිබිණි. සෙමින් නැගිට ගත් සුරලි ඇඳ පාමුල වූ ඩ්‍රෙසිං ගවුම දවටාගෙන ලාච්චු මේසය වෙතට ආවාය. කැඩපතෙහි පිළිබුව පැහැදිලි නොවීය. එහෙත් මේ අඩ අඳුරේ මේසය මත වූ වැස්මෙන් වැසූ කෑම පිඟානක් ඇයට දැකිය හැකිවිය. කෑම සුවඳ වුවද ඇ තුළ පිරියක් නොවීය. ඒ අසලම වූ වතුර වීදුරුවෙන් ඇ උගුරක් දෙකක් පානය කළාය.

රූපා කෑම බඳුන තබා යන්නට ඇති. වෙලාව කීයදැයි සුරලි නොදත්තාය.

සාලයේ හිඳගෙන කතා කරන්නේ මැඩම් එමිලියා හා ෂෙලී විල්සන් බව ඇයට කට හඬවල් වලින් පැහැදිලි විය. ඇ කෑම කාමරයේ බිත්ති අද්දරට ගොස් ඉස්කිරිමේ හිඩසකින් ඔවුන් දෙස හොරෙන් එබී බැලුවාය.

"අද ඉතින් රෑ ඉඳලා යන්න" එමිලියා ෂෙලීට කීවාය. "දැන් මේ රෑ තනි පංගලමේ යන්න ඕන නෑ"

"මං හිතුවෙ ඊයෙම යන්න. ඒ උනත්..."

"මොකක් හරි විදියක් බලමු. මං කාමරේ ලෑස්ති කරල දෙන්නං" කී එමිලියා "රූපා! රූපා!" යැයි කෑ ගෑවාය.

"ඕ!" කියාගෙන රූපා කුස්සියේ සිට සාලයට දුවගියේ අඩ අඳුරේ බිත්තිය අසල සිටි සුරලිවත් නොදකිමිනි.

"අර වම් පැත්තෙ කාමරේ මේ මහත්තයට ලෑස්ති කරල දියන් කෙල්ලෙ..."

"හොඳයි මැඩම්"

රූපා එමිලියාගෙන් වම්පසට වූ බිත්තියක් කෙළවර කොරිඩෝවෙන් නොපෙනී ගියාය.

"මං ෂෙලීටත් සාස්තරයක් කියන්නං"

"අත බලලද?"

"නෑ අත බලලා නෙමෙයි. හිත බලලා. ඇඟ ඩිංගක් හෝදගෙන ඇඳුම් මාරු කරගෙන එන්න. මං මේසෙ ලෑස්ති කරන්නං... රූපා කාමරෙත් ලෑස්තිකරල දේවි"

"මොනවට කරදර වෙනවද?" ෂෙලී කීය.

"අදත් මීදුම ගලනව. මේ අවේලාවෙ නොයන එක හොඳයි" එමිලියා කීවාය.

"යමු එන්න මං නාන කාමරේ පෙන්වන්න"

සුරලි සිතුවේ ඔවුන් තමා සිටි අතට ඒවි කියායි. එහෙත් දෙදෙනා අනෙක් අතට, රූපා ගිය අතටම ඇවිද ගියහ.

සුරලි යළිත් තම කාමරයට වැදුණාය. එහෙමනම් අද රාත්‍රියේ ෂෙලී මෙහි නතර වේවි. තමා මේ පැත්තේ කාමරයේ සිටින බවවත් ඔහු නොදනියි. තමා හිඳින බව එමිලියාවත් දන්නවාද? තවම සුරලිට එමිලියාව මුහුණට මුණ ගැසී නැත. මේ හැංගි මුත්තම් සෙල්ලම තව දින කීපයක් කරන්නද? අද රාත්‍රී ජනේෂ් පෙරලා ආවොත්... ෂෙලීට ජනේෂ්ව මුණ ගැසේවිද? සුරලි හට ජනේෂ්ට අනතුරු හැඟවීමේ පණිවිඩයක් යවන්නවත් ක්‍රමයක් නොවේ. ජනේෂ් අද රාත්‍රියේද නො එන්නේ ෂෙලී මෙහි රැඳෙන බව යම්කිසි අයුරකින් හෝ දැනගත් නිසාද? ජනේෂ්ට පණිවිඩ දෙන්නේ රූපා හෝ ජස්ටින් විය නොහැකිද?

අඩ අඳුරේම සුරලි කාමරයේ ලොකු කවුළුව වෙතට ආවාය. අවට අඳුර ගලා තිබිණි. සිහින් තුෂාරයක් වැටෙමින් කවුළුවේ වීදුරු තහඩු මත්තේ පිටත තුහින පටලයක් තවරා තිබේ. දුහුල් සුදු කවුළු තිර පට මෑත් කරමින් පිටත බලද්දී රූපා ඒ අසලින් ඉවතට දුවයනු සුරලිට යන්තමට පෙනුණි.

"මළ සමයමක්" සුරලිට කියැවිණි.

"මේ ගෑණි හැම තැනම හොල්මන් කරනවනෙ!"

වීදුරු කවුළුවේ තුෂර පටලය මත්තේ අතැඟිල්ලකින් ලියූ අකුරු තුන ලොකුවට පැහැදිලිව පෙනුණි.

"ය -න් - න"

එහි ලියා තිබිණි.

යන්න? මේ ගෑණි යන්න කියන්නේ මටද? ඒ ඇයි? තරහටද? නැත්නම් මට අනතුරු හැඟවීමකටද?

යන්න?

කොහෙට කියා යන්නද?

කොහේවත් යන්න නම්... ජනේෂ් රථය රැගෙන පෙරලා පැමිණිය යුතුය.

රූපා සොයා ගොස් මේ ගැන විමසුවොත් ඒ උමතු ගැහැනිය කුමක් කියාවිද? ඈ කියන කිසිවක් විශ්වාස කළ හැකිද?

ජස්ටින් නම් වයස්ගත මෙහෙකරුවා නම් සැබෑ සිහි බුද්ධිය ඇත්තෙකු ලෙසිනි පෙනුණේ. එහෙත් දැන් ඔහු සොයන්නට නම් තමා මේ තුෂාර මීදුම් ගලන අඳුරේ මායා හෝටලයටම යා යුතුය.

තමාට මැඩම් එමිලියාත් හමුවී එක එල්ලේ කතා කළ නොහැක්කේ ෂෙලී සිටින බැවිනි. හෙට උදෑසන ෂෙලී පිටව ගිය පසු තමාට එමිලියා ඉදිරියේ හිඳ සියල්ල කිව හැකි නොවේද? එහෙත්... එවිට එමිලියා ෂෙලීට කියාවි. ෂෙලී සුරලිගේ තාත්තාට සියල්ල හෙළි කරාවි. එතකොට ජනේෂ්? ජනේෂ් අද රාත්‍රියේ හෝ හෙට කොයි වේලේ හෝ ආවේ නැතිනම්...? එයට පිළිතුරක් නොවීය.

යළිත් ඇඳේ වැතිරුණ සුරලි පියවි සිහියට ආවේ කෑම කාමරය දෙසින් ඇසුණ කට හඬවල් අසමිනි.

ෂෙලීත්, එමිලියාත් මේසය අසල හිඳ සිටියහ. දොරෙන් එබී බැලූ සුරලිට පෙනුණේ ෂෙලීගේ හිස පිටුපස හා දෙඋර පමණි. එමිලියාගේ මුහුනෙහි අඩක් සුරලිට දැකිය හැකි විය.

දෙදෙනා ඉදිරියෙන් දැල්වෙන ඉටිපන්දමක් විය. කෑම කාමරය එළිය වුනේ ඒ මන්දාලෝකයෙන් පමණි.

එමිලියා දැල්වෙන ඉටිපහන් දැල්ල දෙස නෙත් හයා බලා සිටියාය. ඇගේ කලු ඉංගිරියා මත පරාවර්තනය වූ එළිය කුඩා මිණි කැට දෙකක් සේ රශ්මියකින් දිලිසුණි.

"ඕනෑම දෙයක් මං කිව්වට කමක් නැහැ නේද?" මඳ වේලාවක් දෑස් හයා සිටි එමිලියා ගැඹුරු පහත් හඬකින් ඇසුවාය.

"කමක් නැහැ... කියන්න... ඔට්ටුයි" ෂෙලීද කතා කළේ රහසින් මෙනි.

"දන්නවනෙ අපි වටේ නොයකුත් දෙනා රැස් වෙලා ඉන්නවා... සමහර උදවිය ඉස්සරහට එන්න පොරකනවා අපේම නෑදෑ උදවිය මළගිය ප්‍රණකාරයො. ආයෙ ඉපදිලා නැති අය මෙ භූත ලෝකයේ බලා ඉන්නවා යමක් කියන්න. පින් ගන්න"

"ඔව්"

"ආයෙත් ඉපදිලා නම් අපට ඒ අයව පේන්නෙ නැතුව යනවා. තවත් අය ආයෙත් ඉපදිලා නැත්නම් හීනෙත් හිටන් පේනවා. ආයෙත් ඉපදුනාට පස්සෙ හීනවල පෙනී හිටින්නෙ නෑ"

"ඇත්තට?"

"බොහොම වෙලාවට"

"ඉතින් කොච්චර කල් කෙනෙක් ඔය ඉපදෙන්නෙ නැතුව භූත ලෝකවල ඉන්නවද?"

"එක එක කර්මානුරූපව තමයි. සමහර උදවිය අවුරුදු සිය ගණන් පාවි පාවි ඉන්නවා"

"ගන්ධබ්බ කියන්නෙ ඒක නේද?"

"ඔව් එහෙම කීවැකි."

"එහෙම නං සමහරු කියනවනෙ මැරිච්ච ගමන් ආයෙ තව තැනක ඉපදෙනවා කියලා?"

"ඒ කියන්නෙ කාගෙ හරි බඩක ඒ වෙලාවෙම උපදිනව කියන එක නෙමෙයි. එහෙම නං ඉතිං දෙමාපියො හැම තිස්සෙම ලෑස්ති වෙලා ඉන්න ඕනෑ මැරෙන අය, මැරිච්ච අය, තව බඩක පිළිසිඳ ගන්න"කී එමිලියා සිනාසුණාය.

"එහෙනම්?"

"ඒ කියන්නෙ මැරුණම කෙනෙක් තව තැනක කොහේ හරි ඉන්නවා කියන එකයි. මෙතන නැත්තං අතන ඉන්නවා. එහෙම "නැති" තැනක් නෑ. මැරෙන තැනැත්තාගේ විඥාණය ඒ ශරීරයෙන් ඉවත් වුණ ගමන් තව කොහේ හෝ තැනක ඉන්නවාමයි. ඒක ගන්ධබ්බ අවදියක, හෝ භූත ලෝකයක වෙන්න පුළුවන්. දිව්‍ය ලෝකයක, අපායක, තිරිසන් අපායක වෙන්න පුළුවන්"

"මගේ කවුරුවත් මෙතැන ඇවිත් ඉන්නවද?" ෂෙලී ඇසූ විට,

"ඉන්න බලන්න" කියා එමිලියා යළිත් තිහඬව පහන් දැල්ලට දෑස් යොමු කළාය.

"දෙතුන් දෙනෙක්ම කතා කරන්න බලන් ඉන්නවා. වඩාත්ම බලගතු ඥාතියෙක් තමයි මේ ඉස්සරහට එන්නෙ... වයසක ගැහැණු කෙනෙක්. පුතා, මේ පුතා මගේ මුණුබුරා කියනවා."

එමිලියා කියත්ම "මගේ ආච්චි මම්මා!" යැයි ෂෙලී විශ්මයෙන් කීවේය.

"තවමත් ආච්චි අම්මාගේ ආරක්ෂාව තියෙනවා. කරන කටයුතුවලට මඟ පෙන්වන්න උදව් කරනවා" එක්වනම එමිලියාගේ කටහඬ පවා වෙනස් වෙව්ලන ස්වරයක් ගත්තේය.

"පුතා... ෂෙලී... ඔයා ඔය කරන කටයුතු සේරම සාර්ථක වෙනවා. ඔයාට තව මහන්සි වෙච් එයාලව හොයා ගන්න. ඒ උනාට ඔයා ආපු වැඩේ අත අරින කෙනෙක් නෙමෙයිනෙ..."

"මට ඒ ඉන්න තැන කියන්න බැරිද ආච්චි මම්මේ?" ෂෙලීගේ කටහඬට උනන්දුවක් එක්විය.

"මට එහෙම කියන්න බෑ පුතේ. ඒ එයාලගෙ දෛවය ඔයාගෙ දෛවය හරස් වෙන තැනක් තියෙනවා. මට ඒවට ඇඟිලි ගහන්න වරම් නෑ."

එමිලියාගේ වෙව්ලන කට හඬත් සමඟ අධිවේගයෙන් ස්පන්දනය වෙන්නට වූ හෘද රිද්මයක්, සුරලිගේ පපුවෙන් කෙමෙන් ඈත් වෙන්නාක් සේ ඇසූ පුවතත් සමඟ අඩුවෙන්නට විය.

"තව ටිකෙන් මේ භූතයා මං ඉන්න තැනත් හෙළි කරනවා" සුරලිට සිතුණි. "හොඳ වෙලාවට මේ භූතයට එච්චර බලයක් නෑ මට ඇඟිල්ල දික් කරල පෙන්වන්න, මගෙත් ආරක්සාවට කවුරු හරි ඉන්නවා ඇතිනෙ. තව ටිකෙන් ෂෙලී මං ඉන්න තැන අහල දැන ගන්නවා!"

සුරලිට සිතුණේ බැරිවෙලාවත් එමිලියාට අවේශ වූ ෂෙලීගේ ආච්චි මම්මා සුරලි සිටින තැන හෙළි කරානම්, තමා හිඳින

කාමර කවුළුවෙන් පිටතට පැන කොහේ හෝ අඳුරු පඳුරු අතරේ සැඟවෙන්නටයි.

එහෙත් දැන් ඇයට එසේ කරන්නට සිතුණේ නැත.

මඳ වෙලාවකට දෙකන් අගුල් වැටී ගියෙන් සුරලිට එමිලියා කී කිසිවක් නෑසී ගියේය. ඇ දුටුවේ එමිලියාගේ කට සෙලවෙනවා පමණි. ඇගේ සුසුමින් ඉටිපන්දම් දැල්ල නිලියකගේ රන්, කහ සලුවක් සේ දඟර රැගුමක් පෑවේය.

සුරලිට යළිත් සියල්ල ඇසෙන විට එමිලියා දෑත් එක්කොට වැඳගෙන සිටියාය. ඇගේ දෑස ටික වේලාවකට වැසී තිබුණ අතර ෂෙලී නිසලව ගල් ගැසුණාක් මෙන් හිඳ ගෙනම සිටියේය.

ඔරලෝසුවක කණිසමක් වැදුණද එය හෝරාවේ කාලක් හෝ බාගයක් දැනුම් දෙන හඬක් පමණක් විය.

"මට බාත්රූම් එකට යන්න ඕනෑ" ෂෙලී කියූ වදන් නම් සුරලිට පැහැදිලිව ඇසුණි.

"ඔය පැත්තෙ කාමරේ බාත්රූම් එකට යන්නකො" එමිලියා අතක් දිගු කළේ සුරලි සිටි පැත්තටයි.

දැන් ෂෙලී තමා සිටින කාමරයට විත් එහි නාන කාමරය පාවිච්චි කරන බව සුරලිට පැහැදිලි විය.

"එච්චර ඉතින් පාවිච්චි වෙන්නෙ නම් නැහැ... රූපා සේරම පුළුවන් හැටියට ක්ලීන් කරල ඇත්තේ."

"කමක් නැහැ" කියමින් ෂෙලී පුටුව පසු පසට තල්ලු කරගෙන නැගිටිද්දී සුරලි කාමර දොරෙන් ඇතුළට රිංගුවේ වේගයෙන් සැලෙන හදෙනි.

# 15

ෂෙලී කාමරයට එන්නට පෙර සුරලි ලොකු කවුළුව අඩක් හැරගෙන පිටතට පැන්නාය. එතන පඳුරු ගොල්ල අතරේ අඳුරක් විය.

ඈ යන්තමට කවුළුවේ පහත කෙළවරෙන් හිස ඔසොවා කාමරය තුළට එබී බැලුවාය.

ෂෙලී අඳුරේම ඇඳ අසලින් ඇවිද ගොස් නාන කාමරය තුළ වූ විදුලි පහනක් දැල්වූවේය. ඔහු නාන කාමර දොර වැසුවේ නැත. ඔහු කොමෝඩය ඉදිරියේ සිටගත් විට සුරලිට ඔහුගේ පිටෙහි අඩක් පමණ දැක ගත හැකිවිය. ඔහු සුළු දිය මුදා හරින හඬ සුරලිට පැහැදිලිව ඇසුණි. අනතුරුව ඔහු කොමෝඩ ටැංකියේ වතුර මුදා ගලන්නට සැලැස්වූ හඬද, ඔහු සින්කු බේසම වෙත දැත් සෝදන හඬද සුරලි අසා සිටියාය.

තමා මධු සමයකට ඇවිත් මේ මොන මල සමයමක් බලා ඉන්නවාද? කියාත් ඇයට සිතුණි.

නාන කාමරයේ පහන තිවූ ෂෙලී අඩ අඳුරු කාමරය ඔස්සේ දුන් ඇවිද ආවේ සුරලි සැඟවී බලා සිටි පැත්තටයි. ඔහු කවුළුවෙන් පිටත බලද්දී සුරලි එතැනම පඳුරු අතරේ පහත් වූනාය.

ෂෙලී මඳ වේලාවක් එසේ කවුළුවෙන් පිටත බලා සිටියේ යමක් විපරම් කරන්නාක් මෙනි.

අනතුරුව ඔහු තම ජංගම දුරකථනය කලිසම් සාක්කුවෙන් ගෙන නොම්මර කීපයක් එබුවේය.

"හලෝ මිස්ට මද්දුමාරච්චි?"

ෂෙලී කථා කරන්නේ සුරලිගේ තාත්තාට?

"ඔව් මිස්ට මද්දුමාරච්චි... මම ෂෙලී... මම තවම ඉන්නෙ මායා හෝටලය කිට්ටුව. ඒක අයිතිකාරව හිටි නෝනා... මම කිව්වෙ මැඩම් එමිලියා එයාගෙ කොටේජ් එකේ... අද රෑත් මං ඉන්න තීරණය කෙරුවා... එයා පුළුවන් උදව්වක් කරන්නං කිව්වා සයිකික් කෙනෙක් හැටියට... මං දන්නව මිස්ට මද්දුමාරච්චි මේවා එච්චර විස්වාස කරන්නෙ නැති විත්තිය. හැබැයි අද එයා මගෙ මැරුණ ආච්චි මම්මට කතා කෙරුවා... මං දන්නවා ආච්චි මම්මට මේ වැඩේට උදව් කරන්න බෑ... මං දන්නවා. මං කිව්වෙ මැඩම් එමිලියාව විස්වාස කරන්න පුළුවන්. එයා දන්න දෙයක් නං කියාවි. එයාට හංගන්න හේතුවක් නැනේ? එයාට හංගන්න දේකුත් නෑ... හොඳයි හොඳයි මොනව හොයා ගත්තත් නැතත්... තැන්ක් යූ මිස්ට මද්දුමාරච්චි... ගුඩ් නයිට්!"

දුරකථනය විසංධි කර යළි කලිසම් සාක්කුවේ රුවා ගත් ෂෙලී කවුළුවෙන් පිටත බලා දිග සුසුමක් හෙලා කාමරයෙන් පිටව ගියේය.

සුරලි කාමරයට යම්දෝයි නොයම් දෝයි සිතන විටම අසලින් අඳුරේ රූපාගේ කට හඬ ඇසිණි.

"මට පේනවා... මට පේනවා... හැංගි හොරා... කොහොමද මගෙ අමල් බිසෝ?"

"මේ පිස්සි මේ රෑ මොන මළ සමයං නටනවාද?" සුරලි තමාටම කියා ගත්තාය.

"මං කිව්වනෙ යන්න කියලා" අඳුරේ සිට රූපා කතා කළාය. "මෙතන ඔයාට හොඳ තැනක් නෙමෙයි. අමල් බිසෝ... මෙතැනට අම්මා අප්පා එන්නෙ නෑ... මේ ... මේ..."

ඈ කියවා ගෙන ගිය දෙය නැසුනාක් මෙන් සුරලි කවුළුවෙන් කාමරය තුළට පැන ගත්තාය. ඈ කවුළු පියන්පත වසන්නට කලින් කොහෙන්දෝ ආ අදිසි සුළඟකින් එය 'දඩස්' ගා වැසුණි.

සුරලි ඇඳ මතට නැග පොරෝනා අතර ගුලි වූනාය. අද රුවත් ජනේෂ් තමා සොයා ගෙන ඒවිද?

මෙ ඇවිත් දෙවැනි දවසද? තුන්වැනි දවසද? ඇයට දූත් දින ගණන මතක නැත්තේ එය කල්පයක් සේ දැනුණ බැවිනි. ජනේෂ් මොනවා කළත් කරන්නේ දෙදෙනාගේම යහපත තකා නොවේද?

ෂෙලී මේ අවට සිටින බව දන්නා නිසාද ජනේෂ් හැංගි මුත්තම් කෙලින්නේ?

ඉබේම මෙන් සුරලි දැඩි නිද්‍රාවකට පත්වූනාය. කවුදෝ කෙනෙක් තමාව අඳුරක එළවාගෙන එන්නා සේ ඈ සිහිනයක දුටුවාය.

ඒ ෂෙලී විය හැකිද?

ගස් අතු අතරින් පෙරී ආවේ තද නිල් පැහැ එළියකි. ගස් අතු සියල්ල කලුවන් කලු විය.

කවුදෝ ඇවිත් පිටුපසින් ඇයව තරකොට ගත්තේය.

සිහිනය බිඳී යත්ම සුරලිට ජනේෂ්ගේ පහස දැනී ඔහුගේ රහස් කටහඬ කොඳුරනු ඇසුණි.

"ජ... නේෂ්?!"

"ඔව්... සුදූ... මං ආවා..."

"කොහෙන්ද?"

"ඇයි අර ජනේලෙන්"

"මං හිතුවා... ඔයා එන එකක් නෑ කියලා"

ජනේෂ් නිහඬව, සුරලි පිටුපසම තුරුල් වී ඇයව වැළඳ ගත්තේය.

"මං අපිට ඉන්න තැනක් හොයා ගත්තා" ඔහු රහස් හඬින් තෙපළේය.

"ඉන්න තැනක්? කොහේද?"

"මං හෙට කියන්නං කො... දැන් ඔයා සැනසිල්ලෙ නිදිය ගන්නකො. හෙට උදේ... ෂෙලී ගියාට පස්සෙ ඔයා මායා හෝටලය ගාවට එන්න ඕනෑ"

"මායා... හෝටලේට?"

"එන්නකෝ... හෝටලේ පිටුපස්සට... මං පෙන්නන්නම් මං අපි දෙන්නට හරි ගස්සපු තැන. නිවිහැන්නෙ ඉන්න පුළුවන්... අපි දෙන්නටම..."

"එතකොට කාරෙක?... ඔයා කාරෙක අරන් ආවද?"

"කාරෙක? මං උස්සගෙන එන්නද?"කී ජනේෂ් සිනාසුණේය. "කාරෙක වෙලාවට හම්බ වේවි"

"ඔයා ඒක උගස් තියලද මේ ඉන්න තැනක් හදා ගත්තෙ?"

"ඔයා පිස්සු විකාර කියවනවා. දැන් ඉතින් නිදාගන්න..."

ජනේෂ්, සුරලි පසු පසින් තව තවත් ඇයට තුරුළු වුනේය. සුරලිට සිතුණේ ඇයට නින්ද යාගෙන ගියා පමණක් කියායි.

එක්වනම ගෙතුළෙන් කවුදෝ කෑ ගසා හඬන හඬක් ඇසුණි.

"ජ...නේ...ෂ්!"

ජනේෂ්ගෙන් පිළිතුරක් නැත. ඔහු දැඩි නින්දේ විය යුතුය.

අනතුරුව කවුදෝ ඉකිබිඳින හඬක් ඇසුණි. සාලයේ කුඩා මේසය මත වූ ලාම්පුව දැල්වුන බැවින් අවට මඳ එළියක් පැතිර ගියේය.

සුරලි සීරුවෙන් ඇඳෙන් නැගිට්ටාය.

හඬ නැහෙන්නට ඇ පාවීගෙන මෙන් කැම කාමරය ළඟට ඇවිත් සාලය දිසාව බැලුවේ ඉස්කිරිමේ පලු අතර ඉඩසකිනි.

මැඩම් එමිලියා ලොකු සෝපාව මත හිඳගෙන සිටියේ දෑතින් මුහුණ සඟවා ගෙනයි. ඇ හැඳ සිටියේ තද දම් පැහැ ගවුමකි. හිස හරි හැටි පීරා නොතිබුණි. ඇගේ සැරටිය ඇගේ පා මුල වැටී තිබුණි. තමා මෙතැන ඉන්නවාද කියාවත් නොදන්නා ගැහැණියකට තමා ගිහින් උදව් කරන්නේ කෙලෙසද? තවද, තමා

හිඳින බව එළිදරව් වුනොත්, ජහේෂ් මෙහි හිඳින බවත් එළිදරව් වේවි. කළ හැකි එකම දෙය නිහඬව නොපෙනී සියලු දෙය බලා සිටීමයි.

මේ කිසිවක් සුරලිගේ ජීවිතයට අදාල සිදුවීම් නොවේ. එහෙත් තමා දූන් ඉබේම මේ නොදන්නා ජාලයක පැටලිලාය.

මඳ වේලාවකින් මැඩම් එමිලියා ලැමතුරේ සඟවා සිටි ලොකු කපු ලේන්සුවකින් දෑසත්, නැහැයත් පිසදා ගෙන, සැරටිය අහුලා ගත්තාය. එහි වාරුවෙන් නැගිට සිටි ඇය සෙමින් සෝපාවට පිටුපසින් වූ බිත්තිය දෙසට හැරුණාය.

ඒ මත එල්ලා තිබූ ඡයාරූප දෙක දෙසයි, දූන් ඈ බලා සිටින්නට වූයේ.

අනතුරුව ඈ පහත් හඬකින් කතා කරන්නට වූනාය.

"ඔව් මයි ඩාලිං... මයි මුහන්දිරම්... අපි ඒ කාලෙ කොච්චර සන්තෝසෙන් හිටියද ඩාලිං? හව් හැපී වී වර් දෙන්? මේ පින්තූර කොච්චර පරණද? මට නම් දූන් මතකත් නෑ ඩාලිං... මුහන්දිරම් ඉලංගකෝන්... මගේ ඉලං... ඉලං... ඉලං...මමත් ඉක්මණටම දවසක එහා පැත්තට එනවා... ඩාලිං ඔයාගෙ ස්පිරිට් එක ඇයි මට පේන්න එන්නෙ නැත්තෙ?" ඈ මුහන්දිරම් ඉලංගකෝන්ගේ පින්තූරයේ කෙළවරක් අතැඟිල්ලෙන් අතගෑවාය. "තැන්ක් යූ ෆෝ කමින් ඉන්ටු මයි ලයිෆ්... ඩාලිං වට් ෆන් වී හැඩ් දෙන්. මේ සේරම තව ටික දවසකින් ඉවරයිනෙ ඩාලිං... අපේ දෝණි ඇවිත් කරන දෙයක් කරාවි. අර කෙල්ලට ඉන්න තැනක් හරි ගස්සල තියන්න ඕනෑ... කවුද ඉතිං ඒකිව බලා ගන්නෙ? ටිකෝ ඉන්නවනෙ නේද? අනේ මන්දා"

ඈ අනතුරුව ඇගේ රූපය අතගා බැලුවාය.

"මයි! හව් අයි හැව් ගොටන් ඕල්ඩ්...!"

එක්වනම ඈ ඒ දිග කළ අතම අනෙක් අතෙන් අතගා බැලුවේ එහි ඉලිප්පී තිබූ නහරවැල්වල පහස ලබන්නට මෙනි.

ඇගේ දෑස්වල කඳුළු අලුත් වෙද්දී ඈ පින්තූරයෙන් අනෙක් අතට හැරුණාය. ඈ එසේ හැරුණේ සුරලි සිටි දිසාවටය. එහෙත්

අඩ අඳුරේ සිටි සුරලිව ඇයට නොපෙනුණේ ඇගේ දෑස් දුබල වූ බැවිනි.

එක අතකින් අනෙක් අත අතගාද්දී සෝපාව මතට වැටුණු සැරටිය ඈ යළිත් සුරතින් ගත්තාය.

සෝපාවෙහි හිඳ ගනිමින්ම ඈ යළිත් මහ හඬින් හඬන්නට වූනාය.

"දෙවියනේ මට කවුරුත් නෑ... දෙවියනේ! මං තනිවෙලා..."

සුරලි සිටගත් තැනම ගල් ගැසී බලා සිටියාය. මැඩම් එමිලියාව සනසන්නට ඇයට එතැනට යා නොහැක. තමා මෙහි සිටිනවාද යන්නවත් නොදන්නා එමිලියා වෙතට තමා දැන් ප්‍රාදූර්භූත වුවහොත් ඈ නිසැකයෙන්ම බියවී තවත් කෑ ගසාවි.

සුරලි සිතුවේ එමිලියාගේ හැඬුම් හඬ අසා රූපා දුව ඒවි කියායි. එහෙත් දවස තිස්සේ පිස්සු කෙලින රූපා කුස්සියේ දූඩි නින්දක විය යුතුයි. ඒ වෙනුවට එමිලියාගේ හැඬුම් හඬ අසා අනෙක් පස සිට සාලයට ආවේ ෂෙලී විල්සන්ය.

ඔහු ඇඳ සිටියේ නිදන්නට ඇඳට ඇඳගෙන සිටි යට කලිසමක් පමණි. ඔහුගේ හැඩි දැඩි බව සුරලිට එක්වනම පෙනුණි. ඔහුගේ සිරුරෙහි සම ලා පැහැයක් විය. හරියට අප්‍රිකානු කැලයක ගහකින් පහත්වූ ටාසන් කෙනෙක් මෙනි.

"මැඩම් එමිලියා!" හඬන ගැහැණිය වෙතට එමින් ෂෙලී කරුණාබර හඬකින් ඇයව ඇමතුවේය.

"ආ යූ ඕ. කේ?" ඔහු ඇසුවේ ඇය වෙතට නැඹුරු වෙමිනි.

"අයැම් ඕ. කේ අයැම් ඕ කේ" කියමින් ඈ අත් දෙකම ඔහු දෙසට දිගු කළේ ඔහුව වැළඳ ගන්නට මෙනි. ෂෙලීද අනුකම්පාවෙන් මෙන් තවත් ඇයට සමීප විය. ඇය කුඩා දැරියක මෙන්, එසේ පාත්වූ ඔහූගෙ පපුතුරට හිස ඔබාගෙන ඉකිබිඳින්නට වුනාය.

ඈ කී කිසිවක් සුරලිට ඇසුණේ නැත.

තව මොහොතකින් ෂෙලී, මැඩම් එමිලියා අසලම හිඳ සිටියේය.

"මං තනිවෙලා ෂෙලී මං මෙච්චර කල් ඉවසුවා... මං හරිම තනිවෙලා. මුහන්දිරම් මගේ මුහන්දිරම් ඉලං... ඉලංගකෝන් නැති උනාට පස්සෙ මං මේ ලෝකෙ තනිවුනා" එමිලියා යළිත් ඇගේ හිස ෂෙලීගේ පපුව මතත් අනතුරුව උරහිස මතත් රඳවා ගත්තාය. "එයා මැරුණට පස්සේ මගෙ සයිකික් පවර්ස් සේරම අඩු උනා. මගේ හිතේ දුක වැඩි කමට මං ඉස්සර එයාගෙ ස්පිරිට් එක කොන්ටැක්ට් කරන්න හැදුවා. දෙතුන් වතාවක් මට එයාව පැහැදිලිව පෙනුනා. ඊට පස්සෙ මට එයාව පේන්නෙම නැතුව ගියා. මට හිතෙන්නෙ අපේ බන්ධනය ඉවරයි වගේ. මං හිතුවේ ෂෙලීට තව උදව් කරන්න පුළුවන් වෙයි කියලා. වෙනදට මට ඔය නැතිවෙන අය හොයලා දෙන්න හරිම ලේසියි. දැන් සමහර වෙලාවට මට ඒ අය ඉන්න තැන් ලොකේට් කරල කියන්න පුළුවන්. හුඟක් වෙලාවට මට දැන් ඒ ශක්තිය නැහැ. මට හිතෙන්නෙ... මං වේලිච්ච දර කෝටු වෙච්ච ගහක් වගේ කියලා..."

"ඇයි එහෙම කියන්නෙ එමිලියා... මැඩම්?" කී ෂෙලී ඈ දිහාවට හැරුණේය. "ඔයා තවම ලස්සණයි. බලන්න ඔයා හැම තිස්සෙම ලස්සනට ඇඳල පැලඳලා ඉන්නවා"

"පරණ ඇඳුම්..." කී එමිලියා සිය අතක් ෂෙලීගේ අතක් මත තැබුවාය. "සේරම අපේ මුහන්දිරම් මට අරන් දීපු ඇඳුම්. එකක්වත් විසි කරන්න මට හිත් දෙන්නෙ නෑ"

"ඒක තමයි ආදරය කියන්නෙ" කී ෂෙලී උවමනාවෙන් එමිලියා දෙස බැලුවේය.

"ෂෙලී නම් ආදරේ අඳුනනවා ඇතිනෙ" එමිලියා ෂෙලී දෙස බැලුවාය.

"මමත් ආදරය කරලා නැත්තෙ නෑ මැඩම්.. ඒ උනත්..."

"ඇයි ඒ උනත් කියල නැවැත්තුවෙ?"

"නෑ ඉතිං..."

"නෑ ඉතිං කිව්වෙ...?"

"නෑ ඉතිං මං තාමත් බැඳල හිටියට... එක ඇඳේ නිදාගත්තට... මං මේ මොනවද කියන්නෙ?"

"මට කියන්න ඕන නෑ ෂෙලී. මට හිත් කියවන්න පුළුවන්... ඔයත් තනි වෙච්ච කෙනෙක්... ඔයා දෙන ආදරේ ඔයාට ආපහු ලැබිල නැහැ... හරිද?"

"හරියට හරි"

"ආදරේ කියන්නෙ... එක ඇඳක දෙපැත්ත වැටිලා නිදා ගන්නව විතරක් නෙමෙයි. දන්නවනෙ? මගේ මුහන්දිරම් මට හොඳටම ආදරේ කෙරුවා. එයා මැරෙණ කල්ම... ඉතිං ඒ ආදරේ උණුසුම නැති උනාම ලොකු අඩුවක් වෙනව ජීවිතේ"

"මට තේරෙනවා. කෙනෙකුට තව කෙනෙකුගෙ උණුසුම සෙනෙහස අවශ්‍යයි. මට තේරෙනවා" කී ෂෙලීගේ සුරත, මැඩම් එමිලියාගේ වුවනෙහි දුවටෙන්නට විය. අනතුරුව ඇගේ කෙස් රළ ඔහුගේ අතැඟිලි පහසට පාත්‍ර විය.

සුරලිට ෂෙලීගේ මුහුණ පැහැදිලිව පෙනුණේ දැන්ය. එහි ප්‍රභාවක් විය. එපමණක් නෙවේ. එමිලියාගේ මුහුණටද මෙතෙක් නොවූ ප්‍රාණවත් බාවයක්, තාරුණ්‍යයක් එක්විය.

ඇගේ දෙතොලග ඔහුගේ අතැඟිලි දුවටිණි.

අනතුරුව ෂෙලී නිහඬවම නැගිටින අතරේ ඇයවද නැගිටුවා තුරුළු කර ගත්තේය. දැන් ඔවුන්ට වදන් අනවශ්‍ය විය. තවද ඔවුන්ගේ දෙතොල් පැටලුණු බැවින් දෙදෙනාම ගොළු වූහ.

තව මඳකින් දැඩි ආලිංගනයෙන් හා චුම්බනයෙන් අනතුරුව ෂෙලී එමිලියාව තමාගේ සයන මැදිරිය දිසාවට ගෙන යන්නට පෙර සාලයේ සියලු පහන් නිවී ගියේය.

සුරලි ආපසු සිය කාමරයට ඇවිද ගියේ අඩ අඳුරේය.

ඇ සිතුවේ ජනේෂ් දැඩි නින්දක ඇත කියායි.

එහෙත් ඔහු සයනෙහි නොවීය.

ෂෙලී තවමත් මේ ගෙයි රැඳෙන බව දැනගත් පසු, ජනේෂ් සැඟවී යන්නට ඇති. අඳුරේම අතපත ගාමින් සුරලි නාන කාමරයටද එබී බැලුවාය.

ජනේෂ් එහිද නොවීය.

"ජනේෂ්?" යැයි රහස් ප්‍රශ්නාර්ථයෙන් මුමුණමින් ඈ පෙරලා කාමරයට අවුත් ලොකු වීදුරු කවුළුව වෙතට ගමන් කළාය.

දුහුල් සුදු තිර රෙද්ද ඈ මඳක් මෑත් කළේ ඔහු පිටත සැඟවී ඇද්දෝයි යන සැකයකිනි.

එහෙත්... ඔහු පිටත අඳුරේ නොවීය.

ඉදිරි දොරට ඉහළින් වූ විදුලි පහනෙන් ඇදී ආ ආලෝක දහරාවක් කවුළුවේ කොටසකට පතිත විය.

කවුළුවේ වීදුරු තහඩුව මත බැඳි තුහින පටලය මත්තේ වදන් දෙකක් අතැඟිල්ලකින් ලියැවී තිබිණි.

"හෙට එන්නම්"

ජනේෂ් කීවේ තමාට හෙට දිනයේ මායා හෝටලයේ පිටුපසට එන්නට කියායි.

එහෙම නම් අද රෑම ඔහු නික්ම ගියේ ඒ සියල්ල පිළියෙල කරන්නට විය යුතුයි. තව දුරටත් කථා කරන්නට ඔහු නොරුඳුනේ ෂෙලී මෙතන අද රාත්‍රියේ අරක්ගත් බැවිනි.

එහෙත් ෂෙලීට වැහී තිබුණේ වෙනම යක්ෂයෙකි. එය ආදරයක් නොව. රාගයකින් දැවෙන ආශාවකියි සුරලිට සිතුණි.

# 16

තේරුම් කළ නොහෙන වෙහෙසකින් සුරලි දැඩි නින්දකට වැටුණාය. කවුළුවේ තුහින පටලය මත ලියැවුණු "හෙට එන්නම්" කී පණිවිඩය වඩාත් ඝණ වූ තුහිනයෙන් මැකී ගියේය.

පිටත තුෂර කැට සීතල සුළඟක ඇද වැටෙද්දී සුරලි ඇඳ මත වූ රෙදි පෙරෙදි පොරවා ගෙන උණුසුම්වෙමින් සිහින ලොවට පිවිසියාය.

ඒ සිහින ලෝකයේ ඇයත් ජනේෂුත් ලොකු මුතු කුඩයක් යට කඳුකරයේ නිම්න තලාවක තණ තිල්ලක වර්ණවත් මල් මැද්දෙන් ඇවිද ගියෝය. එය කලකට ඉහත බැලූ හින්දි චිත්‍රපටියක දසුනක් මෙන් විය.

ජනේෂ් තමා වෙනුවෙන් තැණූ තැන මෙසේ විය නොහැකිද? පාට පාට මල් පිපෙන වතු යායක් මැද සුන්දර නිවහනක්...

ඒ සිහිනයේ ගැලෙමින් නිදාගත් සුරලි අවදිවෙද්දීම සිහිනයේ බොහෝ දෑ අමතකව ගියේය. පිටත ලා අව්වක් පායා තිබිණි.

සාලයේ එමිලියාත් ෂෙලීත් කතා කරන හඬ ඇසුණද කිසිවක් පැහැදිලි නොවීය. ඔවුන් උදේ පාතරාසය ගන්නවා ඇති. බේකන්. බිත්තර, බැදෙන, පාන් ටෝස් වෙන සුවඳක් මේ කාමරයටත් ඇදී ආවේය. එහෙත් සුරලිට බඩගින්නක් නම් නොදැනුණි.

තමා ජනේෂ් දැක ගන්නට හැකි ඉක්මණින් මායා හෝටලයේ පිටුපසට යා යුතු විය.

ඈ කඩිනමින් නැගිට ගත්තාය. අළුත් ඇඳුම් ඇඳීමක් අනවශ්‍ය වූයේ සුරලි පෙරදා ඇඳි ඇඳුම පිටින්ම නිදා ගත් බැවිනි. ඇගේ ඇඳුම් බෑග ජනේෂ් අලුත් නවාතැනට ගෙනවුත් ඇති. එහිදී හොඳට නා පිරිසිදු වී අලුත් ඇඳුම් කට්ටලයක් ඇඳගත හැකි වේවියැයි ඇයට සිතුණි.

"එක්ටැම් ගේකින් බැහැලා එනවද මගේ කුමාරි..."

පිටතින් ඇසුණේ රූපා තාලයට කියන හඬයි. ඒ ඇසීදෝ ෂෙලී ගෙතුළ සිනාසෙනු ඇසුණි. මඳ විරාමයකින් රූපා තවත් පදයක් එකතු කළාය.

"සිත් සත්තෝසෙන් ඉන්නව නේදෝ මගේ දයාවී..."

රූපා තවත් මොන මොනවාදෝ තාලයකට කියමින් කුස්සිය අතට ගියාය. සුරලි කවුළුවේ තිරරෙද්ද මෑත් කර පිටත බැලුවාය. තුහිනයත් සමඟ ජනේෂ් ලියූ පණිවිඩයද මැකී ගොසිණි. වලාකුල් ගොන්නක් අස්සෙන් උදා රන් හිරු ලොව දකින්නට, ගොඩ එන්නට තැත් දරන්නා සේය.

"අපි එහෙම නම් රවුමක් ගිහින් බලලා එමුද, මැඩම්?" ෂෙලී දූත් කථා කළේ රාත්‍රියේ පෑ සුහදත්වයට වඩා වෙනස් ආචාරශීලී ආකාරයකිනි.

"බලමුකො මොනවත් හොයා ගන්න පුලුවන්ද කියලා"

"ඊයෙ රාත්තිරියෙන් පස්සෙ මට ආයෙත් ඉපදුණා වගේ දැනුනා ෂෙලී" ඇත්තෙන්ම ඇගේ කට හඬෙහි පෙරදාට වඩා තරුණ්‍යයක් ඇතැයි සුරලිටද හැඟුණි.

එහෙත්... තමාට ඔවුන් හමුවට මෙසේ හදිසියේ යා නොහැක. ජනේෂ් සොයාගත් තැනට ගොස් දෙදෙනා පැලපදියන් වූ පසු ඔවුන්ට මැඩම් එමිලියාව ඇවිත් මුණ ගැසෙන්නට පුළුවන.

එමිලියා තවමත් තමා මෙහි ලැගුම් ගන්නා බව නොදන්නවා නම් එය එසේම තියේවා!යි සුරලි සිතුවාය.

දූත් එමිලියා වැජඹෙන්නේ වෙනම ලෝකයකයි. ෂෙලී තමාව සොයනවායි තාත්තාට දිගින් දිගට කියමින් මුසාවක ජීවත් වෙන්නට පුළුවන.

එහෙත් තමා කොතෙක් කල් ලෝකයෙන් සැඟවී සිටින්නද? දවසක සියල්ල හෙළි විය යුතුයි. මේ සියල්ලම පමා කරවන්නේ තමාගේම සිතුවිලි නොවේද? ඒ නැත්නම් ජනේෂ් ගේ උපාය...

ජනේෂ් තමාව රැගෙන මෙහි පැමිණියේ සැබෑ ආදරයකින්ද? ඒ නැත්නම් තමාවත් රවටා තම දෙමාපියන්ගෙන් පළිගන්නද? ලබාගන්නට නොහැකි වස්තුවක් තමා අත්පත් කර ගත්තේය යන අභිමානයකට පමණද තමාව ජනේෂ් මෙසේ නන්නාඳුනන සිත කඳුකර ලෝකයකට ගෙන ආවේ? තමා ඔහුට අත කොළුවක් වූයේ ඔහුගේම ආත්ම තෘප්තියක් සඳහාද?

ෂෙලීත්, එමිලියාත් වෙන මොනවාදෝ දොඩමින් ඉදිරි දොරෙන් පිටවෙන හඬ ඇසිණි.

"මායා හෝටලයේ පෙම් කුරුල්ලෝ" සුරලිට එසේ සිතුණේ යම්කිසි අවඥාවකිනි.

ඔවුන් දැක ගන්නට උපන් කුතුහලයෙන් සුරලි තම කාමරයේ කවුළු තිර අස්සෙන් පිටත බැලුවාය.

ෂෙලී දූන් එමිලියාගේ අත අල්ලාගෙන ගියේ ඇයට අත් වාරුවක් ලෙසින්ම පමණක් නොවේ යැයි ඇයට සිතුණි. ඈ කෙරෙහි ඔහුගේ හැඟුම් වෙනස් වී ඇත. කවුද දන්නේ? දවසක ඔහු මායා හෝටලයේ අයිතිකරු බවට පත්වී සියල්ල අලුත් වැඩියා කර යථා තත්ත්වයට පත්කර සාර්ථක ව්‍යාපාරයක් බවට එය පත් කරාවි.

එමිලියා අද හැඳ සිටියේ රතුපාට, රෝසපාට කළවම් වූ මල් මල් දිග ගවුමකි. ඇගේ ලෝකයට වසන්තය උදාවූවාක් වැනිය. ඇගේ මුහුණේ පිරී ඇති සතුට, සිනහවකින්, වදනකින් පිටමං වෙයි. ඈ කී කිසිවක් සුරලිට පැහැදිලි නොවීය. අනතුරුව ඇයට පෙනුණේ සුදු ලී වැට අසල සිටගෙන සිටින රූපායි.

රූපාගේ මුහුණෙන් සටහන් වන්නේ නැති බැරි කම කියන ද්වේශයක් සහ ශෝකයකි. ඇයට එමිලියාගෙන් මිදී යන්නට නොහැක. රූපා එමිලියාගේ එකම සරණ වූවත් දූන් සිට එමිලියාට වෙනත් අත්වැලක් ඇතුවා සේය. එහෙත් එමිලියා රූපාගේ එකම සරණයි. දූන් තමාගේ අත්වැල කැඩී යන්නා සේය රූපා තෝන්තුවාවෙන් බලා සිටියේ.

"කෑම උයාගෙන කාපන් කෙල්ලේ" එමිලියා හඬ නගා කීවාය. "මමත් මේ මහත්තයත් දවල් කෑමට ගෙදර එන්නෙ නෑ"

"හොඳා හොඳා" රූපා එසේ කීවා නොව, මිමුණුවා පමණි.

සුරලි කවුළු තිරපට කෙළවරට මුවා වී බලා සිටියදී එක්වනම ෂෙලී ආපසු හැරී බැලුවේය.

"කවුද අර කාමරේ ඉන්නෙ?" ඔහු තිගැස්සී එමිලියාගෙන් විමසුවේය.

"කෙහේද? කවුද?" එමිලියා අන්දුන් කුන්දුන්ය.

"කොයි කාමරේද?"

"අර පැත්තෙ කාමරේ"

"රූපාද?"

"නෑ නෑ රූපා ඉන්නෙ එළියෙ. නෑ මං හොඳටෝම දැක්කා අර කවුද ජනේලෙන් එබිල බලනවා" ෂෙලී කියද්දී,

එමිලියා අවිශ්වාසයෙන් හිස සලා "කවුරුවත් ඒ කාමරේ නෑ ෂෙලී" කියා කීවාය.

"මං හොඳටම දැක්කා" ෂෙලී කියන විටත් කවුළුව වෙතින් ඈත් වූ සුරලි සැඟවෙන්නට තැනක් සෙව්වාය.

ඇඳ යට රිංගන්නට එතරම් ඉඩක් නැත.

අල්මාරිය කුඩා වැඩිය.

"මං ගිහින් ටිකක් සෝදිසි කරල ආවට කමක් නැද්ද මැඩම්?" ෂෙලී කියනු ඇසුණි.

"අපෝ මගේ තහනමක් නෑ. යූ ආර් වෙල්කම්" එමිලියා කියනු ඇසුණි.

දැන් ෂෙලී කාමරයට එනවා නොඅනුමානය.

සුරලි නානකාමරයට වැදුණාය. දොර අගුල් දමා සිටියොත් ඔහු අනිවාර්යයෙන් එහි අගුල ඇරගෙන ඒවි.

සුරලි වතුරමල ඇති තැනට ආවාය. එතැන වතුර මලට පහතින් ඇත්තේ ලොකු ටබ් එකකි. පිඟන් මැටියෙන් ඔප දැමූ ඒ සුදු දිග ටබ් එකේ තැනින් තැන ගෙවී ගොස් යට කළු මතුවෙලාය. කෙනෙකුට එහි ඇතුල් වූ පසු වටේට ඇද ගත හැකි ප්ලාස්ටික් ආවරණ රෙද්දක් වෙයි. ඒ ඉටි රෙද්දෙහි සිහින් රෝස පාට මල් වැටී තිබේ. එය ඉහළින් රඳවා ගෙන ඉන්නේ එහි පලින් පල ඇති මුදු මැදින් දිවෙන වානේ කූරකි. සුරලි ටබ් එකට බැස ඉටි රෙද්ද වටේට ඇද ගත්තාය. ඈ එහි කෙළවරටම වී රෙද්දෙහි ඒ කෙලවරෙන්ම සිරුර වසා ගත්තාය.

ෂෙලී කාමරයට ඇවිත් විපරම් කරනු ඇසුණි. අනතුරුව ඔහු නාන කාමරය තුළට පිවිසියේය.

ටබ් එක වටා ඉහළින් ඇද තිබූ ඉටි රෙද්ද ඔහු මඳක් මෑත් කර බැලුවේය.

සුරලිගේ පපුව ගිඩි ගිඩි ගා ගැහෙන්නට විය.

එහෙත්...

ෂෙලී සුරලිව නොදුටු හෙයින් ඉටිරෙද්ද කෙළවර අත හැර කොමෝඩ පියන හැර එතැන සිට ගත්තේය.

ඔහු 'ගොජ ගොජ' ගා සුලු දිය මුදාහරින හඬ සුරලි අසා සිටියාය. අනතුරුව ඔහු කොමෝඩ දිය දහර මුදා හැරියේය. යළිත් කාමර කොටසට ගිය ඔහු අවට විපරමෙන් බලා සිවුරුමක් කරමින් කාමරයෙන් පිට වුනේය.

සුරලි ලොකු සුසුමක් හෙලා සැඟවුණු තැනින් පිටතට ආවේ දහයට ගණන් කළාට පසුවයි.

ඒ වෙන විට ෂෙලී පිටතට ගොස් තිබිණි.

සුරලි යළිත් කවුළු කෙළවරින් එබී බලන විට ෂෙලීත්, එමිලියාත් රැගත් රථය පිටව යන ආකාරය පෙනුණි.

දකුණට වෙන්නට වූ පයින් ගස පසුකරගෙන ප්‍රධාන පාර අතට ගමන් ගත් රථය, ප්‍රධාන පාරට වැටෙන ටී- හංදිය ළඟ නතර විණි. ෂෙලීත්, එමිලියාත් දෙදෙනාම රථයෙන් බැස එතැනින් වම් පසට වූ බෑවුමට ඉහළින් සිටගෙන අවට සිරි නැරඹූහ.

ෂෙලී ඉහළ කඳු දෙස බැලූ අතර එමිලියා පහත ප්‍රපාතය දෙස බැලුවාය. ඔවුන්ට ඉහළින් පියාඹා ගිය අඳුරු කලු කුරුල්ලෙක් සුරලිට කවුළුවෙන් පෙනුණි. ඌ මායා හෝටලය අතට යද්දී ප්‍රපාතයෙන් නැඟි තවත් එවන්ම කලු කුරුල්ලෙක් ඌ හඹා ගියේය. උන් දෙදෙනාම තව මොහොතකින් සුරලිගේ දසුන් පථයෙන් ඈත් වූහ.

එමිලියා, ෂෙලීට යමක් කීවද සුරලිට කිසිවක් පැහැදිලිව ඇසුණේ නැත. මඳ මොහොතකට පසු ෂෙලී එමිලියා වෙතට පැමිණ ඈ අසලම සිට ඉදිරියේ පහතින් වූ ගැඹුරු හෙලට එබී බැලූහ.

ටිකෝ ගේ පුංචි ලොරිය නගරය දිසාවෙන් අවුත් ටී හන්දියේදී ෂෙලීගේ රිය නවතා තිබෙන තැනට විත් නතර විණි.

ටිකෝ රථයෙන් බැස අනෙක් දෙදෙනා වෙතට අවුත් යමක් කීවේය. අනතුරුව අවට අත දිගු කරමින් යමක් පෙන්නුවේය.

ඊළඟට එමිලියාත්, ෂෙලීත්, ෂෙලීගේ රථයට නැංග අතරේ ටිකෝ ප්‍රපාතයෙන් පහත බලා සිටියේය.

ඔහු තම පුංචි ලොරියට නැංගේ ෂෙලීගේ රථය නගරය දිසාවට ගමන් ගත්තාට පසුවය. අනතුරුව ටිකෝ කොටේජ් එක අතට රිය එළවා ගෙන ආවේය. ඔහු එනු දකිත්ම රූපා වැට ළඟට ආවාය.

"මොනවද ටිකෝ මාමෙ ගෙනැවෙ?" ඈ තොඳොල් බසින් අසත්ම සුරලි වඩාත් විමසිල්ලෙන් තිරපට කෙළවරින් බැලුවාය.

"මොනවත් ගෙනැවෙ නෑ කෙල්ලෙ මං හන්දියට යන්න කලියෙන් ආවෙ මගෙ සූකිරි කැටේ බලලා යන්න..." ටිකෝ රියෙන් බසිමින් කීය.

"සූකිරි කැටේ?" කී රූපා හිකි හිකි ගා හිනැහුණාය.

"උඹ තමා මගෙ සූකිරි කැටේ? කෙහේද මැඩම් රෝන්දෙ ගහන්න ගියේ?"

"අලුත් බොයි ෆ්‍රෙන්ඩ් එක්ක" කී රූපා යළිත් හිකි හිකි ගා හිනැහුනාය. "ඒ හොඳ හොඳ සෙල්ලම් එළිවෙන ජාමෙට කිව්වලු"

"ඊයෙ රෑ ඒ මනුස්සය හිටියද?"

"නැතුව?"

"තව කවුද ඉන්නෙ?"

"කවුරුවත් නෑ..."

"කවුරුවත් නෑ?"

"නෑ කිව්වම නෑ"

"එහෙනං වරෙන් ටිකකට ගෙට යන්ඩ"

"මේ එලියෙ හොඳයි"

"වරෙන් යන්න... කුස්සියට... නැත්තං අර කාමරේට..."

"කාමරේට? ම්... කාමරේට බෑ..."

තමා සිටින බැවින් රූපා වෙන උපායක් කල්පනා කරනවා වන්නට ඇත.

"අපි යමු කුස්සියට" රූපා මඳකට පසු කීවාය. "ලිප ගාව උණුහුමයි"

"මගෙ සූකිරි කැටේ... වරෙන් උඹව උනුහුම් කරන්න"

ටිකෝ එසේ මනමාල බසෙන් කියන විට රූපා ඔහු කිති කැව්වාක් සේ හිකි හිකි ගා හිනැහුනාය.

දෙදෙනා එකිනෙකාට ළංවී මුකුළු වෙමින් දොඩමින් යනු ඇසුණි. සුරලිට ඔවුන්ගේ කතා බහ කිසිවක් පැහැදිලි නොවීය.

ඊළඟට කුස්සියේ දොර දඩස් ගා වැසෙන හඬ ඇසුණි.

මේ තමාට මායා හෝටලයට යන්නට සුදුසු වේලාව බව දැනගෙන සුරලි පාවහන් නොලාම ඉදිරි දොරෙන් පිටතට ආවාය.

පසුගිය රෑ පින්නෙන් තවමත් පොළොව තෙතමනයෙන් යුතුවිය. අළු අහසෙහි නැගෙනහිර රිදී කාසියක් වන් හිරු, තිර පටලයෙන් මිදෙන්නට මෙන් උදාසීනව බලා සිටියේය.

තමාද ඒ හිරු සේම දූලක පැටලී ඇතුවා සේය සුරලිට හැඟුණේ. අද මායා හෝටලයේදී ජනේෂ් තමාව රැහැනෙන් මුදා ගනීද?

සුරලි ගල් කුළු නැගෙන, තෙත තණ පියලි ගොල්ල මත්තේ සෙමින් සෙමින් කඳු ගැටය නැංගාය.

# 17

හෝටලය පිටුපස රථ ගාලෙහි එකදු වාහනයක්වත් නොවීය. එහෙම නම් ජනේෂ් තවම ඇවිත් නැතුව ඇතැයි, සුරලි සිතුවාය.

වෙලාව කීයදැයි ඇය නොදත්තාය. හිරු තවම මුදුන් වී නැත. අළු අහස අස්සෙන් රිදී කාසියක් සේ එබී බලනවා පමණි.

මුල්ම රාත්‍රියේ තමා ජනේෂ් සමඟ හෝටල් සංක්‍රමණ මඟට ඇතුල් වූ දොරටුවට ළං වූ සුරලිට එතැන ඇතුල් වෙන තැනම සිටගෙන සිටි හුරු පුරුදු රුවක් පෙනිණි.

"ජස්ටින්!"

තමාවත්, ජනේෂ්වත් මුලින්ම පිළිගත් මහලු ආවතේව කරුවා කලින් රාත්‍රියේ සේම තද තිල් පැහැ කබාය හා සුදු සරම හැඳ සිටියේය. ඔහුගේ කබායේ වූ රත්තරං බොත්තම් වඩාත් දීප්තිමත්ව මේ අවස්ථාවේ පෙනුණි.

ඔහු කථා කරනවා වෙනුවට හිස නමා සිනාසුණේය. ඒ සිනහව යම් කිසි රහසක් සඟවන කපට සිනහවක ස්වරූපය ගත්තේය.

"කෝ? ජනේෂ් මහත්තයා?" ඈ 'ආවාද' යැයි එකතු කරන්නට පෙර ජස්ටින් සිය දකුණත අතු ගානා විලාසයෙන් දොරෙන් ඇතුළට දිගු කළේය. දොරටුව අසල ප්‍රාදූර්භූත වූයේ අන් කවරෙකුත් නොවේ, ජනේෂ්ය!

ඔහුගේ මුව පුරා ඉතිරෙන සිනහවකි. ඔහු අලුත්ම කලු පැහැ ඇඳුම් කට්ටලයක් හැඳලාය. හරියටම මඟුල් ගෙදරකට අඳින

ඇඳුම් කට්ටලයකි. සුදු පැහැ කමිසයක්, කරෙහි නිල් පැහැ ටයි පටියක්. ඔහු දෑත් දිගු කරමින් සුරලි අතට එන අතරේ සුරලි දෑත් දිගු කරගෙන ඔහු අතට දුව ගියාය.

ඔවුන් එකිනෙකා ගේ සුවඳ වැළඳ ගත්හ.

"ඔයා කොහොමද මෙතැන්ට ආවෙ? කෝ කාරෙක?" ඉඩ ලද මොහොතේම ඔහු දෙස එක එල්ලේ බලා සුරලි ඇසුවාය.

"මාව එක්කන් ආවෙ... ජස්ටින්... තව ටිකකින් අපි යමු කාරෙක තියෙන තැනට"

"අනේ ජනේෂ්!" යළි ඔහුට තුරුළු වෙමින් සුරලි කඳුළු සැලුවාය. "මං කෝච්චර කල්පයක් බලන් හිටියද?"

"කල්පයක් නෑ සුදූ... දවස් දෙකයි... තුනයි"

"ඒ උනාට කල්පයක් වගේ."

"එන්න අපි යමු ඇතුළට..."

"ආයෙත් මායා හෝටලයට? අම්මෝ මට නම් බෑ ඒ කැරපොතු විමානෙට යන්න..." සුරලි එසේ කී විට ජනේෂ් සේම ජස්ටින්ද සිනාසුණේය.

"අපි යන්නෙ බිම් කාමරේට. අපේම මැදිරියට?"

"බිං කාමරේට? අපේම මැදිරියට?"

"ඔව් සුදූ... මේ ජස්ටින් මගෙත් උදව්වෙන් අපිට ඉන්න ලස්සණ කාමරයක් හැදුවා."

"කොහේද?"

"මං කිව්වෙ... බිම් කාමරේ"

"බිම් කාමරේ"

"ඔව් බේස්මන්ට් එක" ජස්ටින් කීවේය.

"ඔව් සුදූ. බේස්මන්ට් කියන්නෙ පොළොව යට කාමරයක්. මේ හෝටලේ තියෙන ගෙදර හදන කොටම පිටරට තාලෙට

හදපු බිම කාමරයක්" ජනේෂ් තේරුම් කළේය. "යමුකො ඔයාට පෙන්වන්න"

"මට නං විස්වාස කරන්නත් බෑ රත්තරං"

"දැක්කහම විස්වාස කරයි"

"මට අදහන්නනත් බෑ!"

"දැක්කහම අදහයි" කී ජනේෂ් සුරලිගේ අත අල්ලා ගනිද්දී ජස්ටින් ඔවුන්ට ඉස්සර විය.

"අපි ආපු දා රෑම ජස්ටින් අපිව එක්කන් එන්න හිතුවෙ මේ කාමරේට. ඒ උනාට ඒ වෙන කොට මේක හදලා අහවර කරලා තිබුණෙ නැහැ. ඒකයි අපිව මැඩම්ගෙ කොටෙජ් එකට එක්කන් ගියෙ"

"මං හිතන්නෙ මැඩම් එමිලියා තාම දන්නෙ නෑ අපි එයාගෙ කොටෙජ් එකේ කාමරයක් අරක්ගත්තා කියලා"

ඒ කතාවට, ඉදිරියෙන් ගමන් කළ ජස්ටින් සිනාසී පඩිපෙළක් බසින්නට වුණේය. අඩි හතරක් තරම පුළුල් වූ ඒ පඩිපෙළ, තද රතු පැහැ විල්ලුද රෙද්දකින් ආවරණය වී තිබිණි. අවටින් රෝස මල්වල වැනි සුවඳක් ඇදී ආවේය. ඉහළ රන්වන් ආලෝක බුබුළු සෞම්‍යව දැල්විණි.

අඩි අටක් පමණ පහළට ගිය හිණි පෙළ කෙළවර විශාල කාමරයකට විවර විය. එහි පිටුපස කොටසෙහි පුළුල් වියන් ඇඳක් පෙනුණි. වියන් ඇඳේ සුව පහසු මෙට්ටය වසා දම් පැහැ, නිල් පැහැ වර්ණ සංකලනය කරගත් මෝස්තරයක් සහිත සයන ආවරණයක් විය. එයටම සරිලන සුමුදු පුළුන් කොට්ට හතරක්, බිම අමදින ලද රතු ලැලි වලින් කොටසක් වසා පර්සියානු බුමුතුරුණක් - රතු - සුදු - කලු - කහ වර්ණ වලින් ඔපවත් වී පෙනුණි.

ඇඳ දිසාව බැලූ විට එහි ඉහත්තේ දකුණු පසට වෙන්නට. නාන කාමරයට යන දොරටුව වසා නන්වන් පබුළු ඇමිණූ වැල් වලින් කළ තිර වැස්මක් විය. කාමරයෙහි එක් පසෙක දැල්වුණු යෝධ ඉටිපන්දම් දෙකෙහි තැඹිලි පැහැ ඉටියෙන් මල් සුවඳක් ගලා ආවේය.

වියන් ඇඳ පාමුල විශාල ට්‍රන්ක පෙට්ටියක් විය. එහි පියන රත් විල්ලුද වූ අතර දෙදෙනෙකුට පහසුවෙන් ඒ මත හිඳගත හැකි විය. මුළු කාමරයම රත් පැහැ ආලෝකයෙන් ආලෝකමත් වූ අතර වියන් ඇඳ දෙපස වූ කුඩා මේස දෙක මත වූ විදුලි පහන් දෙකෙහි ආවරණ රෝස පැහැයක් විය.

"මේ අපිටම ඉන්න හදාපු තැනක්ද සුදූ?" කාමරය මැද සිටගත් සුරලි දෑත් විහිදා වටයක් කැරකෙන අතරේ ඇසුවාය.

"ඔව් රත්තරන්... ඔයාටයි... මටයි හැමදාටම ඉන්න!"

"හැමදාටම"

"ඔව්! ඔව් ඔයා කැමති නම්!" ජනේෂ් ඇයව වැළඳ ගනිමින් කීවේය.

"ජස්ටින්ද ඔයාව එක්කන් ආවෙ?"

"ඔව් ජස්ටින් තමයි"

"කෝ... ජස්ටින්?" කියා සුරලි අවට බැලුවේ ඔහුට ස්තුති කරන්නටයි.

එහෙත් පෙනෙන අහලක ජස්ටින් නොවීය.

"එයා යන්න ඇති. එයා ආවෙ අපිට මඟ පෙන්වන්න නෙ" ජනේෂ් කීය. "බලන්න ඔය ට්‍රන්ක් එක ඇරලා... මොනවද තියෙන්නෙ කියලා?"

"මොනවද" කී සුරලි ට්‍රන්ක පෙට්ටියේ පියන හැරියාය.

එය පිරෙන්නට ලස්සණ, ලස්සණ ඇඳුම් සහ ආභරණ තිබිණි.

"මේ කාගෙද?"

"ඔයාට රත්තරන්!"

"මට?"

"ඔව් ඔයාට නැතුව වෙන කාටද? මං සේරම ලෑස්ති කෙරුවෙ ඔයාට ඇවිත් මා එක්ක සදහටම ඉන්න"

සුරලි සිනාසී එක් ලස්සණ දිග ගවුමක් පෙට්ටියෙන් පිටතට ගත්තාය. මොණර නිල් පැහැ දිලිසෙන ගවුමක්...

"මෙවා කොහේට අඳින්නද ජනේෂ්?"

"ඔයාට ඕනෑ තැනකට සුදූ"

සුරලි ඒ ලස්සන ගවුම වියන් ඇඳ මත දැමුවාය.

"මං ඉතින් නා ගන්න ඕනෑ. ඊට පස්සෙ පුළුවනි ලස්සණ ගවුම් අඳින්න"

"අර තියෙන්නෙ නාන කාමරේ... ගිහිං බලන්නකෝ..."

සුරලි පබුලු වැල් පට මැත් කරමින් නාන කාමරයට එබී බැලුවාය. එහි එහා කෙළවර වතුර මලක් විය. මෙහායින් සින්කු බේසමක් හා කොමෝඩයක්. දොර අසලම රෙදි එල්ලන්නට රාක්කියක්.

සුරලි ඇඳ ආ ඇඳුම උනා වතුර මල දෙසට ගියාය. එයින් ගලා ආ දිය දහර උණුසුම් විය. සුරලි ඇති තරම් ඒ දිය නෑවාය. රෝස පාට ලොකු තුවායෙන් ඇඟ පිස දමාගෙන, හිස තෙත මාත්තු කරගෙන තවත් ලොකු රෝස පැහැ තුවායක් ඇඟ ඔතාගෙන ඈ පිටතට එන විට ජනේෂ් ඇයට අඳින්නට ගවුමක් තෝරා තිබිණි.

එය දණින් පහළට වැටෙන සුදු පැහැ දූහුල් ගවුමකි. එහි පහත කොටස රැළි අල්ලා තිබුණ අතර කරවටා සියුම් ලේස් ගෙත්තමක් විය.

"මෙකට ඔයා ආසද?" ජනේෂ් ඇසුවේය.

"ම්... ලස්සණයි"

"ඕක දැන්ම අඳින්න ඕන නෑ... අපි ටිකක් විවේක ගනිමු" කී ජනේෂ් ඇගේ බඳ වසාගත් තුවාය ගලවා පසෙකට දැමුවේය. ඈ සයනය මතට නඟින විට ඔහුද ඇඳුම් උනා ඇයට තුරුළු වුනේය.

කාමරය පුරා රෝසමල් සුවඳක් විය.

# 18

කාලය හෝ හෝරාව ගැන අවබෝධයක් ඔවුන්ට නොවීය. කුස ගින්නක් පිපාසයක් ඔවුන්ට නොදැනුණි.

දෙදෙනා තුරුළු වී හිඳ නිදා නැගිටින විට ඉටිපන්දම් සෑහෙන දුරට දැවී ගොසිණි.

"බඩගිනිද? තිබහද?" ජනේෂ් ඇසුවේය.

"ම්... ඔයා එක්ක ඉන්නකොට... මොනවත් වෙන ඕනැ නෑ"

"මං හිතුවෙ අපි ඇඳුමක් ඇඳගෙන ටැවර්න් ඔන් ද ග්‍රීන් එකට ඇවිද ගෙන යමු."

"ඇයි කාරෙක?"

"කාරෙක තියන තැන බලාගෙන යමු"

"තාම හදල ඉවර නැද්ද?"

"නෑ... නෑ..." කියමින් ජනේෂ් ඇඳෙන් නැගිට්ටේ පිම්මකින් මෙනි.

ඔහු සුදු කමිසයක් හා එයටම ගැලපෙන සුදු කලිසමක් හැඳ ගත්තේය. ඔහු දෙපයට ලා ගත්තේ සුදු පාවහන් යුවලකි.

"ඔයා හරියට හින්දි නළුවෙක් වගේ" සුරලි සිනාසුණාය.

"කවුරු වගේද?"

"කිෂෝර් කුමාර් වගේ"

"කිෂෝර් කුමාර්? මං අහල නැහැ"

"පරණ හින්දි නලුවෙක්... සුදු සපත්තු දාලා"

"මං දැකල නැහැ..."

"බොරු කියනවා... එහෙනං මාත් මේ සුදු ගවුම අඳින්නං ඔයාට මැව් වෙන්න!" සුරලි සුදු විල්ලුද ගවුම දැතින්ම ඔසවා බැලුවාය.

"ඔව් එතකොට අපි දෙන්නා පෑහෙනවා... ටැවර්න් එකේ ඔක්කොම බලාවි අපි දෙන්නා දිහා"

සුරලි ගවුම ඇඟ ලා ගන්නා අතරේ ජනේෂ් ට්‍රන්ක පෙට්ටියෙන් ඇගේ ගවුමට සරිලන සුදු පාවහන් යුගලක් පිටතට ගත්තේය.

"ඔයා මේ සේරම ප්ලෑන් කෙරුව නේද සුදූ?" දෙපයට පාවහන් ලා ගන්නට ට්‍රන්ක පෙට්ටිය මත හිඳගත් සුරලි ඇසුවාය. "මගෙ අම්ම තාත්තා මට සමාව දේවිද?"

"මට සමාව නොදුන්නත් ඔයාට සමාව දේවි"

"ඇයි ඔයාට සමාව නොදෙන්නෙ?"

"ඇයි සුදූ මමනෙ ඔයාව හොරෙන් අරන් ඇවිත් අමාරුවෙ දැම්මෙ!" ජනේෂ් සිනාසුණේය.

"මට ඕනැ හින්දනෙ මම ආවෙ" සුරලිද සිනාසුණාය.

ජනේෂ් කාමරයේ කෙළවරට ගොස් එහි වූ ගුවන් විදුලියක් පණ ගැන්වූවේය. සිහින් සංගීතයක් එයින් ඇදී එන්නට විය.

"ඒ කොහෙන්ද ඒ?" සුරලි විශ්මයෙන් ඇසුවාය.

"ට්වෙන්ටි ෆෝ අවර් මියුසික්" ජනේෂ් කීය. "පැය විසිහතරෙම ජනප්‍රිය සංගීතය!"

තව මඳකින් මියුරු හඬකින් ගීතයක් ඇසෙන්නට විය.

හුරු පුරුදු ඉංග්‍රීසි ගීතයක්... ගැඹුරු පිරිමි කට හඬක්.

"YOUR LOVE FILLS ME, MY BEAUTIFUL BEING
YOUR CRYSTAL LIGHT IS IN MY HEART
NOW I KNOW THAT WE DON'T DIE
EVEN THOUGH SOMETIMES WE SAY GOODBYE

මා සොඳුරු සත්වය - ඔබේ ආදරය මා පුරවයි
ඔබේ පළිඟු ආලෝකය මගේ හදවත තුළයි
අපි නොමියෙන බව මම දැන් දන්නෙමි,
අප සමහර විට එකිනෙකාගෙන් සමු ගත්තත්...

ගිය වතාවේ ටැවර්න් ඔන් ද ග්‍රීන් අවන්හලේ මේ ගීතය ගැයුවේ ගායිකාවකි. දැන් මේ ගැඹුරු පිරිමි කටහඬින් සුරලිට එහි වදන් පැහැදිලි විය.

ජනේෂ් ඇයව තුරුළු කරගෙන සෙමින් නටන්නට වූයේය.

THERE IS A PLACE THAT'S FAR BEYOND
THESE MORTAL GROUNDS WHERE WE PLAY OUR GAME
WHERE THE SUN IS BRIGHTER
THE THOUGHTS ARE LIGHTER
THERE'S A MIST OF LOVE
LIKE A GENTLE RAIN

අප සෙල්ලම් කරනා මේ මර්ත්‍ය කෙළිබිමට එහා
ඉතා ඈත ඈත තැනක් වෙයි...
එහි හිරු වඩාත් දීප්තිමත්ය,
සිතුවිලි වඩාත් සැහැල්ලුය.
ආදරයේ මීදුමක් වෙයි,
සෞම්‍ය පොද වැස්සක් සේ

සුරලි තව තවත් ජනේෂ්ට තුරුළුව සෙමින් කාමරය වටාම නටන්නට වුනාය. රෝස මල් සුවඳේ රන්වන් සෞම්‍ය එළියේ...

ජීවිතය හා ආදරය කොතරම් සොඳුරුද? වෙන්කළ නොහෙන දෙහදක ආදරය... ගීතයේ පෙර නොඇසූ කොටසක් ඈ අසා සිටියාය.

AND WHEN YOU WHISPER IN MY DREAM

THAT YOUR LOVE IS TRUE AND FOREVER ETERNAL

I BRIM WITH JOY

AND I SURRENDER

TO THE BOUNDLESS WONDER

OF YOUR LOVE

ඔබේ ආදරය සත්‍ය බවත් සදා අමරණීය බවත්

ඔබ මගේ සිහිනයේ දී මට රහසේ මුමුණද්දී

මම ආනන්දයෙන් උතුරා යන්නෙමි.

ඔබේ ආදරයේ

අසීමිත විශ්මිතයට

මම යටහත් වන්නෙමි.

ජනේෂ්ගේ දෙතොල ඉබේම මෙන් සුරලිගේ දෙතොල් වෙත ඇදී ගියේය.

ගීතය අවසන් වූයේ ඔවුන් එසේ චුම්බනයේ ආලිංගනයේ සිටියදීය.

"ජනේෂ්...!"

"සුදූ... සුරලි!"

"මං... ඔයාට... සදහටම ආදරෙයි..."

"මං දන්නව සුදු... ඒකනෙ ඔයා මා එක්ක ආවෙ... මට සමාව දෙනව නේද?"

"මොනවටද?

"ඔයාව ගෙනැත් අමාරුවෙ දැම්මට?"

"ප්‍රස්තු කතා කියන්න එපා...!"කී සුරලි ඔහුව පසෙකට තල්ලු කළේ ආදරයකිනි.

"අපි යමු ටැවර්න් ඔන්ද ග්‍රීන් එකට"ජනේෂ් කීවේය. "ඔයාව පිළිගන්න කට්ටිය බලන් ඉන්නවා"

"මාව පිළිගන්න...? කවුද?"

"යමුකො පෙන්වන්න"

"කවුද මාව දන්නෙ?"

"යමුකො බලන්න... එනවද මා එක්ක?"

"නැතුව... හා... හා යමුකො"

"එන්න" කී ජනේෂ් සුරලිගේ අත අල්ලාගෙන ඉස්සර විය.

අනතුරුව දෙදෙනා හිණි පෙළ නැග්ගේ එකටමයි. පිටුපස සංගීතය තුනී වී නැසී ගියේය.

පිටතට ආ පසු සුරලි අවට බැලුවාය. දූන් අවරතට හැරුණ හිරු තවමත් මීදුමෙන් අළුව වැසුණ අහසක රෝස පැහැයකින් පෙනුණි.

"ඉතින් පයින්ද යන්නෙ?" ඈ ඇසුවාය.

"නෑ මඟදි කාරෙක හම්බ වෙනවා. ඒකත් බලාගෙන..."

"වහින එකක් නෑනෙ?"

"අද තියෙන වලාකුල් වහින ඒවා නෙමෙයි"

"එහෙනම්?"

"ඒවා දූමාර වලා පටල"

"දූමාර වලාපටල!" කී සුරලි සිනාසුණාය. "ඔයා හරියට කවියෙක් වගේ"

"ඔයත් එක්ක ඉන්න කොට... කවි මතක් වෙනවා!"

සුරලි ජනේෂ්ගේ අත අල්ලා ගත්තාය.

"ආයෙ නං පැනල යන්න බෑ... මාව තනි කරලා"

"නෑ... නෑ"

"සත්තයි...?"

"සත්තයි"

"පොරොන්දු වෙනවා?"

"පොරොන්දු වෙනවා" කී ජනේෂ් ඇගේ අත අත නෑරම හෝටලය පැත්තකින් ගොස් ඉදිරි අංගනයට ආවේය.

"මේ පැත්තෙන් පල්ලමට බැහැලා යමු... මැඩම් එමිලියාගෙ කොටෙජ් එක ළඟින්..."

"මේ... ජනේෂ්..."

"ඇයි සුදූ?"

"මං මැඩම් එමිලියාට කතා කරල යන්න ඕනැ"

"ඇයි මෙච්චර දවස් කතා කෙරුවෙ නැද්ද?"

"එයාගෙ කාමරේ හිටියට අපි මූණට මූණ දැකලා කතා කෙරුවෙ නැහැනෙ. මං කාමරේ ඉන්නවද කියලවත් එයා දැනගෙන හිටියද මං දන්නෙ නෑ" ජනේෂ් ඇයට ඉදිරියෙන් පල්ලම බසින්නට වූ හෙයින් ඔහු කී දෙය ඇයට එක් වරම ඇසුණේ නැත.

"දැන් අපිට ඉන්න තැනක් තියෙන නිසා මං එයාට ගිහින් ඒ ගැනත් කියල කථා කරල එන්නං" සුරලි ජනේෂ්ට ළං වන්නට වඩාත් වේගයෙන් පල්ලම බසිමින් කීවාය.

"ඔයා ගිහින් කතා කරලා එන්න" ජනේෂ් කීවේය. "මං එන්න ඕන නෑනේ. එයා මාව දන්නෙම නෑ. දැකලත් නෑ"

"විහිලු කාරයා!"

දෙදෙනා කඳු පල්ලම බැස්සාට පසු ඉදිරියෙන් පෙනුණේ මැඩම් එමිලියාගේ කොටෙජ් එකයි. දැනටම දොරෙන් පිටත ඉහළද, සාලයේද විදුලි පහන් දැල්වී තිබිණි. සාලයේ වූ ආලෝකය රන් පැහැයකින් විදුරු කවුළුවෙන් පිටතට ගාලා ආවේය. ඉදිරියේ ලී වැටද වඩාත් සුදුවට ඈත තියාම පෙනුනි. ඒ අවට රෝස මල් වඩාත් රතු පැහැ විය.

"සුදූ.. සුරලි ඔයා මැඩම්ට කතා කරල එන්න. මං මේ පැත්තට යන්නං"ජනේෂ් වම් අතට අත දිගු කළේය.

"මොනවටද?"

"කාරෙක තියෙන තැනට..."

"හා... ඔයා එහෙනං කාරෙක අරන් එනවද?"

ජනේෂ් පිළිතුරක් නොදීම පයින් ගස් දිහාවට ඇවිද යන්නට වුනේය.

ඔහු එතැනින් ටී හන්දිය අතට යන පටු පාරට ඇවිද ගිය අතරේ සුරලි මැඩම් එමිලියාගේ නිවහනට ළං වුනාය.

එහි ඉදිරියේ PSYCHIC කියා රතු අකුරෙන් ලියූ ලෑල්ල සුදුවට පෙනුණි. එයට පහතින් MADAM EMILIA කියා ලියූ නිල් පැහැ වදන් දෙකද සුරලි මිමුණුවාය.

පුදුමයකට මෙන් නිවහනේ ඉදිරිපස දොර සහමුලින් ඇරදමා තිබිණි. අළුත් වාතාශ්‍රය ලබන්නට විය යුතුයි.

සුරලි නිභයව දොරට ළං වූවාය.

ඇයට එක එල්ලේම ලොකු සෝපාව මත හිඳ සිටි මැඩම් එමිලියාව පෙනුණි. ඈ ඉදිරියේ වූ දිගු පහත් කෝපි මේසය මත දිග ඉටිපන්දමක් දැල්වුණි. මැඩම් එමිලියාගේ දෑස යොමුවුනේ ඒ ඉටිපන්දම් දැල්ලට වුවද එයට ඉහළින් ඇය සුරලිව දුටුවාසේ ඈ සුරලිට කතා කළාය.

"එන්න එන්න ඇවිත් ඉඳගන්න. සුරලි නේද නම?" ඈ ඇසුවාය.

"ඔ...ව්" සුරලිට කියැවුණේ අපහසුවෙනි. ඒ තනි වදන පවා ඇගේ උගුරේ හිර වුනාක් මෙනි.

"එන්න වාඩි වෙන්න"

සුරලි මැඩම් එමිලියා ඉදිරියෙන්ම ඉටි පහනටද මුහුණ ලා හිඳගත්තාය.

"හා! මට අද ඔයාව හරිම ලස්සණට පේනවා... පැහැදිලිව පේනවා!" මැඩම් එමිලියා සතුටකින් කියද්දී,

"ඇයි ඇස් අමාරුවක් තියෙනවද?"යි අසන්නට සුරලිගේ දෙතොල් පොපියෙව්වේය.

එහෙත් සුරලි නිහඬවම සිටියාය.

"ඔයා කොතනද කියල හොයන්න මෙලීත් මාත් හරියට මාන්සි උනා" එමිලියා කීවාය.

"මං දන්නවා... මං දැක්කා"

"මට ඔයාව පෙනුණෙ නෑ මෙච්චර කල්..."

සුරලි නිහඬ වූවාය.

"මට කියන්න ඔයා කොහේද හිටියෙ?"

"මේ... මේ අවටම තමා" සුරලි කීවාය.

"ඔව් ඒ උනාට... ජනේෂ් ඉන්න තැන... කාරෙක තියෙන තැන?"

"මං කොහොමද දන්නෙ? ජනේෂ් මට කාරෙක තියෙන තැනක් කිව්වෙ නෑ"

"ඔය දෙන්න කොහොමද මායා හෝටලේට ආවෙ?"

"කාරෙකෙන්..."

"කාරෙකෙන්... විත්තිය මම දන්නවා... කොයි පාරෙන්ද?"

"අපි ආවෙ ඊ... මීදුම ගලලා තිබුණා"

"හරි... හරි ඒ ටික අපි දන්නවා"

"මං ආවෙ අපි ආපු හැටි කියන්න නෙමෙයි මැඩම්. මං ආවෙ ඔයාට ස්තුති කරල යන්න මට කාමරේ ඉන්න දුන්නට..."

"කොයි කාමරේද?"

"ඇයි අර ඉස්සරහ... වම් පැත්තෙ කාමරේ..."

"හරි... හරි... කොහොමද මෙතැන්ට ආවෙ? කොහේ ඉඳන්ද ආවෙ?"

"මායා හෝටලේ ඉඳලා... ඒ රැම"

"කවුද එක්කන් ආවෙ?"

"ජස්ටින්!"

"ජස්ටින්! ඒ මගේ මහත්තයනේ. මුහන්දිරම් ජස්ටින් ඉලංග කෝන්... එයා මැරිල කොච්චර..." කී එමිලියා කථාව නතර කරද්දී ඇගේ නෙතඟ කඳුලක් දිලිසුණි. ඉටි පහන් එළියෙන් ඒ කඳුල තවත් දිලිසී කම්මුල දිගේ රූරා වැටෙන්ට විය.

"ජස්ටින් මැරිල නෑ. ජස්ටින් අපිට පාර පෙන්නුවා" සුරලි කීවාය. "මෙතැන රැ ඉන්න පුළුවන් කිව්වා. ඉතින් මට මේ බහු භූත තෙරෙන්නෙ නෑ මැඩම් ජස්ටින් අපි දැක්කා..."

"අනේ ජස්ටින්!" මැඩම් එමිලියා තමා ළඟ වූ ලේන්සුවෙන් කඳුළු පිසදා ගත්තාය. "මට ඔයාව පේනවා සුරලි මට කියන්න ඔයාලා කොහේද ඉන්නෙ කියලා?"

"මායා හෝටලයේ බිම් කාමරේ"

"එතන කොහොමද?"

"කෝ එතකොට ජස්ටින්?"

"මම දන්නෙ නෑ!"

"කෝ ඔයාගෙ ජනේෂ්? මට ජනේෂ් ඉන්න තැන ඔයාට පෙන්නන්න පුළුවන්ද?"

"එයා එළියෙ ඉන්නවා"

"මට පෙන්නෙ නෑ සුරලි. මට ඔයාවත් පේන්නෙ යන්තමට. මට පෙන්නන්න දරුවො ජනේෂ් ඉන්න තැන?"

"අර එළියෙ ඉන්නෙ... මැඩම් මං යනවා තැන්ක් යූ හැම දේටම" සුරලි නැගිට දොරෙන් පිටතට ආවාය.

මැඩම් එමිලියාද සැරටිය වාරුවෙන් සුරලි පසු පසින්ම ආවාය.

සුරලිට ඇත ඇවිද යන ජනේෂ් පෙනුණි.

සුදු හැඳගත් ජනේෂ්ගේ රුව ඊ හන්දිය අතට අතුපාර දිගේ සෙමින් යන අයුරු සුරලිට පෙනුණි.

"ජනේෂ්!" සුරලි කෑ ගැසුවාය.

අවට ගලන අඳුරේ ඔහුගේ රුව පෙනුණේ යන්තමිනි.

"ජනේෂ්" කියමින් සුරලි ඔහු අතට දුවන්නට වූනාය.

මැඩම් එමිලියා හැකි ඉක්මණින් සැරටියේ වාරුවෙන් තමාගේ ඇඳිරි දෑසෙන් පෙනෙන ඡායාව අනුව ගමන් ගත්තාය.

ඔවුන්ගේ වම්පසට වූයේ ප්‍රපාතයයි. එය කෙතරම් ගැඹුරු දැයි සුරලි නොදත්තාය. එහි පතුල වැසෙන්නට ඇත්තේ ගල් ගෙඩි හා ඒ අතරින් නැගෙන ගස් මුදුන්ය.

"ජනේෂ්!" සුරලිගේ කෑ ගැම කඳු අතරේ දෝංකාර දුන්නේය.

රූපාද වැට අසලට විත් එමිලියා කලබලයෙන් දුව යන අයුරු බලා සිටියාය. රූපාට පෙනුණේ එමිලියා පමණි.

එමිලියාට පෙනුණේ සුරලි පමණි.

ජනේෂ්ව පෙනුණේ සුරලිට පමණි.

ජනේෂ් එක් තැනක නතරවී ප්‍රපාතය දිසාවට හැරී පහත බැලුවේය. අනතුරුව ඔහු එතැනින් පහතට බසින්නට විය.

"කා - රෙ - ක - මෙ - ත - න - පල්ලෙහා" ඔහු කී දෙය යන්තමට සුරලිට ඇසුණි.

ඔහුගේ සුදු හැඳි රුව පල්ලමට බසිද්දී සුරලිද ඔහු සොයන්නට මෙන් පල්ලමට බසින්නට වූනාය.

සුරලි අවසන් වතාවට "කා - රෙ - ක" කියූ වදන එමිලියාට ඇසුණි.

එමිලියාට අනතුරුව සුරලිව නොපෙනී ගියේය. අවට කැටිවෙන අඳුරේ ඈ ආපසු ගෙය දෙසට හැරුණාය.

රූපා වැට ළඟ සිට "මැඩම්?" කීවාය.

"කෙල්ලෙ පොලිසියට කතා කරපං" එමිලියා හඬ ගා කීවාය. "තැන මම දන්නවා!"

# 19

සුරලි දෑස් හැරියේ හුරු පුරුදු කාමරයකයි. ඉහළ දැල්වුන විදුලි බුබුලෙන් ඇයට මුලින්ම පෙනුණේ ලොකු වීදුරු කවුළුව වසාගත් දුහුල් සුදු තිර රෙද්දයි.

අනතුරුව ඇයට තමා ඇලවී සිටි ඇඳ අසල සිටි කීප දෙනා පෙනුණි. ඇගේ තාත්තා සුසිල් මද්දුමාරච්චි සුරලිගේ සුරතට අත තබා ගෙන ඇඳ අසලම හිඳ ගෙන සිටියේය. ඇඳ පාමුල මෙන් සිටගෙන සිටි තරුණයා ඈ එක්වරම හැඳිනුවේ නැත.

"ජනේෂ්" යැයි මිමුණු ඇය යළිත් හොඳින් දෑස හැර බැලුවාය.

ජනේෂ් නොවේ එතැන සිටියේ දොස්තර රජිත ලන්ද දෙණියයි.

රජිතත්, සුසිලුත් දෙදෙනාම මේ සීත පරිසරයට උචිත ලෙස කබාවලින් සැරසිලාය. කාමරයට ඇතුල් වෙන දොර අසල බලා සිටියේ රූපාය.

"තා...ත්තා... මං කොහෙද මේ?" සුරලි යන්තමට හිස ඇල කොට සුසිල්ගෙන් විමසුවාය.

"මේ මැඩම් එමිලියාගේ කොටෙජ් එක!" කට කාර ලෙසින් පිළිතුරු දුන්නේ රූපාය. අනතුරුව ඈ පිටතට දුවමින් "මැඩම් අන්න අරයා ඇහැරලා"යි කියන හඬ ඇසුණි.

"තා...ත්...තා... මගෙ තාත්තා? කෝ ජනේෂ්?"

සුසිල් එක්වන පිළිතුරු නොදී රජිත දෙස බැලුවේය.

"සුරලි... ඔයා දූන් රෙස්ට් කරන්න" රජිත කීවේය. "එයාව අරන් ගියා..."

"කොහේද? කොහේද?" සුරලි හැකි වෙර යොදා කෑ ගැසුවද ඇගේ උගුරෙන් පිටවූයේ දුබල හඬක් පමණි.

"දූව... දූව" සුසිල් දුවණියගේ අත අත ගෑවේය. "වෙච්ච දේ වෙලා ඉවරයි දූව... අපි ඔයාව හොයා ගත්තනේ..."

"මොනවද උනේ කියන්න තාත්තා? මාත් ජනේෂුත් මායා හෝටලයට ආවා නේද?"

"නෑ... නෑ..." කී වදන සුසිල්ගේ උගුරේ හිරවුන බැවින් ඔහු යළිත් නැහැ කියන්නට හිස සැලුවේය.

"නෑ නෑ වෙන්න බෑ. අපි දෙන්නා මායා හෝටලේ කාමරේට ආවා... අපිට ජස්ටින් කාමරයක් දුන්නා"

"ජස්ටින් කියන්නෙ... සුරලි, මගේ මහත්තයා" දොරකඩට ආ මැඩම් එමිලියා කීවාය. "මුහන්දිරම් ජස්ටින් ඉලංගකෝන්... එයා මැරිලා දූන් දැවුරුද්දක් වෙන්න ආවා..."

සුරලි ගොළු වුනාය.

"මටත් එයාව කාලයක් පෙනුණා. මට ඔයාව පෙනුණෙම නෑ සුරලි, ඔයා මැරිල නෑ කියල මං හිතුවෙ ඒකයි. ඒ උනාට අන්තිමේදි ඔයා මට පේන්නම ආවා. මං හිතුවෙ ඔයත් මැරිල කියලා.. නෑ ඔයා මරණාසන්නව මරණයත් ජීවිතයත් අතරේ පාවුනා... දෝලනය වුනා"

සුරලි විමතියෙන් ගල් ගැසී අසා සිටියාය.

"මං මේ කාමරේ හිටියනෙ, මං හුඟක් දේවල් දැක්කනෙ... මං මේ රූපාව දැක්කනෙ?"

"මාත් ඔයාව දැක්කා... සමහර වෙලාවට" රූපා දොර අසල සිට කීවාය. "ඒකයි මං ඔයාට කීවෙ මට ඔයාව පේනව කියල"

"අර ෂෙලී කියල මිනිහෙක් ආවෙ ෂෙලී විල්සන් කියල?" සුරලි ඇසුවාය.

"ඒ මගේ යාලු ඩිටෙක්ටිව් කෙනක්... මම එව්වේ" සුසිල් මද්දුමාරච්චි කීවේය. "එයත් අපිත් එක්ක ආවා. එයා ආවෙ දුවව හොයන්න තමයි. ඔයාලගෙන් ආරංචියක් නැති වෙච්ච හැටියෙ අපි හොයන්න පටන් ගත්තා..."

"මං ආවට කමක් නැද්ද?"කියමින් ෂෙලී කාමර දොර අසල මතුවිය.

"එන්න එන්න ෂෙලී" සුසිල් කීවේය.

"දුව කියනවා ෂෙලීව දැක්කා කියලා"

"කොහේදිද?" ෂෙලී ඇසුවේය.

"මේ ගෙදර මේ කාමරේටම ෂෙලී ආවා මං හැංගුණා"

"මට පෙනුණෙ නැහැනෙ සුරලි"

"අපි කාටවත් ඔයාව පෙනුණෙ නැහැ සුරලි" මැඩම් එමිලියා කීවාය.

"මට පෙනුණා! මට පෙනුණා... අමල් බිසෝව..." රූපා සතුටින් මෙන් කීවාය. "කෝ මට පේන ඒවා කවුරුවත් ගණන් ගත්තෙ නැහැනෙ..."

"ඉතින් මට කියන්න මට මොකද උනේ කියලා?" සුරලි යළි දෑස් පියා ගත්තාය. "මේකත් හීනයක් ද එහෙනම්?"

"හීනයක් නෙමෙයි දුව"

සුරලිට වම් කකුලේ වේදනාවක් දැනෙන්නට විය.

"ඔයාගෙ ඇට කටු වගයක් බිඳිලා තියෙනවා. ඔයාලගේ කාරෙක වී ජන්ෂන් එක ළඟින් හරවන කොට පල්ලමට ගියා. නැවතෙන්නෙම නැතුව" ඒ කථා කළේ රජිතයි.

"මට මතක නෑ"

"මීදුම නිසා ඔයාලට පේන්න නැතුව ඇති" රජිත කියද්දී,

"අපි හිතන්නෙ ජනේෂ්ට නින්ද යන්න ඇති කියලා. ඒ වෙලාවෙ ඔයාටත් සිහි නැති වෙන්න ඇති" යැයි ෂෙලී විල්සන් අනුමානයට කීවේය.

සුරලි දූස පියා අසා සිටියාය.

"ඔයාට සුරලි මං පේන් රිලීෆ් මෙඩිසින් එකක් දුන්නා." කතා කළේ රජිතයි. "තාත්තයි මමයි ටවුන් එකට ආවෙ පෙරේදා. අපි එදා ඉඳල හෝදිසියෙන් හිටියෙ. ෂෙලී කාරෙක ලොකේට් කරපු ගමන් අපි ආවා"

"මං නෙමෙයි කාරෙක ලොකේට් කෙරුවෙ..." ෂෙලී කීවේය. "මේ මැඩම් එමිලියාගෙ සයිකික් පවර්ස්"

"නෑ නෑ... මමත් නෙමෙයි. මේ සුරලිගෙම ස්පිරිට් එක තමයි මට කාරෙක තියෙන තැන පෙන්නුවෙ" මැඩම් එමිලියා කියද්දී,

"මට කාරෙක තියෙන තැන පෙන්නුවෙ ජනේෂ්" යැයි සුරලි මිමිණුවාය. "අනේ මගෙ ජනේෂ්... මට කියන්න මොකද උනේ කියලා?"

"අපි එයාගෙ බොඩි එක වාහනේකින් කොළඹට යැව්වා ඒ වෙලාවෙම" ෂෙලී කීවේය.

"ඔයාව මෙහේ ටවුන් එකේ හොස්පිටල් එකට ගෙනියන්න තව ටිකකින් ඇම්බියුලන්ස් එකක් එනවා සුරලි"

සුරලිට උවමනා වූයේ පැත්තට හැරී කොට්ටයක් තුරුළු කරගෙන හඬන්නටයි. එහෙත් වේදනාව නිසා ඇයට හැරෙන්නට නොහැකි විය. ඈ උඩු බැලියෙන් සිටියදීම කඳුළු වගුරුවමින් සිතන්නට වූනාය.

එතකොට මායා හෝටලයට ආවේ ඔවුන්ගේ භූතීන්ද? එතකොට අර උඩු මහලේ කාමරය? ජස්ටින්? තමා දුටු ගින්න? මේ ගෙදර කාමරය? ටැවර්න් ඔන් ද ග්‍රීන් නම් අවන් හල? තමා ඇසූ ගීතය? අවන් හලේ සිට තමා ටිකෝ ගේ කුඩා ලොරියේ සැඟවී ආවා නොවැ? වරින් වර ජනේෂ් රාත්‍රියේ ඇවිත් තමාට තුරුළු වී සිටියා නොවේද? එහෙම නම් ඒ සියල්ල තමා ජීවිතයත් මරණයත් අතර දෝලනය වෙද්දී දුටු මනෝ විකාරද? ඇතැම් විට තමාගේ මනෝ කාය සැබවින්ම සැරිසරන්නට ඇති. රූපා තමාව දුටුවේ එබැවිනි. මේ සියල්ල කිසිවෙකුට තේරුම් කර දෙන්නේ කෙසේද?

"දුව" තාත්තාගේ කරුණාබර කටහඬ සුරලිට ඇතින් මෙන් ඇසන්නට විය. "දුව ඔයත් එක්ක අපේ කිසි තරහක් නෑ දුව"

"අපි ඔයාව ඉක්මණට සනීප කරනවා සුරලි" තරුණ දොස්තර රජිතගේ කටහඬේද වූයේ උපේක්ෂා ස්වරයකි.

"මං මේ ගේ ඇතුලෙ හැම තැනම දැක්කා" සුරලි ඉතා සෙමින් කීවාය. "මැඩම් එමිලියා... ෂෙලී අපු වෙලාවෙ... බිත්තියෙ තියෙන පින්තූර දෙක, ජස්ටින්, ටීකෝ, රූපා" හැමදෙනාම ගොළු වී මෙන් අසා සිටියේ ඈ කොයි තරම් දෙයක් දැක්කා දැයි නොදැනය. "කාරෙක හොයාගෙන එනවා කියල ජනේෂ් කිව්වා... මට කීවෙ නැහැනෙ කාරෙකට මොකද උනේ කියල?"

"කා...රෙ...ක" කී සුසිල් මඳකට නිහඬවිය. "ඒ ගැන කතා නොකර ඉමු. ඒක එලවන්න පුළුවන් තත්වයක නැහැ"

පිටත ඇම්බියුලන්ස් රථය එන හඬ ඇසිණි. එහි රතු එළිය කාමරයේ කවුළුවෙන් ද ගලා එද්දී සුරලි සිය කඳුළු පිරි දෙනෙත් පියා ගත්තාය.

# 20

## පුවත් පතක පළවූ ප්‍රවෘත්තියක්

කොළඹට තදාසන්නව ජීවත් වූ තරුණ පෙම් යුවලකගේ මධුසමය අවසන් කළ ඛේදවාචකය-

සුසිල් මද්දුමාරච්චි නම් ව්‍යාපාරිකයාගේ එකම දුවණිය සුරලි පසුගිය දිනෙක දෙමාපියන්ටත් හොර රහසේ තම පෙම්වතා වූ ජනේෂ් ජයමාන්න සමඟ විවාහ වී මධු සමය ගත කරන්නට බදුල්ල ආසන්නයේ මායා හෝටලයට යන අතර අතුරුදහන් වූහ.

දින කීපයකට පසු ඔවුන් ගමන් ගත් රථය මායා හෝටලයට සමීප ප්‍රපාතයක ගල් දෙබුක්කාවක සිර වී තිබී සොයා ගනු ලැබිණි. ජනේෂ් මිය ගිය අතර සුරලි බදුල්ලේ රෝහලට ගෙන ගොස් දැන් ප්‍රතිකාර ලබන්නීය.

ඇ කියන ආකාරයට, ඇයත් ජනේෂුත් මීදුම අතරින් මායා හෝටලයට ගොස් ඇත. එහිදී ඇය ලත් අත්දැකිම්, සිහිනයත්, සැබෑවත් අතර කළවම් වූ අද්භූත අපූරු කථාවකි.

ඔවුන්ගේ රථයත්, ඔවුන් දෙදෙනාත් සොයන්නට ගිය, රහස් පරීක්ෂක ෂෙලී විල්සන් කියන ආකාරයට, රථය ඇති ප්‍රපාතය සොයා ගෙන ඇත්තේ මැඩම් එමිලියා නම් අධි ඉන්ද්‍රියඥාණ ශක්තිය ඇති කාන්තාවකගේද සහායෙනි. මායා හෝටලය අයිතිව තිබී ඇත්තේ ඇගේ සැමියා වූ මුහන්දිරම් ජස්ටින් ඉලංගකෝන්ටයි. කලකට ඉහත ඇතිවූ ගින්නකින් හෝටලයේ කොටසක් දැවී ගිය අතරේ ඒ ගින්නේදී තුවාල ලද ජස්ටින් ඉලංගකෝන් වැඩි කලක් නොයා මිය ගොස් ඇත්තේය.

කලින් මහා මායා හෝටලය නමින් හැඳින්වුන මේ හෝටලය කලකට ඉහත ලද අකුණු පහරකින් පසු මායා හෝටලය යැයි නම් වී ඇත. හෝටලය කලක සිට ව්‍යාපාර සඳහා විවෘත නොවූවද එහි වෙබ් අඩවි පිටුව මෑතක් වෙන තුරුම අන්තර්ජාලයේ තිබුණ බවත් තම තරුණ සැමියා මේ ස්ථානය මධුසමය සඳහා තෝරා ගත්තේ ඒ ආකාරයෙන් බවත් සුරලි සඳහන් කළාය.

රථය ප්‍රපාතයෙන් ගොඩගත් අය පවසා ඇත්තේ, රථය තුළ කැරපොත්තන් විමානයක්ම තිබුණ බවයි. මියගිය පුද්ගලයාගේ සිරුරෙහි කුහර තුළද කැරපොත්තන් සිටි බවට අපට ආරංචි සැල වී ඇත!

මේ ඛේදවාචකයේ එකම සැනසුම නම් සුරලි මද්දුමාරච්චි අනතුරෙන් දිවි ගලවා ගැනීමයි.

### රහස් පරීක්ෂක ෂෙලී විල්සන්ගේ සටහනක්

මද්දුමාරච්චි මහත්මාගේ සහ එම මහත්මියගේ එකම දුවණිය සුරලි සමඟ පලාගිය ජනේෂ් ජයමාන්නත්, සුරලිත් සිටින තැනකින් සොයාගෙන ඒමේ වගකීම පැවරුණේ මටයි. ඔවුන්ට සිදුවූ දෙය ටික කාලයක් යනතුරු අභිරහසක් වුවද, මායා හෝටලය අයිති මැඩම් එමිලියා ඉලංගකෝන්ගේ අධි ඉන්ද්‍රිය ශක්තියෙන් මට බොහෝ උදව් උපකාර ලැබිණි. ඇගේ 'සයිකික් පවර්ස්' අධි ඉන්ද්‍රිය ශක්තිය ගැන මට නම් දන් සැකයක් නැත.

### මැඩම් එමිලියා ඉලංගකෝන්ගේ සටහන

මාත්, මගේ සැමියා වූත් මුහන්දිරම් ජේ ඉලංගකෝන්ද පවත්වාගෙන ගිය මායා හෝටලය කලකට ඉහත හටගත් ගින්නකින් කොටසක් විනාශ වූ පසු අපේ ව්‍යාපාර අඩපණ වුනා. ඒත් මගේ කොටේජ් එකේ තවම අමුත්තන්ට රැඳෙන්නට ඉඩ පහසුකම් සැලසී තිබෙනවා.

ඒ අයට උපකාර අවශ්‍ය නම්, සයිකික් (අධි ඉන්ද්‍රිය) ශක්තියෙන් උදව් කරන්න පුළුවන්.

මායා හෝටලයෙන් මගේ ගෙදරට පයින් යන දුර.

## ටිකිරි බංඩාර හෙවත් ටිකෝගේ සටහන.

මම දන්නා තාක් කාලයක් සේවය කෙරුවෙ මුහන්දිරම් ඉලංගකෝන් මහත්මයාගේ පවුලේ උදවියට. ඒ වලව්වට සහ කොටේජ් නිවාසයට බඩු බාහිරාදිය ගෙනියන්නෙ මගේ පුංචි ලොරියෙන්. ඒ හෝටලයට සහ ගෙදරට අවශ්‍ය එළවළු, පලතුරු හාල් ආදිය සේරම ගෙනැත් දෙන්නේ මම තමයි.

හෝටලයේ වැඩ නැවතුණාට පස්සෙත් මම තවම කොටේජ් එකට අවශ්‍ය කළමනා ගෙනත් දෙනවා.

සමහර වෙලාවට මැඩම් ටවුන් එකට එක්කගෙන යන්නෙත් මමයි... මැඩම් ඉඳහිට ටැවර්න් ඔන් ද ග්‍රීන් අවන්හලටත් යනවා. ඒකෙත් දැන් ඉස්සර වාගෙ මිනිස්සු එන්නෙ නෑ. මං නං යන්නෙ ඇතතින් බීර එකක් බිලා ඇඟ පතේ වෙහෙස මාන්සිය නිවාගන්න.

හෝටලය අවට හොල්මන් තියෙනවා කියල එක් එක්කෙනා කියනවා... මං ටැවර්න් එකේදි අහල තියෙනවා. මට නං ඔය මොකවත් පෙනිලා නැහැ.

මං එළවන වාහනේ පිටුපස්සෙ නං වතාවක් දෙකක් සද්ද බද්ද ඇහිල තියෙනවා, කවුරු හරි ඇතුලෙ ඉන්නව වගේ හෙලවීම් සිද්ද වෙලා තියෙනවා. ඒ උනාට මං මොනවත් ඇහින් දැකල නැහැ.

මං නං හොල්මන් විස්වාස කරන්නෙ නැහැ. මැඩම් නම් ඔය මළගිය ප්‍රාණකාරයින්ට කතා කරන්න එහෙමත් දන්නවා කියනවා. මියගිය අය එක්ක සම්බන්ධ වෙන්න උත්සාහ කරන ජීවතුන් අතර ඉන්න අයත් මැඩම් එමිලියා හොයාගෙන එන්නෙ ඒකයි.

## කොටේජ් හි සේවය කරන රූපාගේ සටහන

මම දන්න දා ඉඳලා වැඩ කරන්නෙ ඉලංගකෝන් පවුලට. මගේ දෙමාපියො කවුද කියාවත් මම හරියට දන්නෙ නැහැ. ඔය ඔය ගැන එක එක කතන්දර නම් මම අහල තියෙනවා. මම වලව්වෙ වැඩට ආපු ගැහැණු කෙනෙකුට උපන් දුවක් බව නම් මම දන්නවා. මගේ ශාරීරික යම් යම් අඩු පාඩු ඇති. නමුත් මට වැඩක් පලක් කර ගන්න පුළුවන් කමක් තියෙනවා.

හැමෝම මේ මායා හෝටලය දාලා ගියාට මම තාමත් එතන වැඩ කරනවා. සැරයක් අකුණක් වැදිලා තමයි හෝටලය වෙනස් උනේ. ඕකට කලින් නම දාලා තිබුණේ මහා මායා හෝටලය කියලා. සුද්ධෝදන මහ රජ්ජුරුවන්ගෙ බිසවගෙ නමනෙ මහාමායා කියන්නෙ. ඒ වගේම සිද්ධාර්ථ කුමාරයගේ මෑණියන්ගෙ නම.

මට ඕවා කියා දුන්නෙ මුහන්දිරම් ඉලංගකෝන් මහත්තයා. මට වෙනස් කමක් නොකර සැලකුවේ ඒ මහත්තයා විතරයි.

මහා මායා හෝටලයෙ උඩ තිබුණ බෝඩ් එකට අකුණු ගැහුවාම බෝඩ් එක හරියට මහා - මායා කියා තැන මැදට තමයි හෙණේ වැදුණේ. මහා කියන කෑල්ල ගිණි ගත්තා. හැමෝම කිව්වා ඔය නම් දම්මට වස් වැදුණා කියලා. අනේ මන්දා ඔය නම තියෙන ගෑණු ඉස්කෝලෙකුත් තියෙනවලු. කොහොමෙන් හරි, අන්තිමට හෝටලේට කිව්වෙ මායා හෝටලය කියලා.

ගින්නෙන් පස්සෙ, මුහන්දිරම් මහත්තයා මැරුණට පස්සෙ ඔතන හරි හරි හොල්මන් සිද්ධ වෙන්න ගත්තා.

මට ඔය සමහර දේවල් පේනවා. හුඟක් අයට නොපෙනෙන දේවල් මට පේනවා. ඇහෙනවා. සමහරු හිතන්නෙ මං මේ ඔල්මාදෙට පිස්සු කියවනවා කියලා. නමුත් මට සමහර වෙලාවට ඇත්තටම යම් යම් දේවල් පේනවා.

අපේ මැඩම් එමිලියා කියන්නෙ එයාටත් අනිත් අයට නොපෙනෙන දේවල් පේනවා ඇහෙනවා කියල. නමුත් මැඩම්ට නොපෙනෙන සමහර දේවල් මං දැකලා තියෙනවා. මේ සමහර දේවල් අපේ මැඩම් සම්බන්ධ දේවල් වෙන්නත් පුළුවන්.

මං කොහොමටත් හැමදාටම ඉන්නෙ කොටෙජ් එකේ තමයි. මට කොහොමටත් වෙන යන්න තැනක් නැහැනෙ. මැඩම්වත් බලාගෙන ඉන්නවා.

හෝටලේ අවට සුද්ද පවිත්තර කරන්නත් මම යනවා. සමහර වෙලාවට මං මගේ බත් එක කෙහෙල් කොළේක ඔතාගෙන එතැන්ට ගෙනිහුං කනවා. මං ආසයි කෙහෙල් කොළේ ඔතාපු බත් කන්න. කවුද ආසා නැත්තෙ?

මං එහෙම දවල්ට හෝටලේට ගියාමත් අමුතු දේවල් දකිනවා.

එතකොට මං කවියක් සින්දුවක් කියනවා.

"දොර ඇරපං අමල් බිසෝ -

අම්මත් ආවා - අප්පත් ආවා

මුතුත් ගෙනාවා -

මුතු අමුණන වැලුත් ගෙනාවා

දොර ඇරපං අමල් බිසෝ"

කියලා.

ඔය භූතයො ඉන්න අයත් ඕක අහන්න ආසයි. මං දන්නවා.

මට මේවා කියන්න කෙනෙකුත් නෑ.

මැඩම් හිතන්නෙ මට පිස්සු කියලා.

ඒ උනාට එයාට මං නැත්තං බෑ.

මට යමක් කතා කරන්න කෙනෙක් ඉන්නව නං ඒ කොටෙජ් එකට කළමනා, හාල්, පොල්, එළවළු එහෙම අරගෙන එන ටිකෝ විතරයි. ටිකෝ කියන්නෙ ටිකිරි බංඩාර.

මායා හෝටලෙන් ටිකක් දුර ටිකිරි බංඩාර ඉන්නෙ. මං කියන්නෙ ටිකෝ කියලා. එයා එයාගෙ බට්ටා ලොරියෙන් ආවම, මං එයාට තේ එකක් එහෙම හදල දීලා සංගරහ කරනවා...මා ගාව තියෙන රස කැවිල්ලක් උනත් දෙනවා එයාට...


මට කියන්න තියෙන්නෙ එච්චරයි.

2018 සැප්තැම්බර් 8 වැනි සෙනසුරාදා හවස 5.40

හදුජි මහින්ද ජයතිලක ලියූ "මායා හෝටලය"

නම් වූ කුතුහලාත්මක නවකථාව

මෙතෙකින් නිමා වෙයි.



# මායා
# හෝටලය

හද්‍රජී මහින්ද ජයතිලක

මායා හෝටලය
හද්‍රජී මහින්ද ජයතිලක ලියූ
නවතම කුතුහලය හා අද්භූතය දනවන නවකතාවයි.

සීත කළුකරයේ මධු සමය ගත කරන්නට යන සුරලි සහ ජනේෂ් නම් තරුණ පෙම්යුවල මුල්ම මිහිදුම් පිරි සැන්දෑවේ පටන්ම, අත් විඳින්නේ අද්භූත අත්දැකීම් රාශියකි.

ඔවුන් රාත්‍රිය ගත කිරීමට පැමිණෙන මායා හෝටලය ඔවුන් සිතනා තරම් සුන්දර තැනක් නොවේ. ඔවුන් මුහුණ දෙන අවස්ථාවන් සේම, මුණ ගැසෙන පුද්ගලයන්ද සඟවා ගත් රහස්ද සුරලිගේ ජීවිතයට මුසු කරන්නේ අසීමිත කුතුහලයකි.

විවිධ ශානරයන් ඔස්සේ කෘති 125 කට වඩා ලියා ඇති හද්‍රජී මහින්ද ජයතිලකයන් ඔබට ගෙන එන 10 වැනි කුතුහලාත්මක නවකතාව මේ මායා හෝටලයයි.

කියවන්නට පටන් ගන්නා මොහොතේ පටන් ඔබට පසෙක තබන්නට නොසිතෙන අපූර්ව නවකතාවකි, මායා හෝටලය. සීත බිය නම් ඇතුළුවෙන්න එපා!!

http://www.sarasavi.lk
Rs 300.00
ISBN 978-955-31-1394-8
9 789553 113948
SARASAVI 2018
Novel

සරසවි ප්‍රකාශකයෝ
30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ. දුරකථන/ෆැක්ස්: 011 2769446 e-mail: publishing@sarasavi.lk